
MINISTRY OF EDUCATION
SKILLS DEVELOPMENT AND
VOCATIONAL EDUCATION DIVISION

NIBM
POWERING
GREAT
MINDS











LEARNING AND TEACHING IN THE DIGITAL ERA

2022

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය
தேசிய வியாபார முகாமை நிறுவனம்
NATIONAL INSTITUTE OF BUSINESS MANAGEMENT

පටුන

අප ගැන	3
දැක්ම හා මෙහෙවර	4
හැඳින්වීම	6
මෙහෙයුම් කාර්යසාධනය 2022	8
සභාපතිතුමාගේ පණිවිඩය	10
අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය	12
පාලක සභාව / අධ්‍යක්ෂ මණ්ඩලය	18
අධ්‍යාපන මණ්ඩලය	20
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	26
අපගේ සේවා සැපයීම	27
මානව සම්පත් කළමනාකරණය	29
අවදානම් කළමනාකරණ වාර්තාව	38
NIBM වෘත්තීය හවුල්කාරිත්වය	42
NIBM පුස්තකාලය සහ විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානය	44
ශිෂ්‍ය ක්‍රියාකාරකම් සහ සම්බන්ධතා	50
2022 වසරේ වැදගත් සිදුවීම්	56
අංශවල කාර්යසාධනය	72
ව්‍යාපාරික පාසැල (SOB)	74
ව්‍යාපාරික පාසලේ වැඩසටහන්	75
ඵලදායිතා සහ තත්ත්ව මධ්‍යස්ථානය (PQC)	77
පරිගණක හා ඉංජිනේරු පාසල (SOCE)	79
මානව ශාස්ත්‍ර, නිර්මාණකරණය සහ භාෂා පාසල (SOD)	81
භාෂා පාසැල ඉංග්‍රීසි භාෂා ඒකකය	84

ප්‍රාදේශීය මධ්‍යස්ථාන	85
කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය	87
මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය	91
මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය (KIC)	93
ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය	95
මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය	98
විභාග ඒකකය (EU)	100
වෘත්තීය මාර්ගෝපදේශන සහ කාර්මික පුහුණු ඒකකය	101
NIBM - ජාත්‍යන්තරයට	102
විශ්වවිද්‍යාලය හවුල්කාරිත්වය	104
NSBM හරිත විශ්වවිද්‍යාලය	107
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	119
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය	121
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	122
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	123
ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි	124
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	133
විගණකාධිපති වාර්තාව	147
ආයතනික තොරතුරු	IBC

අපි ගැන

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය 2022 වසරේ පැවති සියළු අභියෝග සාර්ථකව ජයග්‍රහණය කරන ලද වසරකි. වෙනස්වීම් සහ නවෝත්පාදනයන් තුළින් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ක්‍රියාකාරකම් නිරන්තරයෙන්ම මෙහෙයවීම සිදුකරයි.

අපගේ මාර්ගගත වේදිකාව (Online Platform - www.nibmworldwide.com) සමඟ වසංගතය ඇති වීමට පෙර සිටම අපි හොඳින් සූදානම්ව සිටි නිසා, 2022 වර්ෂයේ වර්ධන අපේක්ෂාවන් තුළ කැපී පෙනෙන ලෙස අධ්‍යයන ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකළ වසරකි. ඒ අනුව නව ඉගෙනුම් පහසුකම් ඇති කිරීම තුළින් ජාතියට සේවය කිරීම අප විසින් අඛණ්ඩව සිදු කර ඇත.

NIBM ස්වයං මූල්‍ය ආයතනයක් වශයෙන් ගත හැකි නිර්භීතම තීරණ කිහිපයක් ගෙන සාර්ථකව ඉදිරියට ගමන් කරන බව ඔප්පුකර ඇත. ගෝලීය වශයෙන් හොඳම හවුල්කරුවන් කිහිප දෙනෙකු සමඟ සම්බන්ධවී ජාත්‍යන්තර උසස් අධ්‍යාපනය හඳුන්වා දීමත්, ලබන වසරේ OBL හඳුන්වාදීම සඳහා ශක්තිමත් පදනමක් දැමීමත් සමඟ දේශීය හා ගෝලීය උසස් අධ්‍යාපනය තුළ අපගේ මුද්‍රාව තබා ඇත. අධ්‍යාපනය සඳහා වර්තමානයේ සිදුකරන ආයෝජනයක් ලෙස ඉදිරි වසරවලදී මෙය හොඳින් ක්‍රියාත්මක වනු ඇත. ඒ අනුව අපි හොඳම දේ තෝරාගෙන එතුළින් විශාල වටිනාකමක් එකතු කරගත්තෙමු.

NIBM POWERING GREAT MINDS

අපි කවුද

දැක්ම

"ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ව්‍යාපාරික අධ්‍යාපන ආයතනය බවට පත්වීම"



මෙහෙවර

"අපි පුහුණුව, අධ්‍යාපනය සහ උපදේශනය මඟින් ජනතාවගේත්, සංවිධානවලත් නිපුණතා සංවර්ධනය කිරීමේ කාර්යයෙහි නිරතව සිටින්නෙමු"

අරමුණු

- රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම කාර්මික හා වාණිජ ව්‍යාපාරවල කළමනාකරුවන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීම.
- කළමනාකාරිත්වය සමඟ නිර්මාණාත්මක ලෙස සහභාගි වීමට සේවකයන් පුහුණු කිරීම සහ අධ්‍යාපනය ලබා දීම.
- කළමනාකරණ විශේෂඥ සේවාවන් ලබාදීම, කාර්යසාධන ප්‍රමිති ස්ථාපනය කිරීම හා ඵලදායිතාව ඉහළ නැංවීම.
- කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස මානව දායකත්වය ප්‍රශස්ත මට්ටමට නැංවීම සඳහා අනෙකුත් ක්‍රියාකාරකම් ඉටු කිරීම.
- පරිසරය වඩා හොඳින් ඇගයීම සඳහා අදාළ සමාජ ආර්ථික සංසිද්ධීන් සහ කළමනාකරණ අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ දත්ත එකතු කිරීම.
- බාහිර සංවිධාන සඳහා කළමනාකරණ තොරතුරු සේවා ලබාදීම හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි සේවක පිරිස් පුහුණු කිරීම.
- සංස්ථාපිත අංශයට තම පද්ධති, පරිපාටි හා කාර්ය ක්‍රම දියුණු කිරීම, සැලසුම්කරණ කාර්යයන්ට සහාය වීම හා සාමාන්‍යයෙන් වෙනස් වන පාරිසරික සාධකයන් නිසා මුහුණපෑමට සිදුවන අභියෝගවලට මුහුණ දීම සඳහා උපදේශක සේවා සම්පාදනය.
- අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන් තුළින් සංවිධානවල ඵලදායිතාව දියුණු කිරීමට පහසුකම් සැලසීම.

පරමාර්ථ

- වෘත්තීය දැනුම හා සුදුසුකම් අපේක්ෂිත පුද්ගලයන්ට අදාළ විෂයයන් පිළිබඳ උසස් මට්ටමේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයක් හා උපදෙස් ලබාදීම.
- මනාව ව්‍යුහගත කළ පුහුණු වැඩසටහන් මඟින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධානවල කළමනාකරුවන් හා අධීක්ෂණ නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය කිරීම.
- කළමනාකරණයට නිර්මාණාත්මක හා ඵලදායී අයුරින් සහභාගි වීම සඳහා සේවකයන්ට පුහුණුව හා අධ්‍යාපනය ලබාදීම.
- අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන් මඟින් සංවිධානවල ඵලදායිතාවය වර්ධනය කිරීමට පහසුකම් සැලසීම.
- රාජ්‍ය, පොදු හා පෞද්ගලික අංශයේ කාර්යසාධන ප්‍රමිති ස්ථාපනය හා සංවිධානවල සංවර්ධනය සඳහා මානවසම්පතෙහි දායකත්වය ප්‍රශස්ත මට්ටමට පත්කිරීමට කළමනාකරණ උපදේශනය හා වෙනත් උපදේශන සේවා ලබාදීම.

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ව්‍යාපාර අධ්‍යාපන ආයතනය ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය වේ. අපි කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන ආකාරයට සහ ගෝලීය ප්‍රවණතා සමඟ ඉදිරියට යමින් නිරන්තරයෙන්ම අපගේ නිමැයුම් උසස් ශ්‍රේණියෙහි තබාගෙන කටයුතු කර ඇත. පසුගිය කාලය පුරාම කළමනාකරණය, පුහුණුකිරීම් සහ අධ්‍යාපනය සම්බන්ධ ප්‍රමුඛ ආයතනය බවට පත් වෙමින් අප අපගේම අනන්‍යතාවයක් ගොඩනගාගෙන ඇත්තෙමු. මෙම ආයතනය පුද්ගලයින් සහ ආයතන දසදහස් ගණනකට වඩා යහපත් අනාගතයක් ගොඩනගා ගැනීමට උපකාර වී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහයෝගය ඇතිව අන්තර්ජාතික කම්කරු සංවිධානයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයක් ලෙස ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය, 1968 දී කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද අතර දැනට වසර 54 ක් පුරා මෙමඟින් උසස් අධ්‍යාපන සේවාවන් සපයා ඇත. පසුව එය පාර්ලිමේන්තු පනතක් මඟින් (1976 අංක 23 දරණ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත) ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ලෙස සංස්ථාපිත කරන ලදී. 1991 අංක 28 දරන පනත මඟින් උක්ත පනතට යම් යම් සංශෝධන ගෙන එන ලදී.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මකවන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපන ආයතනයක් වේ. ආයතනය ස්වශක්තියෙන් සියළුම කාර්යන් මෙහෙයෙවන අතර ජාත්‍යන්තරව පිළිගත් උපාධි පිරිනමන ආයතනයකි. එමෙන්ම ජාතික තත්ත්ව සම්මාන ප්‍රදානයේ දී ගෞරව සම්මානයෙන් පිදුම් ලද අතර ISO 9001-2008 ප්‍රමිති සහතිකය ද ආයතනය හිමිකරගෙන ඇත.

මෙහෙයුම් කාර්යසාධනය 2022

ශ්‍රී ලංකාවේ උසස් සහ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශ්වාශවන්තම සන්නාමය වන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) දශක පහකට වැඩි කාලයක් මානව සම්පත් සංවර්ධනය සඳහා මූලික පහසුකම් සංවර්ධනය කරමින් සේවයේ යෙදී සිටී. දශක පහකට වැඩි කාලයක් තිස්සේ එහි ගමන්මඟ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුල නවෝත්පාදනය සහ නිර්මාණශීලිත්වය කරා ගෙන ඒමේ සුවිශේෂ ක්‍රියාවලියේ නිරතව ඇත. NIBM සිය කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම තුළින් ජාතියේ තරුණ තරුණියන් සහ වෘත්තිකයන් සඳහා සිය සේවාවන් පුළුල් කර ඇත. දැනුම ගෝලීය වශයෙන් වෙනස්වන සංසිද්ධියක් බව ආයතනය තරයේ විශ්වාස කරයි; එබැවින් ජාත්‍යන්තරව පිළිගත් උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට සැමවිටම පියවර ගෙන ඇත. මෙමඟින් ශ්‍රී ලාංකීය තරුණ තරුණියන්ට ගෝලීය වශයෙන් නිපුණත්වයන් ලබා ගැනීමට පමණක් නොව, ලොව පුරා කර්මාන්තයන්හි ශ්‍රම වෙළඳපොළේ නායකයින් බවට පත්වීමට ද අවස්ථාව පවතී. ආයතනය නිපුණතා සහ කුසලතා ඉහළ නැංවීමේ අවස්ථා ලබා දෙන වැඩසටහන් සමඟින් මෙරට වෘත්තිකයන්ට විවිධ ආකාරයෙන් පහසුකම් සපයයි. NIBM විසින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙත ගෙන ආ නවෝත්පාදනයන් තුළින් කර්මාන්තය පුරා විශාල බලපෑමක් සිදුකර ඇති බව මනාව පැහැදිළි වේ. NIBM හි අරමුණු පදනම් කරගත් ඉගෙනුම් ක්‍රමය (OBL) ක්‍රියාවට නැංවීම, 2022 වර්ෂයේදී ආරම්භක අදියරයන් සාර්ථකව සිදු කරන ලදී. NIBM ආයතනයෙහි දැක්ම වන්නේ ලොව ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවලට සමාන්තරව අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සිදුකරමින් රටේ උසස් අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම නව මඟකට ගෙන ඒමයි. උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස NIBM දැඩි ලෙස විශ්වාස කරන්නේ අධ්‍යාපනය තළින් රැකියා සොයන්නන් නොව රැකියා සපයන්නන් බිහිකිරීමයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයේ අධ්‍යාපන ක්‍රියාවලි හරහා, සිසුන් තුළ නිර්මාණශීලිත්වය සහ සැලසුම් චින්තනය නිර්මාණය කළ යුතුය. OBL ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමඟ අනාගතයේ ව්‍යාපාරික නායකයින් බිහිකිරීම සඳහා සිසුන්ගේ මනසට ව්‍යවසායකත්ව චින්තනය ඇතළත් කිරීම අරමුණ වේ. මෙම සියලු නව ක්‍රමවේද හඳුන්වා දෙනු ලැබුවේ බඳවා ගන්නා ලද සිසුන් සඳහා සහ උපයාගත් ආදායමෙන් ආයතනය පවත්වාගෙන ගිය වර්ධන වේගය අඛණ්ඩව තබා ගනිමින්ය.

සමාලෝචිත වර්ෂය රටේ සමස්ත ඉතිහාසයේ වෙනත් කිසිම වසරක් මෙන් නොවීය. වසර හැත්තෑවකට පසු රට ආර්ථික අර්බුදයේ ගැඹුරුම අගාධයට වැටී තිබුණ අවස්ථාවකි. විදේශ මුදල් හිඟය නිසා ඇති වූ ඉන්ධන අර්බුදය මුළු රටම අඩපණ කළේ ඕනෑම ව්‍යාපාරයක එදිනෙදා කටයුතු සිතාගත නොහැකි පරිදි අවුල් ජාලයක් නිර්මාණය කරමිනි. උසස් අධ්‍යාපන ආයතනයක් සඳහා, මෙම

තත්ත්වය අභියෝග රාශියක් ගෙන ආ අතර, සිසුන් ආයතනය වෙත ආකර්ශණය කර ගැනීමේ ගමන් මාර්ගය අතිශයින් දුෂ්කර විය. අධ්‍යයන කාර්යමණ්ඩලය සහ පරිපාලන කාර්ය මණ්ඩලයට තිබූ ගැටළු ද එයම විය. මෙහිදී ආයතනයේ මූලික කාර්යයන් සහ ක්‍රියාකාරිත්වය අතිශය දුෂ්කර තත්වයන්ට පත්වූහ. එහෙත් සුදුසුකම් ලත් උපාධිධාරීන් ලෙස ක්ෂේත්‍රයට ඇතුළත් වීමට සිසුන්ට නියමිත වේලාවට ඔවුන්ගේ පාඨමාලා සම්පූර්ණ කිරීම සහතික කිරීම සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය ප්‍රමාදයකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාමට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය අධිෂ්ඨාන කරගෙන සිටියේය.

මේ සඳහා ආයතනය ක්‍රමෝපායන් දෙකක් අනුගමනය කළ අතර එහිදී දේශන මාර්ග ගත ක්‍රමවේදය හරහා මෙන්ම භෞතිකව ද හැකි සෑම විටම පවත්වන ලදි. සිසුන් සමඟ සුහදව සාකච්ඡා කරමින් නියමිත පරිදි සැළසුම් කළ ආකාරයට විභාග පවත්වන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස මූලික උපාධි පාඨමාලා සඳහා උපාධි ප්‍රදානෝත්සව දෙකක් පැවැත්වීමට ආයතනයට හැකි වූ අතර ආයතනයේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය ද නියමිත පරිදි පැවැත්වීමට හැකි විය.

ඉන්ධන සහ ආර්ථික අර්බුදය නිසා ඇති වූ දුෂ්කරතා මධ්‍යයේ වුවද මෙම වැඩසටහන් දෙකෙහිම සිසුන්ගේ සහභාගිත්වය අතිවිශිෂ්ට විය.අධ්‍යාපනික හා අධ්‍යයන කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම ආයතනයේ ක්‍රියාකාරිත්වයේ එක් අංගයක් වන අතර, මූල්‍ය ඉලක්ක ජයගැනීම සහතික කිරීම සහ ශිෂ්‍ය බඳවාගැනීම් සිදුකිරීම තවත් අංශයක් වේ. රාජ්‍ය අංශය සතු ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස, මෙවැනි අර්බුදකාරී අවස්ථාවක ඉහල කාර්ය සාධනයක් අවශ්‍ය බව NIBM හි දැඩි විශ්වාසයයි. මුළු රටටම හොඳම කළමනාකරණ පිළිවෙත් වෙනුවෙන් පෙනී සිටි ආයතනයක් ලෙස, ආයතනයේ විවිධ මට්ටම් අතර සමීප සම්බන්ධීකරණයක් ඇතිකරමින් කළමනාකාරිත්වය සියළු අභියෝග මධ්‍යයේ සිසුන් සංඛ්‍යාව සහ ආදායම් ඉලක්ක සපුරා ගැනීම සහතික කිරීම සඳහා සියලු පියවර ගන්නා ලදී. සැලසුම් කරන ලද උපාය මාර්ග සහ ඉලක්ක පියවරෙන් පියවර සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා සමීපව අධීක්ෂණය සිදු කරන ලදී. NIBM ආයතනය වසර අවසන් වන විට මේ දක්වා අඛණ්ඩව පවත්වාගෙන ආ වර්ධන චක්‍රය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි විය. පෙර වසරවලට වඩා සමාලෝචිත ඉලක්ක ඉක්මවා ගොස් නිබුණා පමණක් නොව ඉලක්කය සාර්ථකව සපුරා ගැනීමටද හැකි වී ඇත. ශිෂ්‍ය සංඛ්‍යාවෙහි වර්ධනය සතුටුදායක තත්වයේ පැවතුනි. ප්‍රාදේශීය මධ්‍යස්ථාන ඇතුළු ප්‍රධාන ආයතනය පෙර වසර වලට සාපේක්ෂව සිසුන් බඳවා ගැනීමේ ඉලක්කය කරා ලඟාවීමට හැකි විය. වසරේ කැපී පෙනෙන අවස්ථා, ව්‍යාපාරික පාසල පහසුකම් වැඩි වෙනත් ස්ථානයකට රැගෙනයෑම, ආරම්භයේ සිටම NIBM හි ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාවලට සමානවම පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කරන සිසුන්ට සහ දැනටමත් කර්මාන්තයේ නියැලී සිටින ව්‍යාත්තිකයන්ට පිරිනමනු ලබයි. ව්‍යාපාර පාසල (SOB) පීඨයක් ලෙස ශ්‍රී ලංකාවේ පමණක් නොව ලොව පුරා ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම් සහ නවෝත්පාදනයන් පිළිබඳව නිරීක්ෂණය කරන අතර පවත්වාගෙන යනු ලබන ලද පාඨමාලා තුළට ඒවා ඇතුලත්කිරීමට නිරන්තර උත්සාහයක් දරයි. SOB විසින් පිරිනමනු ලබන උපාධි, පාසල් හැර යන සිසුන්ට ජාත්‍යන්තරව පිළිගත් උපාධියක් ලබාගැනීමටත්, ක්ෂේත්‍රයේ සිය නිපුණතාවය වැඩි දියුණු කර ගැනීමටත්, නිරන්තරයෙන් වෙනස් වන ගෝලීයකරණය වූ ව්‍යාපාරික ලෝකයට අවශ්‍ය දැනුම හා කුසලතාවන්හි ප්‍රවීණයන් වීමටත්, වෙනම මාවතක් නිර්මාණය කර තිබේ. ව්‍යාපාරික පාසැල වෙනම ස්ථානයක පිහිටුවා පුළුල් කිරීම සඳහා හේතු වූ එක් සාධකයක් ලෙස NIBM ප්‍රධාන කාර්යාලය තුල ඉඩකඩ සීමා සහිත වීම බලපාන ලදි. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා NIBM විසින් SOB සඳහා වෙනම පහසුකමක් ලෙස ස්ථාපිත කිරීම සඳහා කොළඹ 08 කාසල් වීදියේ හි වඩාත් සුදුසු ස්ථානයක් හඳුනාගෙන ඇත.

ඒ අනුව මෙම වර්ෂයේදී NIBM හි ව්‍යාපාරික පාසල මධ්‍යගතව පිහිටා ඇති බැවින් සිසුන්ට පහසු ප්‍රවේශයක් වීම සඳහා නව ගොඩනැගිල්ලකට ගෙන යන ලදී. කාසල් වීදියේ SOB පිහිටුවීමත් සමඟ, අර්බුදයකදී එයට හොඳින් මුහුණ දීම තුළින් දැඩි අසීරු ඉලක්කයක් ලඟාකර ගැනීමේ විශ්වාසය NIBM සතුව ඇති බව ඔප්පු කරන ලදි. ව්‍යාපාරික පාසැල (SOB) තුළ නව පහසුකම සමඟින් එනම් නවීනතම දේශන ශාලා, ශිෂ්‍යයින්ට නිර්මාණශීලි කටයුතු සිදුකිරීම සඳහා ප්‍රදේශයක්, ශ්‍රවණාගාරයක්, ව්‍යාපාරික පූර්ව ලියාපදිංචි කිරීම සඳහා අංශයක් සහ තවත් බොහෝ එකතු කිරීම් සමඟින් සිසුන්ට මෙහිදී පහසුකම් සළසා ඇත. ශිෂ්‍ය බඳවා ගැනීම් සහ NIBM වෙත උපයන ආදායම ඉහළ නැංවීමට සැලකිය යුතු දායකත්වයක් ලබා ගැනීම ආයෝජනයක් සහිතව මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී. උසස් තාක්ෂණික කෘෂි ව්‍යාපාර සහ ආදර්ශ ගොවිපල, ගෝලීය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම් හඳුනා ගැනීම සහ NIBM විසින් පිරිනමනු ලබන පාඨමාලාවන් තුළ ඒවා පිළිබිඹු කිරීම මෙම අධ්‍යාපන ප්‍රතිපත්තියේ ප්‍රධාන මානයන්ගෙන් එකකි. රටේ ප්‍රමුඛතම ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයක් ලෙස NIBM විසින් හඳුනාගෙන ඇත්තේ උසස් තාක්ෂණික කෘෂි ව්‍යාපාරය, ගෝලීය කර්මාන්තයේ නවතම සහ වඩාත්ම ඉදිරියට එන ක්ෂේත්‍රක් ලෙසයි. ගෝලීය ජනගහන වර්ධනය සහ මිනිස් ජනාවාස ව්‍යාප්තියහි වර්ධනය හේතුවෙන් ඉඩම් සහ වගාකිරීමේ ඉඩකඩ අඩුවෙමින් පවතින බැවින්, කෘෂිකාර්මික කර්මාන්තයහි ගොවිතැන් ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට ක්‍රම සොයා බලමින් සිටී. මේ සඳහා කර්මාන්තය තුල වැඩි වැඩියෙන් ගොවිතැනින් ඉහළ අස්වැන්නක් සහ ඵලදායිතාවයක් ලබාගැනීම සඳහා උසස් තාක්ෂණය භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව පර්යේෂණ සිදු කරයි.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ලෙස මෙය එහි පාඨමාලා තුළ

ඇතුලත් කිරීම ජාතික අවශ්‍යතාවයක් ලෙස ආයතනය විසින් හඳුනාගෙන ඇත.

කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ රටේ කෘෂිකාර්මික කේන්ද්‍රස්ථානයක වන බැවින්, එය සිය පාඨමාලාවන්ට උසස් තාක්ෂණික කෘෂි ව්‍යාපාර වැඩසටහන් හඳුන්වා දීමට සුදුසුම ස්ථානය ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පිරිනමන පාඨමාලා 2ක් දියත් කරන ලදී. කෘෂිකර්මාන්තය ප්‍රායෝගික කර්මාන්තයක් වන බැවින්, එය හදාරන්නන්ට උසස් තාක්ෂණික ගොවිපලක අත්දැකීම් නොමැතිව එම පාඨමාලාව ඵලදායී නොවනු ඇති.ආදර්ශ ගොවිපළක් පිහිටුවීම සඳහා අක්කර 17.5 ක ඉඩම්ක් අත්පත් කර ගැනීමට NIBM විසින් වයඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹුණි. ආදර්ශ ගොවිපලත් සමඟම එම ඉඩමෙහිම පිහිටුවා ඇති හරිත මධ්‍යස්ථානය පාඨමාලාව හදාරන සිසුන්ට උසස් තාක්ෂණික කෘෂි ව්‍යාපාර පිළිබඳ ප්‍රායෝගික අංශයේ දැනුම ලබා දෙනු ඇත. මූලික ආරම්භයත් සමඟ NIBM ගෝලීය කර්මාන්තවල සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම් සමඟ සිටිමින් කටයුතු කර ඇති බව නැවත වරක් ඔප්පු කළේය. KIC මෙහෙයුම් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය (KIC) 2021 සැප්තැම්බර් මාසයේදී විවෘත කරන ලද්දේ විලාසිතා නිර්මාණ, අභ්‍යන්තර ගෘහ නිර්මාණ ශිල්පය, AI සමඟ පරිගණක විද්‍යාව සහ තවත් වැඩසටහන් කිහිපයක් හඳුන්වා දීමෙනි. මෙම මධ්‍යස්ථානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ මධ්‍යම පළාතේ සහ ඒ අවට ප්‍රදේශවල තරුණ තරුණියන්ට නවෝත්පාදන වැඩසටහන් හඳුන්වා දීමයි. මහනුවර, කොළඹට පසුව රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් වන බැවින්, එම මධ්‍යස්ථානය හරහා ජාත්‍යන්තර අධ්‍යාපන අත්දැකීමක් සහ පහසුකම් ලබා දීමට හැකියාව පවතී. මෙම මධ්‍යස්ථානය 2021 වර්ෂයේදී ක්‍රමානුකූලව ආරම්භ වූ අතර 2022 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී. ඒ අනුව පවත්වාගෙන යනු ලබන පාඨමාලාන් සංඛ්‍යාව වැඩි වූ අතර සිසුන් බඳවා ගැනීම සැලකිය යුතු ලෙස වැඩි විය.

අති නවීන පහසුකම්වලින් සමන්විත මෙම මධ්‍යස්ථානය පාසල් හැර යන අයට සහ ප්‍රදේශයේ වෘත්තිකයන්ට නවමු අත්දැකීමක් වී ඇත. කෘතිම බුද්ධිය, බහුමාධ්‍ය සහ ෆැෂන් නිර්මාණ, නිර්මාණ වැඩසටහන් යන ක්ෂේත්‍රවල පිරිනමන උපාධි පාඨමාලා මේ වන විට මධ්‍යස්ථානයේ ප්‍රධාන තෝරාගැනීම් බවට පත්ව ඇත.

NIBM ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සමඟ සම්බන්ධ වීම නූතන ලෝකයේ දැනුම ගෝලීය සංසිද්ධියකි. ශ්‍රී ලංකාවේ උසස් සහ වෘත්තීය අධ්‍යාපනයේ ප්‍රවනතා සකසන්නෙකු ලෙස, NIBM සෑම විටම අධ්‍යාපනයේ නවතම ප්‍රවණතා නියෝජනය කරන්නෙකු වේ. NIBM හි ජාත්‍යන්තර අධ්‍යාපන කාර්යාලය (IAO) පිහිටුවන ලද්දේ මෙම ආයතනය ලොව පිළිගත් විශ්වවිද්‍යාල සමඟ අනුබද්ධ වෙමින් ශ්‍රී ලාංකේය සිසුන්ට ලෝක ප්‍රකට අධ්‍යයන වැඩසටහන් පිරිනැමීම සහතික කිරීම සඳහා ය. ලොව ශ්‍රේණිගත විශ්වවිද්‍යාලයකින් විදේශයන්හි උපාධි සම්පූර්ණ කිරීමේ හැකියාව ඇතිව සිසුන්ට තම රටේ අධ්‍යයන කටයුතු සිදුකිරීමට මෙමගින් හැකියාව ලැබේ. මෙය ප්‍රචලිතව ඇත්තේ ජාතික අධ්‍යාපනය යනුවෙනි. මේ සඳහා NIBM හි ජාත්‍යන්තර අධ්‍යයාපන කාර්යාලය ලොව පුරා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධානතම තරගකාරී අධ්‍යාපන ආයතන සමඟ සබඳතා ගොඩනඟා ගැනීමට සමත් වී ඇත.

NIBM විසින් පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනයේ ගුණාත්මක බව ඔප්පු කර ඇති ඩිකින් වැනි විශ්වවිද්‍යාල සමඟ හවුල්කාරිත්ව ගිවිසුම් සඳහා එළඹීමට ජාත්‍යන්තර අධ්‍යාපන කාර්යාලයට (IAO) කෙටි කාලයක් තුළ හැකියාව ලැබුනි. 2022 වසර NIBM හි ජාත්‍යන්තර අධ්‍යාපන ගමන් මගෙහි තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කළ අතර එහිදී ඕස්ට්‍රේලියාවේ ගෝලීය ශ්‍රේණිගත විශ්වවිද්‍යාලයක් වන ග්‍රිෆිත් විශ්ව විද්‍යාලයේ සමඟ හවුල්කාරිත්ව ගිවිසුමක් අත්සන් කළේය. ග්‍රිෆිත් යනු පුළුල් පරාසයක උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් ඉදිරිපත් කරන ඕස්ට්‍රේලියාවේ ඉහළම ශ්‍රේණිගත විශ්ව විද්‍යාල වලින් එකකි. ගිවිසුම යටතේ NIBM හි පරිගණක පාසලේ (SOC) පරිගණක සිසුන්ට සහ ව්‍යාපාර පාසලේ (SOB) ව්‍යාපාර කළමනාකරණ සිසුන්ට ශ්‍රී ලංකාවේදී ඔවුන්ගේ උපාධිය ආරම්භ කර පසුව ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයේ වසර දෙකකින් උපාධිය සම්පූර්ණ කිරීමට හැකි වේ.

NIBM ආයතනයට අනාගතය සඳහා බොහෝ හැකියාවන් ඇති කර ගැනීමට හැකි වූ ප්‍රධාන හවුල්කාරිත්වය මෙය විය. දැනුම සහ උසස් අධ්‍යාපනය වඩ වඩාත් විශේෂිත වන විට, NIBM හි අන්තර්ජාතික අධ්‍යාපන මූලපිරීම් සමඟම උසස් අධ්‍යාපනයේ නැගී එන ගෝලීය ප්‍රවණතා සමඟින් ශ්‍රී ලාංකික සිසුන්ට සමීපව කටයුතු කිරීමට හැකියාව ලැබේ. තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ පෙලගැසී සංවර්ධනය කරන ලද වැඩසටහන්. අධ්‍යාපනය, රටක වර්ධනයට හා සංවර්ධනයට මග පාදයි. රටක දියුණුවේ ගාමක බලවේගය එහි මානව සම්පතයි. ආර්ථිකයට අවශ්‍ය ශ්‍රම බලකාය සැපයීම සඳහා රටෙහි අධ්‍යාපන ක්‍රමයට නිවැරදි සුදුසුකම් ඇති කිරීමට හැකියාව තිබිය යුතුය. ලෝකයේ ඕනෑම තැනක රැකියාවක් කිරීමට හැකියාව ඇති ගෝලීය වශයෙන් නිපුණතා සහිත ශ්‍රම බලකායක් පිළිබඳව ජාත්‍යයන්තර මට්ටමින් අවධානය යොමු විය යුතුය. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තිරසාර සංවර්ධන ඉලක්ක (SDGS) හඳුනාගෙන ඇත්තේ ආර්ථික වර්ධනය පරිසරය ආරක්ෂා කිරීම සහ සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා ය. නවෝත්පාදනය වුවද පරිසර හිතකාමී තාක්ෂණය හඳුන්වාදීම

තිරසාර සංවර්ධනයේ ප්‍රධාන අංගයන්ගෙන් එකකි. මේවා තුලින් ස්වභාවධර්මයට සහ සමාජයට අවම හානියක් නොවන පරිදි අනාගත පරම්පරාවේ මානව වටිනාකම් සහ ස්වභාවික උරුමයන් ආරක්ෂා කිරීමට හැකිවනු ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක සමඟින් උසස් අධ්‍යාපන වැඩසටහන් පෙළගැස්වීම UNOහි සියලුම සාමාජික රටවලින් යුනෙස්කෝව බලාපොරොත්තු වන ප්‍රධාන අරමුණකි. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ලෙස මෙම වගකීම ආයතනය විසින් මනාව වටහාගෙන ඇති අතර තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ ප්‍රතිසංවිධානය කරන ලද 'ප්‍රතිඵල පාදක කරගත් වැඩසටහන්' ගණනාවක් දියත් කරන ලදී. මේ සඳහා සියලුම උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා Critical Enabling Skills CREST සංරචකය එක් කරන ලදී. උසස් ජාතික ඩිප්ලෝමා (HNDs) පාඨමාලා සිසුන් තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ අවශ්‍ය නිපුණතා අත්පත්කගැනීම සඳහා කැපවූ පුහුණුවක් ලබා ගනී.

ව්‍යාපාරික පාසල එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යටතේ ශ්‍රී ලංකාවේ UNO සංවිධානයත් සමඟ සෘජුවම හවුල් වී සම්බන්ධීකරණය කර මෙම වැඩසටහන සිදු කෙරේ.

ගෝලීයකරණය වූ ශ්‍රම බලකායක අනාගත අවශ්‍යතා සඳහා අවශ්‍ය නිපුණතා සමඟ සිසුන් සූදානම් කිරීම මෙම වැඩසටහන් මඟින් සහතික කෙරේ. 2022 වර්ෂය NIBM ආයතනය විසින් මෙම අරමුණ ලගාකරගැනීම සඳහා මූලිකව මුලපිරීම සඳහා ගත් එක් ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකිය.

NIBM ප්‍රතිඵල පදනම් කරගත් ඉගෙනුම් (OBL) ක්‍රමය දියත් කිරීම පාඨමාලා අවසානයේ සිදුකරනු ලබන විභාග සහ ඒ සඳහා සිසුන්ට ලබා දෙන ක්‍රියාවලිය අපහසු වනවා පමණක් නොව සිසුන්ගේ නිර්මාණාත්මක හැකියාවන්ට අහිතකර ලෙස බලපාන බව උසස් අධ්‍යාපන චින්තකයින් විසින් හොඳින් වටහාගෙන ඇත. ඵලදායී නොවන උපාධිධාරීන් බිහිවීම පමණක් නොව සිසුන් අතර මානසික අවපීඩනය වැනි හානිකර බලපෑම් ඇති කර සිසුන්ගේ මනෝවිද්‍යාව කෙරෙහි ඍණාත්මක බලපෑම් ගණනාවක් ඇති වන බව පවතින විභාග ක්‍රමවේදයේදී හඳුනාගෙන ඇත. සියදිවි නසාගැනීම් ඉහළ මට්ටමක පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව හඳුනාගෙන ඇති අතර නිදහස ලැබීමෙන් පසු පවත්වාගෙන ගිය පාඨමාලා අවසානයේ දුෂ්කර විභාග ක්‍රමයට සම්බන්ධ කර ඇත. NIBM රටේ ප්‍රමුඛ පෙළේ උසස් අධ්‍යාපන සැපයුම්කරුවෙකු වන අතර දශක ගණනාවක් ක්ෂේත්‍රයේ මෙහෙයුම් හරහා මෙය අවබෝධ කරගෙන ඇත.

සැලකිය යුතු පර්යේෂණ හා අධ්‍යයනයකින් පසු ආයතනය මේ සඳහා හොඳම විකල්පය ලෙස ප්‍රතිඵල පදනම් කරගත් ඉගෙනීම ක්‍රමය (OBL) හඳුන්වා දෙන ලදී.

OBL ඇගයීම් ක්‍රමවේදය හඳුන්වාදීමේ අරමුණු කිහිපයකි.

බොහෝ පර්යේෂණ සහ අධ්‍යාපන චින්තකයින්ගේ අදහස් අනුව, ඵලදායී නොවන ඇගයීම් ක්‍රමයක් බවට පත්ව ඇති පාඨමාලා අවසානයේ විභාග පැවැත්වීම මූලික වශයෙන් ඉවත් කිරීමට මෙම ඇගයීම් යෝජනා ක්‍රමය තුලින් අපේක්ෂා කරයි. ඒ අතරම, උසස් අධ්‍යාපන පාඨමාලා හදාරන්නන් දැනුම ලබා ගැනීම සහ නිපුණතා සංවර්ධනය සම්බන්ධයෙන් තමන් ලබා ඇති ප්‍රගතිය පිළිබඳව විධිමත් කාල පරාසයන් තුළ දැනුවත් වීම ඉතා වැදගත් වේ. මෙමගින් අපි අධ්‍යාපනය හදාරන්නන්ගේ අධ්‍යයන පාඨමාලාවේ සමතුලිතතාවයට වඩා හොඳින් හැඩගැසීමට හැකියාව ලැබේ, එහිදී ඔවුන්ට ඉදිරියට පැමිණීමට නියමිත ඇගයීම්වලදී වඩා හොඳින් ක්‍රියා කිරීමටද හැකි වේ. මෙම නව ඇගයුම් යෝජනා ක්‍රමයේ ප්‍රධාන දර්ශනය වන්නේ ඉගෙන ගන්නෙකුට අවසන් මොඩියුල විභාගයකට වඩා නියමිත කාල පරාසයන්හිදී ඔහුගේ හෝ ඇයගේ ප්‍රගතිය දැන ගැනීමට හැකි විය යුතු බවයි. එහිදී ඔහුට හෝ ඇයට නියමිත ශ්‍රේණිය ලබා ගැනීමට නොහැකි වුවහොත් විභාගය නැවත කිරීම හැර වෙනත් විකල්පයක් අධ්‍යනය කරන්නාට නොමැති වනු ඇත.

OBL යෝජනා ක්‍රමයේදී ඇගයීම මොඩියුලය පුරා ව්‍යාප්තව සිදුකරනු ඇත. වැඩසටහනේ අරමුණු සහ ප්‍රතිඵල මත පදනම්ව විවිධ යෝජනා ක්‍රම භාවිතා කරනු ලැබීමද මෙම ඇගයීම් ක්‍රමයේ තවත් වැදගත් ලක්ෂණයකි.

සභාපතිතුමාගේ පණිවිඩය

ස්වයං මුල්‍ය ආයතනයක් ලෙස ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) සැමවිටම පැහැදිලි දැක්මක් සහ ප්‍රතිපත්තියකින් යුතුව කටයුතු කරයි. ආදායමේ අබණ්ඩ වර්ධනයක්, සිසුන් සංඛ්‍යාවේ වැඩි වීමක් සහ පාසල් හැර යන අයට සහ වෘත්තිකයන්ට නව පාඨමාලා හඳුන්වා දීමත් අපගේ ප්‍රමුඛ අරමුණු අතර වේ.



2022 වර්ෂය ශ්‍රී ලංකාවට මෙන්ම ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) ට විවිධ ආකාරයෙන් සුවිශේෂී වසරක් විය. ජාතියක් ලෙස ශ්‍රී ලංකාව දේශසීමාවන් තුළ බොහෝ දේශපාලනික සහ ආර්ථික අර්බුදවලට මුහුණ දෙමින් සිටියේය. දේශපාලනික වශයෙන් පැවති අස්ථාවරත්වය සමාජයට විවිධ බලපෑම් ඇති කළේය. 2021 වර්ෂයේදී දැඩි ලෙස බලපෑම් සිදු වූ කොවිඩ් වසංගතයෙන් ඇතිවූ බලපෑම, විදේශ සංචිත අවසන් වීම ආදී හේතුවෙන් ආර්ථික ක්ෂේත්‍රයේ දැඩි අර්බුද පැන නැගුනේය. මේ සියලු අභියෝග මධ්‍යයේ වුවද, රටේ ප්‍රමුඛතම උසස් සහ වෘත්තීය අධ්‍යාපන ආයතනයක් ලෙස NIBM ආයතනයට එහි සියලුම මෙහෙයුම් ක්ෂේත්‍රවල වර්ධනයක් වාර්තා කිරීමට හැකි විය. NIBM හි පාලක සභාවේ සභාපතිවරයා ලෙස, ස්ථාවර සහ අනාගතවාදී දැක්මක් සහිත කළමනාකරණය විසින් මෙහෙයවනු ලබන ආයතනයක එහි වර්ධනයේ කොටස්කරුවෙකු වීමට ලැබීම ගෞරවයක් විය.

NIBM හි සභාපතිවරයාට සහ පාලක සභාවට පැවරී ඇති බලතල අනුව ප්‍රතිලාභ උත්පාදනය කරමින් ආයතනය සංවර්ධනය සහ සාර්ථකත්වය කරා ගෙනයාමට NIBM කළමනාකාරිත්වයට සහාය වීම සඳහා ප්‍රතිපත්ති මට්ටමින් පැහැදිලි උපදෙස් ලබාදීමේ වගකීම පාලක සභාව සතු වේ. 2022 වසර මෙරට ඉතිහාසයේ 'කවදාවත් නොවූ' ලෙස අභියෝගාත්මක වසරක් වුවද, NIBM සළකුණෙහි විශේෂත්වය වන්නේ වේගයෙන් වර්ධන සමඟ ඉදිරියට යාම, අධ්‍යාපනය හදාරන්නන් සඳහා වඩා හොඳ සහ නවීන ඉගෙනුම් පහසුකම් සැපයීම, සහ ආයතනයේ කැපවූ කාර්ය මණ්ඩලයට එහි ප්‍රයත්නයන් සඳහා දායක වීම වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීම වැනි ආයතනය වැදගත් තීරණ කිහිපයක් ගනු ලැබීමය. ආයතනය එහි ඉගෙන ගන්නන් සඳහා වඩා හොඳ ස්ථානයක් බවට පත් කිරීම සඳහා සිදු කරන ලද සියලුම සංවර්ධන ව්‍යාපෘති වලදී සහ සියලුම වැදගත් ප්‍රතිපත්ති තීන්දුතීරණ ගැනීම හා ක්‍රියාවට නැංවීම ඉහළ කළමනාකාරිත්වය සෑම විටම පාලක සභාවේ උපදෙස් ලබාගන්නා ලදි. රට මුහුණ දුන් දැවැන්ත අර්බුදයන් මධ්‍යයේ වුවද 'ස්වයං මූල්‍ය' ආයතනයක් ලෙස මෙම ආයතනය ගත් නිර්භීත තීරණ සාර්ථක කරගැනීමට ලැබීම සතුටට කරුණකි. සෑම අංශයකින්ම වසරින් වසර එහි වර්ධනයක් අත්කරගෙන තිබූ හෙයින් වසර අවසන් වන විට ගනු ලැබූ සියලු උත්සාහයන්ගේ ප්‍රථිඵල ඉතා සාර්ථක විය.

ආයතනයේ සභාපතිවරයා වශයෙන්, දැඩි අර්බුදකාරී අවස්ථාවක නොසැලී අඛණ්ඩ වර්ධනයක් අත්පත්කර ගැනීම කෙරෙහි විශ්වාසය තැබීම පිළිබඳව ආයතනයේ ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතාට මාගේ කෘතඥතාව ප්‍රකාශ කරමි. ඔහු විසින් ආයතනයට ලබාදුන් කැපී පෙනෙන නායකත්වය අතිශයින් වැදගත්ය. එනම් ඉතා අභියෝගාත්මක වසරක් තුළ එහි සියළු උත්සාහයන්වලදී නායකත්වයට සහයෝගය දැක්වීමට පමණක් නොව එහි අඛණ්ඩ වර්ධනයට දායක වීමට පසුබට නොවී ගනු ලැබූ උත්සාහය සම්බන්ධයෙන් සියලුම අංශවල ප්‍රාදේශීය මධ්‍යස්ථානවල අධ්‍යක්ෂවරුන්ට සහ ප්‍රධානීන්ට මම ස්තුතිවන්ත වෙමි. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක සැබෑ කොඳු නාරටිය වන සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලයට, දුෂ්කරතා මධ්‍යයේ වුවද සියලුම අධ්‍යයන ක්‍රියාවලීන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා දරන ලද සියලු වෙහෙස සහ කැපවී වැඩ කිරීම වෙනුවෙන් ඔවුන්ව ප්‍රශංසා කිරීමට කැමැත්තෙමි. ආයතනය විසින් ලඟාකර ගැනීමට හැකි වූ වර්ධනය ගැන ආඩම්බර වන අතර, මා සහ සියළු දෙනාම පාලක මණ්ඩලයේ සාමාජිකයන් බවට පත් කිරීම ගැන මම නැවතත් මගේ කෘතඥතාව සියළුම පරිපාලන හා මෙහෙයුම් කාර්ය මණ්ඩලය වෙත පළ කිරීමට කැමැත්තෙමි.

රට සෑම පැත්තකින්ම ගිලගත් අර්බුදකාරී තත්ත්වයෙන් ගොඩ ඒමත් සමඟින් දෙපයින් නැගී සිටින විට, NIBM ඉදිරි වසරවලදී නවතම නමුත් උද්යෝගිමත් අභියෝගවලට හොඳින් මුහුණ දෙනු ඇත. කෙසේ වෙතත්, ඉහළ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය සමඟින් ඒ සියල්ලට මුහුණ දීමටත්, දශක පහකට අධික කාලයක් පුරා අඛණ්ඩව පවතින සාර්ථකත්වයේ පුරුක් බවට පත් කිරීමටත්, කාලය පරීක්ෂා කර හැකියාව මම සහ පාලක සභාව තරයේ විශ්වාස කරන්නෙමු.

වී. කේ. චොක්සි (ජනාධිපති නීතිඥ)
සභාපති
ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

පාලක සභාව සහ ඉහළ කළමනාකාරිත්වය සෑම විටම ආයතනයේ වැදගත් ප්‍රතිපත්තිමය මූලපිරීම්වලදී අධ්‍යාපනය ලබන සිසුන්ට වඩා හොඳ අනාගතයක් සහතික කිරීමට කටයුතු කර ඇත.

'ස්වයං මූල්‍ය'

ආයතනයක් ලෙස රට මුහුණ දුන් දැවැන්ත අර්බුද මධ්‍යයේ දී පවා අප ආයතනය ගත් නිර්භීත තීරණ සාර්ථක කරගැනීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි.



කොවිඩ් වසංගතය අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකා ආර්ථිකයට සහ සමාජයට සිදුව තිබූ හානිය සහ විනාශකාරී බලපෑම් ක්‍රමානුකූලව අවසන් වෙමින් රට ඉදිරියට ගමන් කිරීම පටන් ගැනීමත් සමගම, නැවතත් එදිනෙදා ජන ජීවිතය උඩු යටිකුරු කරමි ආර්ථික හා සමාජීය යන දෙඅංශයෙන්ම විවිධ අභියෝග වලට මුහුණු දීමට සිදු වූහ. එනිසාම 2022 වසර විවිධ ආකාරවලින් සුවිශේෂී වසරක් විය. පෙර නොවූ විරූ අභියෝගවලට මුහුණ දීමට සිදුවීම දේශපාලන අස්ථාවරත්වය හේතු වූ අතර රට තුළ විදේශ විනිමය සංචිත හිඟ වීම නිසා ප්‍රද්ගලයින්ට ඖෂධ, ඉන්ධන වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට පවා අපහසු විය. ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස ජාතික ව්‍යාපාර කළමනාකිරීත්ව ආයතනය (NIBM) සැමවිටම කටයුතු කරනු ලැබුයේ පැහැදිලි දැක්මක් සහ ප්‍රතිපත්තියක් අනුව ගමන් කරමින් ආදායමේ ස්ථාවර වර්ධනය, ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීම, පාසල් හැර යන අයට සහ වෘත්තිකයන්ට නව පාඨමාලා හඳුන්වා දීම ආදී සඳහා වේ. NIBM හි කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය රටෙහි පෙර කිසිදා නොවූ අභියෝග හමුවේ වුවද මෙම ප්‍රතිපත්තියෙන් නොසැලී සිටීමට අධිෂ්ඨාන කරගෙන සියලුම කාර්යයන් සිදු කරන ලදි.


ආයතනයේ අධ්‍යයන හා මෙහෙයුම් ක්‍රියාවලින් දෙකෙහිම නිවැරදි ගමන්මග සහතික කිරීම සඳහා උපාය මාර්ගික මුලපිරීම් කිහිපයක් ක්‍රියාවට නංවන ලදි. ආයතනයේ කළමනාකරණ ක්‍රියාවලිය සහ ඉගණුම් ක්‍රියාවලින් අඛණ්ඩව පවත්වාගෙන යාම දෙමුහුන් ක්‍රියාවලියක් යටතේ ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන ලදි. එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ලද සමීප අධීක්ෂණ ක්‍රමවේදය අනුව මෙය ක්ෂේත්‍ර දෙක සඳහාම බෙහෙවින් ඵලදායී කළමනාකරණ උපාය මාර්ගයක් බව ප්‍රත්‍යක්ෂ විය. ප්‍රවාහනය සම්බන්ධයෙන් සිසුන් මුහුණ දෙන දුෂ්කරතා සඳහා පිළියමක් ලෙස ආයතනයේ අධ්‍යයන ක්‍රියාවලින් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා මාර්ගගත හා භෞතික දේශන ක්‍රමවේද දෙකම ක්‍රියාත්මක කරන ලදී. පරිපාලන සහ අනෙකුත් අංශයේ කාර්ය මණ්ඩලයද මෙම දෙයාකාරයෙන්ම ක්‍රියාත්මක වෙමින් ඔවුන්ගේ අගනා දායකත්වය නොකඩවා ලබා දෙන ලදි.

සාමූහිකව ගත් සියලු උත්සාහයන්හි ප්‍රතිඵලය වසර අවසන් වන විට ලඟා කරගැනීමට හැකි විය. රටෙහි පැවති තත්වය තුළ ඵල්ල කරන ලද සියලු අභියෝග මධ්‍යයේ වුවද නැවත වරක් සිය වර්ධන චක්‍රය අඛණ්ඩව පවත්වාගෙන යාමට NIBM ආයතනයට හැකි විය. ආදායම ගිය වසරට වඩා මෙම වසරේ වැඩි වී ඇත. සිසුන් සංඛ්‍යාව සම්බන්ධයෙන් ද එය එසේම විය, එනම් 2021 ට සාපේක්ෂව වැඩි සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට අපට හැකි විය. පිරිනමනු ලබන පාඨමාලා සංඛ්‍යාව සම්බන්ධයෙන් ගත් කල, එය නැවත වරක් අඛණ්ඩව වර්ධනය කරගැනීමට අපට හැකි වී තිබේ. මෙමගින් සේවක කාර්යක්ෂමතාවය සඳහා ඔවුන්ගේ අභිප්‍රේරණයන් සහතික කර ගැනීමට ඔවුන්ට ප්‍රතිලාභ පිරිනැමීමට අපට හැකි විය. භෞතික සම්පත් සහ යටිතල පහසුකම් එකතු කිරීම සහ සංවර්ධනය කිරීම ද අඛණ්ඩව සිදු කර ඇත. ව්‍යාපාරික පාසල සඳහා අති නවීන මධ්‍යස්ථානයක් පිහිටුවීම වසරේ තවත් සුවිශේෂී ජයග්‍රහණයක් විය. ව්‍යාපාරික පාසල සඳහා කැපවූ කාර්යමණ්ඩලයක් පවතින බැවින් නව වැඩසටහන් මාලාවක් හරහා පීඨයේ සිසුන් විශාල සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට හැකියාව පවතී. රට මුහුණ දුන් අර්බුද මධ්‍යයේ වුවද NIBM සිය වර්ධන ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාමට ගත් සියලු ප්‍රයත්නයන් අවසානයේ සාර්ථක වූ අතර මෙය 'ස්වයං මූල්‍ය' ආයතනයක් ලෙස NIBM හට ආඩම්බර විය හැකි කරුණක් වේ.

අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් 2022 වසර සාර්ථක කරගැනීමට සහය දැක්වූ සැමට මගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගැනීමි. වසරින් වසර ආයතනය වර්ධන මාවතට ගෙනයාමට මගපෙන්වන ආලෝකය, NIBM ආයතනයේ සභාපති වී. කේ. චොක්සි මහතාට සහ පාලක සභාවට මම බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. 2022 වර්ෂයේ පමණක් නොව, පසුගිය කාලය පුරාම ප්‍රාදේශීය මධ්‍යස්ථානවල අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධානීන් ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය, අනධ්‍යන කාර්ය මණ්ඩලය ශක්තිමත් කුළුණු ලෙස කටයුතු කිරීම පිළිබඳව මගේ හෘදයාංගම ප්‍රශංසාව පල කරමි. ආයතනයේ පරිපාලන සහ අනෙකුත් අංශවල සිටින සියළුම දෙනාට, සෑම විටම මෙන්, ආයතනයට සාර්ථකත්වයක් ගෙන දීම සඳහා මා සමඟ අත්වැල් බැඳගෙන සෑම වසරකම කටයුතු කිරීම ගැන ස්තුතිය ප්‍රකාශ කරමි. වසරේ ලබාගත් අත්දැකීම් සහ අගය කරන ලද ජයග්‍රහණ සමඟින්, NIBM ආයතනය 2023 වසරක් සඳහා සැලසුම් කර ඇති අතර එහි ස්ථාවරත්වය සහ වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීමට වඩාත් උද්යෝගිමත්ව කටයුතු කිරීමට හැකි වන වසරක් වනු ඇත.

ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය

NIBM උපාධි ප්‍රදානෝත්සවය














NIBM
Coventry University




NIBM






DESIGN
GRADUATION





NIBM උපාධි ප්‍රදානෝත්සවය















පාලක සභා සාමාජිකයන්



වී. කේ. චොක්සි මහතා
(ජනාධිපති නීතීඥ)
සභාපති
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය



ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය



නන්දික බුද්ධිපාල මහතා
සභාපති
ජාතික වාණිජ මණ්ඩලය



ආචාර්ය සේනක කැළුම් ගමගේ මහතා
අධ්‍යක්ෂ
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM)



ඩබ්.එම්.ආර්.බී. වීරසේකර මහතා
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය



ආචාර්ය ආර්.ඒ. අහිල් පෙරේරා මහතා
අධ්‍යක්ෂ, (දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව)
ශ්‍රී ලංකා මහ බැංකුව



අජිත් අබේසේකර මහතා
අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාරය



සමීර ජයවර්ධන මහතා
සහකාර ප්‍රධාන නිලධාරී - ඩිජිටල් ආර්ථික
ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය



වෛද්‍ය මෙල්කි පෙරේරා මහත්මිය
අධ්‍යක්ෂ, ජාත්‍යන්තර ව්‍යාපාර සංවර්ධන
සේසිරි හෝල්ඩිංග්ස් (PVT) LTD



ආචාර්ය සුනිල් ලියනාරච්චි මහතා
ආරම්භක සභාපති
ඉදිකිරීම් කර්මාන්ත කුසලතා කවුන්සිලය



සාරංග විජයරත්න මහතා
මහලේකම් / ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL) (සාමාජික)



සමන් රොද්දිගෝ මහතා
අධ්‍යක්ෂ - HRM සහ පරිපාලන
පාලක සභාවේ ලේකම්

පාලක සභා සාමාජිකයින් ගැන



වී. කේ. චොක්සි මහතා

(ජනාධිපති නීතිඥ)

චොක්සි මහතා කීර්තිමත් නීතිඥයෙකු මෙන්ම ජනාධිපති නීතීඥවරයෙකු ලෙස කටයුතු කරයි. සිවිල් අධිකරණ, වාණිජමය බුද්ධිමය දේපල සහ ව්‍යවස්ථාව සම්බන්ධ වූ නඩු සම්බන්ධයෙන් විශේෂයෙන් කටයුතු කරයි. එපමණක් නොව, ඔහු මහපොළ භාරකාර අරමුදලේ නීති උපදේශකවරයා ලෙසද, ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදලේ භාරකරු ලෙසද කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකාවේ ඉහලින්ම පිළිගත් සංගම්වන, කොළඹ නීති සංගමය සහ කොළඹ නීති පුස්තකාලයෙහිද සාමාජිකයෙකි.

චොක්සි මහතා ප්‍රමුඛ නීතීඥවරයෙකු මෙන්ම, අබාන්ස් ෆිනෑන්ස් සමාග මේ හි ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා ලෙසද සේවය කළ කීර්තිමත් නායකයෙක් වේ. ඔහු අබාන්ස් සමූහ ව්‍යාපාරයේ තොරතුරු තාක්ෂණ සමාගම වන ඇඩිවන්ටේජ්හි අධ්‍යක්ෂවරයෙකු වන අතර දැනට මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද කටයුතු කරයි. චොක්සි මහතා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සභාපතිවරයා වේ.

ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතා

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ (NIBM) අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩී.එම්.ඒ. කුලසූරිය මහතා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආයතනයේ විශිෂ්ටත්ව ගමනට නායකත්වය දුන් පළපුරුදු අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ප්‍රබලයෙකි. ඔහුගේ නායකත්වය අධ්‍යාපනයේ වර්ධනය, නවෝත්පාදන සහ අපේක්ෂාවන් සවිබලගැන්වීම සඳහා කැපවීමහි ප්‍රතිමූර්තියකි. ජවහර්ලාල් නේරු තාක්ෂණ විශ්වවිද්‍යාලයෙන් ලීන් කළමනාකරණය (Lean Management) පිළිබඳ ආචාර්ය උපාධියක්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්ම ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති ඔහුගේ සුදුසුකම් විවිධ අංශයන්හි අධ්‍යාපනික පසුබිමක් සහිත වේ.ඔහු NIBM සහ NSBM හි විවිධ තනතුරු දරූ කඩිසර නායකයෙකි. Convenience Foods පෞද්ගලික සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය, අභියාචනා මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වැනි ආයතනවල සේවය කරමින් ඔහුගේ සම්බන්ධතාවයන් සමස්ත ක්ෂේත්‍ර පුරාම විහිදී පවති. ඔහු ගුණාත්මකභාවය හා ඵලදායිතාව ප්‍රවර්ධනයේ ගාමක බලවේගයක් වී ඇති අතර, ශ්‍රී ලංකා තත්ත්ව සහ ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා වූ සංගමයේ උප සභාපතිවරයා ලෙසද කටයුතු කරයි.

ඔහුගේ ජාත්‍යන්තර අත්දැකීම්, නවෝත්පාදන මනෝභාවය සහ බහුකාර්ය කුසලතාව පරිපූර්ණ වර්ධනයට කැපවී සිටින නායකයෙකුගේ ලක්ෂණ පිළිබිඹු කරයි. ඔහු ක්‍රියාකාරී පර්යේෂකයෙක් සහ නවෝත්පාදකයෙක් ලෙස විවිධ සඟරාවලට සහ ප්‍රකාශන වලට දායකත්වය ලබා දී ඇත. ඔහුගේ උපාය මාර්ගික දැක්ම ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය, කෘෂි ව්‍යාපාර තාක්ෂණ මධ්‍යස්ථානය සහ NSBM හරිත විශ්ව විද්‍යාල ව්‍යාපෘතිය වැනි දෑ ආරම්භය සඳහා මුලපිරීමට හේතු වී ඇත. ප්‍රතිඵල පදනම් කරගත් ඉගෙනුම් (OBL) ක්‍රමය 2018 දී හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකාවේ ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රමය වෙනස් කිරීමේ උපායමාර්ගික ව්‍යාපෘතියට ඔහු නායකත්වය ලබා දුන්නේය. OBL ක්‍රමය පසුගිය වසර තුන තුළ NIBM හි සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර එය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඓතිහාසික සලකුණක් තබා ඇති අතර කර්මාන්තයේ පාර්ශවකරුවන් විසින් පිළිගන්නා ලදී.

ලීන් සහ සික්ස් සිග්මා ක්‍රමවේදය, දත්ත විශ්ලේෂණය සහ ඵලදායී සන්නිවේදනය පිළිබඳ ප්‍රවීණතාවය තුළින් සහ විවිධ සමාජ සම්බන්ධතා තුළින්, ඒ ඒ අංශ අතර සහයෝගිතාවය පෝෂණය කරමින් ඔහුගේ හැකියාවන් පෙන්නුම් කර ඇත.

ආචාර්ය ආර්. ඒ. ඒ. පෙරේරා මහතා

ආචාර්ය ආර්. ඒ. අනිල් පෙරේරා මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස 2021 ජූලි මාසයේ සිට සේවය කරයි. ආචාර්ය අනිල් පෙරේරා ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයෙන් දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධියක් 2014 වසරේදී ලබාගෙන ඇත. 2009 වර්ෂයේදී ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජ විද්‍යාව ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව (පළමු පෙළ) උපාධිය සඳහා ඉහළම සාමාන්‍ය ලකුණු ලබා ගනිමින් පීඨයේ රන් පදක්කම 2001 වර්ෂයේදී හිමිකරගන්නා ලදී.

ඔහු මහ බැංකුවේ සේවය කළ කාලයේ, දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂවරයෙකු ලෙස 2019 මාර්තු සිට 2021 ජූලි දක්වාත්, ආර්ථික

පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස 2017 ජනවාරි සිට 2019 පෙබරවාරි දක්වාත්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ / මුදල් සහ බැංකු අංශයේ ප්‍රධානියා ලෙස 2005-2017 සේවය කර ඇත. ආචාර්ය අනිල් පෙරේරා ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයේ බැංකු සහ මූල්‍ය දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර සහ සැසි ඉගැන්වීම් සහකාර ලෙස 2011 සිට 2014 දක්වා සේවය කළේය. ඔහු 2003 - 2005 දක්වා අරමුදල් කළමනාකරුවෙකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ සේවය කර ඇත.

ආචාර්ය අනිල් පෙරේරා මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට 2017 වසරේ සිට 2018 වසර දක්වා සිය සේවය ලබා දුන්නේය. ඔහු අපනයන සංවර්ධන මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස, වෙළඳ ප්‍රවර්ධනය සහ වෙළඳ තොරතුරු පිළිබඳ අපනයන උපදේශක කමිටුව, දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලයේ විශේෂඥ සමාලෝචන කමිටුව, පරිසර අමාත්‍යාංශය සහ හරිත මූල්‍ය සහ ජාත්‍යන්තර සහයෝගිතා අනුකමිටු සාමාජිකයෙකු ආදී ලෙස කටයුතු කර ඇත.

එස්. විජයරත්න මහතා

එස් විජයරත්න මහතා ඉතා තරඟකාරී වෙළඳපල ව්‍යුහයන් සහ කර්මාන්තයන්හි ක්‍රියාත්මක වන ආයතනවල කාර්යසාධනය පිළිබඳ ශක්තිමත් දැනුමක් සහිත, ප්‍රතිඵල නැඹුරු සහ පළපුරුදු වෘත්තිකයෙකි. ඵලදායී සහ කාර්යක්ෂම විසඳුම් ලබා ගැනීමට විවිධ මට්ටමේ අලෙවිකරණ ප්‍රයත්නයන් සිදු කිරීම සඳහා උපයෝගී කර ගත හැකි විශාල සහ පබල රාජ්‍ය අංශයේ ආයතනික ජාලයක් එක්රැස් කිරීමට දශක දෙකක අත්දැකීම් මගින් හැකියාව ලබාගෙන ඇත. ගෝලීය අලෙවිකරණයේ හොඳම භාවිතයන් අනුගමනය කරන අතරම නායකත්වය සහ කණ්ඩායම් සමඟ ශක්තිමත් සබඳතා පවත්වාගෙන යාමේ සුවිශේෂ හැකියාව ඇති ප්‍රවීණයෙකි.

ඔහු දැනට කොළඹ වාණිජ මණ්ඩලයේ (CCC) සභාපතිවරයා ලෙසත්, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ (FCCISL) අධ්‍යක්ෂවරයෙකු ලෙසත් සේවය කරයි.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ MBA ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා ලෙස 2013 - 2014 වර්ෂවලදී කටයුතු කළේය. තවද ඔහු 2009 සිට 2011 දක්වා ජාත්‍යන්තර ප්‍රචාරණ සංගමයේ (IAA) අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කර ඇත. ඔහු සිංගප්පූරුවේ ලෝක සන්නාම කොංග්‍රසයේ ගෝලීය උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද 2015 දී කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ, ජාතික රූපවාහිනියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කළ ඒ මහතා පෞද්ගලික අංශයේ ප්‍රධාන තනතුරු කිහිපයක් ද දරමින් සිටි.

ඔහු කළමනාකරණ අධ්‍යයනය සඳහා රජයේ ප්‍රමුඛතම විශ්වවිද්‍යාලය වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අලෙවිකරණ උපාධිධාරියෙකු වන අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක් ද ලබා ඇත. එසේම සහතිකලත් වෘත්තීය කළමනාකරුවෙක් (FCPM) සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (MSLIM) සාමාජිකයෙකි.

ඔහු ලොව පුරා විවිධ සංසදවල ප්‍රමුඛ කථිකයෙක් වන අතර, 2014 වසරේ මාධ්‍ය වෘත්තිකයා සහ 2013 වසරේ ජාත්‍යන්තර සන්නාම නායකත්ව සම්මානය ඇතුළු ජාත්‍යන්තර සම්මාන කිහිපයක් දිනා ගත්තේය. 2015 වසරේ ලෝක සන්නාම කොංග්‍රසය විසින් නම්කරන ලද වඩාත්ම බලගතු අලෙවිකරණ නායකයින් 50 දෙනා අතරට ඔහු ඇතුළත් විය.

එන්. බුද්ධිපාල මහතා

නන්දික බුද්ධිපාල මහතා කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී බැංකු හි ප්‍රධාන මූල්‍ය නිලධාරියා වන අතර, බැංකුකරණය, සන්නිවේදනය සහ විගණනය සහතික කිරීමේ සම්බන්ධයෙන් වසර 25කට වැඩි පළපුරුද්දක් ඔහුට ඇත. ඔහු ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධිය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ලබා ගත්තේය. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ MBA, MA සහ මූල්‍ය ගණිතය පිළිබඳ MSc උපාධි ලබා ඇත. ඔහු වරලත් ගණකාධිකාරී ආයතනයේ (FCA) සෙසු සාමාජිකයෙකි. ශ්‍රී ලංකා සහතික කළ කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (FCMA, SL), වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය, (FCCA) එක්සත් රාජධානියේ වරලත් ආරක්ෂක සහ ආයෝජන ආයතනයේ (MCISI) සහ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA) ආදියෙහි සාමාජිකත්වය දරයි. ඕස්ට්‍රේලියාවේ මූල්‍ය සේවා ආයතනයේ (SA FIN) ජ්‍යෙෂ්ඨ සහායකයකු මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (IMA) සාමාජිකයෙකි.

ඔහු ACCA හි හිටපු සභාපති සහ වත්මන් සාමාජික ජාල අනුමණ්ඩලයේ සාමාජික සහ CISI ශ්‍රී ලංකා ශාඛාවේ උපදේශක කමිටුවේ සාමාජිකයෙකි, එසේම ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයේ බැංකු සහ මූල්‍ය සේවා කමිටුවේ ගරු ලේකම් සහ සභාපතිවරයාද වේ. ඔහු වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම්කරණ හා ව්‍යාපාර පාසලේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර හා මූල්‍ය පීඨයේ බාහිර සාමාජිකයෙකි. ඔහු ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වූ අතර එක්සත් රාජධානියේ ACCA විසින් මෑතකදී අධ්‍යාපන ගෝලීය සංසදයේ විශේෂඥයෙකු ලෙස පත් කරන ලදී.

ඒ. අබේසේකර මහතා

අජිත් අබේසේකර මහතා දැනට මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරයි. ඔහු 2013 වසරේ සිට එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරන අතර රාජ්‍ය සේවයේ දැනට වසර 29කට වැඩි පළපුරුද්දක් සහිත ලංකා සැලසුම් සේවයේ (SLPS) විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.

අබේසේකර මහතා ශ්‍රී ලංකා සැලසුම් සේවයට (SLPS) සහකාර අධ්‍යක්ෂවරයකු ලෙස 1994 ජනවාරි මාසයේදී එක් විය. 1994 මැයි මස සය මසක සේවාස්ථ සේවා පුහුණුව

නිම කිරීමෙන් පසු බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ලෙස පත්වීම් ලැබූ ඔහු එහි වසර හයකට ආසන්න කාලයක් සේවය කළේය. 2000 ජනවාරි මාසයේදී ඔහු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද අතර එහිදී ඔහු 2004 වර්ෂය දක්වා සේවය කළේය. එතැන් සිට 2010 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට ඔහුට අවස්ථාව ලැබුණි. 2011 දී ඔහු රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරට උසස් කරන ලදී. ඔහු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරේ ද කටයුතු කළේය.

අබේසේකර මහතා ජපානයේ ටෝකියෝ හි (2003) ප්‍රතිපත්ති අධ්‍යයන උපාධි ආයතනයෙන් (GRIPS) ජාත්‍යන්තර සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් (2000) උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, 1996 දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් පරිපාලනය සහ අධ්‍යයන කටයුතු සඳහා උසස් ඉංග්‍රීසි පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් ද ලබා ඇත. අබේසේකර මහතා 2002 ඔක්තෝබර් සිට 2003 මාර්තු දක්වා මාස හයක් සීමාවාසිකයෙකු ලෙස ජපානයේ ටෝකියෝ හි එක්සත් ජාතීන්ගේ විශ්වවිද්‍යාලයට අනුයුක්තව කටයුතු කර ඇත. ඔහු 1991 දී භෞතික විද්‍යාව, ගණිතය සහ කාර්මික කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ගෞරව) සහිත කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකි.

අබේසේකර මහතා අධ්‍යක්ෂවරයකු ලෙස භාණ්ඩාගාරය නියෝජනය කරමින් ලංකා නැවි සංස්ථාව, සීමාසහිත ලංකා සතොස, සීමාසහිත ලංකා විදුලි සමාගම (ලෙකෝ), මධ්‍යම ගමනාගමන මණ්ඩලය (CTB), ජාතික අධ්‍යාපන ආයතනය, පර්මානු තාක්ෂණික පුහුණු ආයතනය, තේ පර්යේෂණ ආයතනය (TRI), ඉදිකිරීම් සහ සංවර්ධන ආයතනය (ICTAD), කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU), බටලන්ද ආරක්ෂක මාණ්ඩලික විද්‍යාලය සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය (USDA) සෙවය කළේය. ඔහු සීමාසහිත ලංකා හයිඩ්‍රොලික් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සාමාජිකයෙකි.

ආචාර්ය එස්.කේ. ගමගේ මහතා

ආචාර්ය කැළුම් ගමගේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි. මීට පෙර ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ අධ්‍යයන අංශයේ, කළමනාකරණ අධ්‍යයන පීඨයේ සහ වාණිජ විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලෝක බැංකුවේ අරමුදල් සහිත උසස් අධ්‍යාපන ව්‍යාපෘතිවල අධ්‍යක්ෂ ලෙස වසර දහයක් ඇතුළුව විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ ඔහුගේ අත්දැකීම් දශක දෙකකට වැඩි කාලයක් පුරා විහිදේ.ආචාර්ය කැළුම් ගමගේ මහතා ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ විශේෂඥයෙකි. ශාස්ත්‍රීය කටයුතු සහ වටිනාකම් පදනම් කරගත් නායකත්වය සඳහා ඔහු කළ සැලකිය යුතු දායකත්වය නිසා ඔහු දැනුම නිර්මාණය කිරීමේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු ලෙස කර්මාන්තයේ ඉහළ පිළිගැනීමක් ලබා ඇත. ඔහුගේ ප්‍රවීණතාව ක්ෂේත්‍රයේ ප්‍රකාශන සහ පර්යේෂණ සංවර්ධන දායකත්වයන් රාශියක් තුළින් පිළිබිඹු කරයි. ඔහු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ලෝක බැංකුවේ ඉහළ පෙළේ ව්‍යාපෘති සඳහා උපදේශකයෙකු සහ පුහුණුකරුවෙකු ලෙස සේවය කර ඇත. පාඨමාලා සංවර්ධකයෙකු, උපපරිපාලකවරයෙකු සහ විෂයමාලා විශ්ලේෂකයෙකු ලෙස ඔහු ආයතන කිහිපයකට සහ වෘත්තීය ආයතන කිහිපයකට HND සහ උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීමට සහාය ලබා දී ඇත.

ඔහු රුසියාවේ ආර්ථික හා මූල්‍ය සඳහා ශාන්ත පීටර්ස්බර්ග් රාජ්‍ය විශ්වවිද්‍යාලයෙන් ගිණුම්කරණය පිළිබඳ ආචාර්ය උපාධිය සහ මූල්‍ය හා ආර්ථික විද්‍යාව පිළිබඳ පස්චාත් උපාධිය ලබා ගෙන ඇත.

ඩබ්.එම්.ආර්.බී. වීරසේකර මහතා

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වසර දෙකක් (1991-1993) සහකාර ගුරුවරයෙකු ලෙස සේවය කළේය. 1993 දී සහකාර කථිකාචාර්යවරයකු ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයට බැඳුණු අතර එහි 1994 ජනවාරි දක්වා සේවය කරන ලදි.

1994 දී තෙවන පන්තියේ සැලසුම් නිලධාරියෙකු ලෙස ශ්‍රී ලංකා සැලසුම් සේවයට (SLPS) ඇතුළත් වී දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන ලදි. 1996 සිට 2004 දක්වා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ NCP හි IFAD (කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල) සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ සේවය කළේය. ඉන්පසුව උතුරු මැද පළාත් විදුලිබල, පළාත් මාර්ග සහ සමුපකාර අමාත්‍යාංශයන්ට අනුයුක්තව සහකාර සැලසුම් ලේකම්වරයෙකු ලෙස සම්බන්ධ වී 2012 දක්වා සේවය කළේය. පළාත් සමුපකාර අමාත්‍යාංශයේ සේවය කරන අතරතුර 2007 සිට 2012 දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ සභාපති ධුරය හෙබවීම සහ NCP හි පළාත් කාර්මික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කළේය. තවද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂ ලෙස සේවය කරන ලද අතර SLPS හි 1 පන්තියට උසස් කරන ලදි. 2016 දී ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයට සම්බන්ධ වූ අතර 2019 දී SLPS හි විශේෂ ශ්‍රේණියට උසස් වන තෙක් සේවය කළේය. අධ්‍යාපන අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශයේ සැලසුම් අධ්‍යක්ෂ ජනරාල් (SLPS හි විශේෂ ශ්‍රේණිය) ලෙස මේ දක්වා සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීමේ වගකීම් සමඟින් කටයුතු කරයි.

1993 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් පළමු පන්තිය ප්‍රථම ගෞරව උපාධිය ලබා ගන්නා ලදි.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජාතික මට්ටමේ උප සංවර්ධන සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (SNLDP) 2002 දී සම්පූර්ණ කරන ලදි.

2003 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීජීඅයිඒ ආයතනයේ, ආයතනික

කළමනාකරණය පිළිබඳ පස්වාත් උපාධිය ඔහු සම්පූර්ණ කළේය.

එස්. ජයවර්ධන මහතා

ඩිජිටල් ආර්ථිකය, ඩිජිටල් රජය සහ වැඩසටහන සහ ව්‍යාපෘති කළමනාකරණය සමඟ පුරවැසියන් සවිබල ගැන්වීම ඇතුළු ඩිජිටල් පරිවර්තනය පිළිබඳ ඩිජිටල්කරණ වැඩසටහන්වල වසර 17 කට වැඩි පළපුරුද්දක් ඇති ඩිජිටල් තාක්ෂණය, ඩිජිටල් අධ්‍යාපනය, මානව සම්පත් ධාරිතා ගොඩනැගීම සහ ඩිජිටල් ක්‍රමවේද පෝෂණය කිරීම පිළිබඳව පරිවර්තනීය නායකයෙකු, උපායමාර්ගිකයෙකු සහ ප්‍රතිඵල මෙහෙයවන උපදේශකයෙකි. GoSL සහ ජාත්‍යන්තර සංවර්ධන ආයතන සමඟ මහා පරිමාණ ජාතික සහ ආයතනික ක්‍රියාකාරකම් මෙහෙයවීම සහ කළමනාකරණය කිරීමේ ජයග්‍රහණ පිළිබඳ ඔප්පුකළ වාර්තාවක් ඔහු සතුවේ. පුළුල් පරාසයක පාර්ශවකරුවන් කළමනාකරණය කිරීමට, කණ්ඩායම් වෙනස් කිරීමට, දිගුකාලීන උපායමාර්ගික හවුල්කාරිත්වයන් වර්ධනය කිරීමට සහ තීරණ ගන්නන්ගේ සියලු මට්ටම් සමඟ ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට ඇති හැකියාව, ශ්‍රී ලංකාවේ සම්මානලාභී ජාතික ඉන්ධන අවසර පත්‍රයේ නිපදවීම ක්‍රියාවලියේ උපාය මාර්ගය සැලසුම් කිරීම සහ මෙහෙයවීම ඔහුගේ සුවිශේෂ ජයග්‍රහණයන්ය. ව්‍යවසායන්හි ඩිජිටල් පරිවර්තනය, රජය, සමාජ සවිබල ගැන්වීම, ඩිජිටල් අධ්‍යාපනයේ පරිවර්තනය සහ ඩිජිටල් ආර්ථිකය දෙසට මානව සම්පත් යොමුකිරීම ඇතුළු විවිධ පරිවර්තන ක්ෂේත්‍රවල ඩිජිටල් පරිවර්තනය සහ ඩිජිටල් ආර්ථික කළමනාකරණය පිළිබඳ විශේෂඥයෙකි. රාජ්‍ය ව්‍යවසායන්හි සහ සාමාන්‍ය ජනතාවගේ විවිධ අංශ වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ජාතික සහ ආයතනික සංවර්ධන මූලපිරීම් කිහිපයක නායකත්ව තනතුරු දැරීමෙන් ඔහු අත්දැකීමෙන් පරිපූර්ණ වේ. ඔහු රජය, කර්මාන්ත සංගම්, රාජ්‍ය නොවන සංවිධාන, බහුජාතික ව්‍යාපාරික ආයතන, ජාත්‍යන්තර සංවර්ධන ආයතන, ජාත්‍යන්තර ප්‍රවීණයන් යනාදී ඉහළ පෙළේ දේශපාලන ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සිට බිම් මට්ටම දක්වා පාර්ශවකරුවන් සමඟ පුළුල් මූල පිරීම් සහ ව්‍යාපෘති කළමනාකරණය කර ඇත. ගතික අභියෝගාත්මක පරිවර්තන පරිසරයන් තුළ සංකීර්ණ මහා පරිමාණ ජාතික සහ ආයතනික මූලපිරීම් හැසිරවීම සහ කළමනාකරණය කිරීමේ ජයග්‍රහණ ගණනාවක් ඔහු සතුය. ඉලක්කගත ආකාරයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට ඔහු සංකීර්ණ කණ්ඩායම් කිහිපයක විවිධ ස්ථර එකවර මෙහෙයවන හැකියාවක් සතුව ඇත. ඔහු ශ්‍රී ලංකා පරිගණක සංගමයේ ලාබාලතම කවුන්සිල් සාමාජිකයෙකු විය. ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා කවුන්සිලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. එසේම සෑම මැදිහත්වීමකදීම අවශ්‍ය කටයුතු ධනාත්මක සහ ඵලදායී ලෙස ඉටුකිරීමට උත්සාහ කරන සරල මිනිසෙකි.

ආචාර්ය එස්. පී. ලියනාරච්චි මහතා

ආචාර්ය එස්.පී. ලියනආරච්චි මහතා සාර්ක් රටවල ඉදිකිරීම් කවුන්සිලය, ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය, ජාතික ඉදිකිරීම් සංගමය, උසස් ඉදිකිරීම් පුහුණුකිරීමේ ඇකඩමිය (වෘත්තීය පුහුණු, මුදල් අමාත්‍යාංශය), සහ විශ්වවිද්‍යාල ඉදිකිරීම් තාක්ෂණ විද්‍යාලය (විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ කුසලතා සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය), යන ආයතනවල සභාපතිවරයකු ලෙස සේවය කර ඇත. ඔහු මැලේසියාවේ ජාත්‍යන්තර අධ්‍යාපන පර්යේෂණ උසස් අධ්‍යාපන වෘත්තීය මධ්‍යස්ථානයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇත. ආචාර්ය ලියනආරච්චි මහතා මෙහෙයුම් කමිටුවේ, TVEC නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ද විය. ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඔහු සතු වූ අතිවිශාල දැනුම සැලකිල්ලට ගනිමින්, ඔහු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලැබීය.

වෛද්‍ය එම්.සී. පෙරේරා මිය

වෛද්‍ය එම්. සී. පෙරේරා මිය 2012 වසරේ සිට Sesiri Holdings (Pvt) Ltd හි ජාත්‍යන්තර ව්‍යාපාර සංවර්ධන අධ්‍යක්ෂවරයෙකු ලෙසත් 2018 වසරේ සිට මේ දක්වා Chamber of Elegance (Pvt) Ltd හි කළමනාකාර අධ්‍යක්ෂ ලෙසත් සේවය කරයි. වෛද්‍ය එම්. සී. පෙරේරා මිය 2019 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලාංකාවේ රූපලාවණ්‍ය හා සමස්ත ප්‍රතිකාර අංශයේ මෙන්ම බාහිර කථිකාචාර්යවරියක ලෙසත්, සෞන්දර්ය වෛද්‍ය විද්‍යාව සහ සායනික රූපලාවණ්‍ය විද්‍යාව පිළිබඳ උපදේශකයකු ලෙසත් අත්දැකීම් සහිත පළපුරුදු අයෙකි. වෛද්‍ය එම්. සී. පෙරේරා ඇමරිකා එක්සත් ජනපදයේ ගෝලීය සාමය සඳහා වූ එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලයෙන් සෞන්දර්ය වෛද්‍ය විද්‍යාව සහ සායනික රූපලාවණ්‍ය විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇත. ඇය උපදේශන මනෝ විද්‍යාඥවරියක්, සෞන්දර්ය වෛද්‍ය පර්යේෂකවරියක්, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක් සහ ව්‍යවසායිකාවක් ලෙස ද සේවය කටයුතු කර ඇත. ආචාර්ය එම්. සී. පෙරේරා මහත්මිය නිදහස් අභිප්‍රේරණ පුහුණුකරුවෙකු සහ උපදේශකයෙකු ලෙස ඇයගේ දැනුම සමාජය සමඟ බෙදා හදා ගනිමින් සිටියි.

එස්. රොද්‍රිගෝ මහතා

සමන් රොද්‍රිගෝ මහතා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයට සහකාර අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලන ලෙස 2008 දී සම්බන්ධ වූ අතර, මේ වනවිට ආයතනයේ අධ්‍යක්ෂ මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලන තනතුර දක්වා උසස් විය. ඔහු ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ පාලක සභාවේ ලේකම් ලෙස 2012 සිට පත් කරන ලදී. රොද්‍රිගෝ මහතා NSBM ආයතනයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පස්වාත් උපාධියක්ද, ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබාගෙන ඇත.

අධ්‍යාපන මණ්ඩලය



මහාචාර්ය ගිහාන් ඩයස් මහතා
පරිගණක විද්‍යා හා ඉංජිනේරු දෙපාර්තමේන්තුව



ආචාර්ය එම්. එම්. පී. ප්‍රේමකුමාර මහතා
ලේකම්
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව



ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය



මහාචාර්ය අබේරත්න බණ්ඩාර මහතා
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



මහින්ද බී. හේරත් මහතා
ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය



මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මහතා
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
කොළඹ විශ්වවිද්‍යාලය, ව්‍යාපාර ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව (College House)



ජී. වී. පී. අමරසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ
රයිගම් සමාගම් සමූහය



නිලංක ද සොයිසා මහතා
කළමනාකාර අධ්‍යක්ෂ
Convenience Foods (Lanka) PLC



ආචාර්ය හර්ෂ දුලාරි විජේසේකර මිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය,
විවෘත විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය



වී. කේ. චොක්සි මහතා
සභාපති

ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතා
අධ්‍යක්ෂ ජනරාල්



කෝලිත රණවක මහතා
අධ්‍යක්ෂ SOB



සමන් රොදිගෝ මහතා
අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලන



සිවාංජලි යෝකරාජා මහත්මිය
අධ්‍යක්ෂ මූල්‍ය පරිපාලන



ගංගානි වික්‍රමසිංහ මහත්මිය
අධ්‍යක්ෂ SOCE



ආචාර්ය සමීර විජේසිරි මහතා
අධ්‍යක්ෂ SOD

අපගේ සේවා සැපයීම



අපගේ සේවාලාභීන් සඳහා

පුද්ගලයින්

රැකියාභිමුඛ, පිළිගැනීමට පාත්‍ර වන සුදුසුකම් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන අතරම ඔවුන්ගේ නිපුණතා වර්ධනය කිරීම.

සංවිධාන

සංවිධානවල කාර්යසාධන ශක්‍යතා වර්ධනය සඳහා හැකියාවන් ශක්තිමත් කිරීම.

අපගේ කාර්යමණ්ඩලය සඳහා

වෘත්තීය නිදහස, කාර්යසාධනය පදනම් කරගත් ප්‍රදාන, මිත්‍රශීලී වැඩ පරිසරය හා ආයතනය සමඟ ඉගෙනීමට හා වර්ධනයට අවස්ථා සැපයීම.

අපගේ හවුල්කරුවන් සඳහා

ගෝලීය මට්ටමේ පහසුකම් හා විශේෂඥ දැනුම ලබාදීම.

අපගේ බාහිර උපදේශකයින් සඳහා

පිළිගැනීම සාමාන්‍ය මට්ටමට වැඩි ප්‍රදාන හා ජාලගත වීමට අවස්ථා ලබාදීම.

අපගේ සමාජයට

දැනුම බෙදාහැරීම හා ඵලදායිතා වර්ධනය

NIBM
POWERING
GREAT
MINDS














මානව සම්පත් කළමනාකරණය

ආයතනයේ අරමුණු ළඟා කර ගැනීමටත් ශිෂ්‍යයන්ට හා කාර්ය මණ්ඩලයට ප්‍රතිදාන ලබාදීමටත් ආයතනයේ කාර්ය මණ්ඩලය මනා ලෙස කළමනාකරණය කිරීම ඉතා වැදගත් බව ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය හඳුනාගෙන ඇත. අපගේ සේවක පිරිස ආයතනික වගකීම් ඉටුකිරීමේලා පූර්ණ වශයෙන් නියැලී සිටින බව තහවුරු කිරීම සඳහා පහත සඳහන් සංරචක ඇතුලත්කර ආකෘතියක් ගොඩනගා ඇත.

- බඳවා ගැනීම, තෝරා ගැනීම හා අනුස්ථාපනය
- උපාය මාර්ගික මෙහෙයුම (දීර්ඝකාලීන)
- කාර්යසාධන ඉලක්ක (කෙටිකාලීන)
- කාර්යසාධන ඇගයීම
- පුහුණුව හා සංවර්ධනය
- ප්‍රතිලාභ කළමනාකරණය
- වෘත්තීය අභිවර්ධනය

මෙම සංරචක සේවකයින් විසින් ඉටු කරන කාර්යය කෙරෙහි සහ සංවිධානය කෙරෙහි ඉහළ සේවක කැපවීමක් ඇති කිරීම සඳහා එකිනෙකා සමඟ ඒකාබද්ධ වන ආකාරය පහත NIBM මානව සම්පත් කළමනාකරණ ආකෘතිය තුළින් නිරූපණය කෙරේ.



ආකෘතිය - මානව සම්පත් කළමනාකරණ ආකෘතිය

මානව සම්පත් කළමනාකරණය

අප ආයතනය තුළ ප්‍රධාන සේවක කාණ්ඩයම් දෙකක් ඇත; එනම් දැනුම, නිපුණතා වර්ධනය හා උපදේශනය මඟින් ඍජුවම අගයන් ඇති කිරීමේ ක්‍රියාවෙහි නියුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආයතනය මනාව පවත්වාගෙන යාමට අවශ්‍ය සේවාවන් සපයන අනධ්‍යයන කාර්ය මණ්ඩලයයි. මෙම කාණ්ඩයම් සඳහා වන කාර්යසාධන ඇගයීම හා එහි ප්‍රතිලාභ ලබාදීමේ සැලැස්ම.එකිනෙකට වෙනස් ය. කෙසේ වුව ද මෙම කාණ්ඩයම් දෙක සඳහා වන කාර්යසාධන ඇගයීම හා ප්‍රතිලාභ ලබාදීම ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ ඉලක්ක හා අරමුණු ළඟා කරගැනීම හා සම්බන්ධ වේ.

ඉහත ආකෘතියෙහි දැක්වෙන පරිදි අප සේවකයන්ට සංවිධානයේ අවශ්‍යතා මත පදනම් කරගත් රැකියා විශ්ලේෂණය කිරීම තුළින් බිහිවූ රැකියා විස්තර හිමිවේ. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ දීර්ඝකාලීන හා මධ්‍යකාලීන සැලසුම්වල කොටසක් ලෙස දැක්ම, මෙහෙවර හා අරමුණු මඟින් සේවකයන් උපායමාර්ගිකව මෙහෙයවනු ලැබේ. අරමුණුවලින් සැදුම්ලත් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් වාර්ෂික අයවැයෙහි ඉලක්ක ළඟා කරගැනීමත් එක් එක් සේවකයා සතු වගකීම වේ.

සේවකයන්ගේ වගකීම් හා සම්බන්ධ කාර්යසාධනය මැනබැලීම කාර්යසාධන ඇගයීම් පත්‍රයක් මඟින් වාර්ෂිකව සිදු කරනු ලබයි. උපදේශකවරු හා අධ්‍යක්ෂකවරු සම්බන්ධ කාර්යසාධන ඇගයීම් පත්‍රවල අන්තර්ගතය හා විශ්ලේෂණයෙහි ගැඹුර සෙසු කාර්ය මණ්ඩලය හා සසඳන විට මද වශයෙන් වෙනස් වන්නේ වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබාගැනීමත් අවබෝධයත් සඳහා ය.

සේවකයකුගේ කාර්යසාධනය, රැකියා විස්තරය හා වාර්ෂික අයවැයෙහි දැක්වෙන අපේක්ෂා සපුරාලන විට දිරිදීමනා, උසස්වීම්, වැටුප් වර්ධක හා කාර්යය ප්‍රසාරණය ආදිය මඟින් ප්‍රතිලාභ ලබාදෙනු ලැබේ.

කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු වූ විට තම රැකියාව සඳහා අවශ්‍ය වන කුසලතා හා නිපුණතා වැඩිදියුණු කරගැනීම සඳහා සේවකයා හට පුහුණු හා සංවර්ධන අවස්ථා සලසා දෙනු ලැබේ. සේවකයාගේ ආකල්ප හා හැසිරීම නිවැරදි කිරීම සඳහා ද පුහුණුව හා සංවර්ධනය ඉවහල් වේ.

වැඩි වශයෙන් සුදුසුකම් හා නිපුණතා ලබා ගැනීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විසින් මෙහෙයවනු ලබන අභ්‍යන්තර වැඩසටහන් මෙන්ම බාහිර වැඩසටහන් සඳහා ද සහභාගි වීමට අපගේ සේවකයන් දිරිමත් කෙරේ. සේවකයකු ඉහළ සුදුසුකම් ලබා ගත් විට ඔහුට/ඇයට වඩා ඉහළ තනතුරක් සඳහා අයදුම් කිරීමට හැකියාව ලැබේ.

ඒ අනුව ලබාදෙන සහයෝගය මඟින් සේවක තෘප්තිය ඉහළ නැංවීමට පහත දැක්වෙන භෞතික ප්‍රතිලාභ ලබාදෙන්නෙමු.

- මූල්‍ය ප්‍රතිලාභ - දිරිදීමනා, වැටුප් වර්ධක, වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන වියදම් ප්‍රතිපූර්ණය කිරීම
- මූල්‍ය නොවන ප්‍රතිපාදන - උසස්වීම්, විදේශ පුහුණු වැඩසටහන්
- වැඩ පරිසරයෙහි/පහසුකම් වැඩි දියුණු කිරීම
සම්මන්ත්‍රණය, නත්තල් සැමරුම්, NIBM විවෘත දිනය ආදිය ඇතුළත් වේ. NSEC (NIBM ශිෂ්‍ය ඉසව් කමිටුව) සියලුම පීඨ සහ ශාඛාවල සහභාගිත්වයෙන් ක්‍රියාකාරකම් මෙහෙයවීම සිදුකරනු ලැබේ.



ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් සවිබල ගැන්වීම සඳහා මුලපිරීම

1 NIBM **සමඟ දවසක් ගතකිරීම**
NIBM ආයතනය "NIBM සමඟ දවස ගතකිරීම" නමින් නව සේවාවක් ආරම්භ කරන ලද අතර එය අඩු වරප්‍රසාද සහිත දරුවන් සහ ඔවුන්ගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරන ජාතික වැඩසටහනක මූලපිරීමක් වන අතර එමඟින් ඔවුන්ගේ මුහුණේ සිනහවක් ඇති කිරීමටත් විවිධ ආකාරවලින් ජීවිතයට නායකත්වය දීමටත් ඔවුන්ට සහාය වීමත් මෙතුළින් සිදුකෙරේ. සැබෑ සතුට යනු ඔබ සතු දේ සතුට සොයන අය සමඟ බෙදා ගැනීමය. මේ හේතුව නිසා, NIBM ආයතනයට අවශ්‍ය වන්නේ මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයේ යථාර්ථයන් අත්විඳීමට සතුට ලැබිය යුතු නමුත් ජීවිතයේ සැබෑ සතුට ළඟා කරගැනීමට උත්සාහකරන සහ අවශ්‍යතා ඇති අයට උපකාර කිරීම සඳහා අවස්ථාවක් ලබා දීමයි. එබැවින් "NIBM සමඟ දවස ගත කිරීම" යනු අපගේ සිසුන්ට මිනිසුන්ගේ සැබෑ ජීවිත අත්දැකීම් ලබා දෙන නව ව්‍යාපෘතියකි, එහිදී සිසුන් විසින්ම තෝරාගත් පවුලක් සමඟ ඔවුන්ගේ සිතුවිලි, හැඟීම් සහ කරුණාව බෙදාගැනීම තුළින් ඔවුන්ව දිරිමත් කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය SDAGs සමඟ සම්බන්ධ කරමින්, දැනුම සහ ප්‍රවීණත්වය බෙදා ගැනීම සහ වරප්‍රසාදලත් ළමුන්ගේ පැවැත්මටත්, සමෘද්ධිමත් වීමටත් සහ ඔවුන්ගේ හැකියාවන් නව යොවුන් වියේදීම සපුරාලීමටත්, ළමා සෞඛ්‍යය, පෝෂණය, අධ්‍යාපනය, යන ක්ෂේත්‍රවල ආධාරකයක් වීමටත් සැලසුම් කරන ලද අතර එහි පළමු පියවර ඉදිරියෙන් සිටී. අපගේ ජාතියේ තරුණ තරුණියන්ගේ ජීවිත වැඩිදියුණු කිරීමේ මෙහෙවර සමඟින් වාර්ෂික UN ව්‍යාපෘතියක් සමඟ NIBM ව්‍යාපෘතිය සමඟ දවස ගත කරන අතරම කුසලතා ගොඩනැගීම සහ ආරක්ෂාව ශ්‍රී ලංකාවේ විවිධ පළාත් සමඟ සම්බන්ධවීමේ ව්‍යාපෘතිය පුළුල් කිරීම සඳහා තාක්ෂණික සහ මූල්‍ය සහාය එ.ජා. සංවිධාන වැනි සංවිධානවලින් ලබා ගැනීම.

2 CEO ග්ලෝබල් (The CEO Global) ව්‍යාපාර ආකෘති පරිවර්තනය

54 වසරක විශිෂ්ටත්වය සමරන ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය මේ වසරේ "The CEO Global - Transforming, නමින් වාර්ෂික සඟරාවක් නිකුත් කරමින් වර්ධනය වන කර්මාන්තවලට සහය වෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වයට පා තබන තරුණ තරුණියන් සවිබල ගැන්වීම සඳහා නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට තීරණය කළේය. ගෝලීය සන්නාමයක් වර්ධනය කිරීම සඳහා විශිෂ්ට ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක වූ ව්‍යාපාර ආකෘතීන්, උපාය මාර්ග සහ අදහස් පිළිබඳ තීරණාත්මක තොරතුරු බෙදාහදා ගනිමින්, ඔවුන්ගේ සාර්ථකත්වයේ රහස් ඉස්මතු කරමින්, වඩාත් සාර්ථක ප්‍රධාන විධායක නිලධාරීන්ගේ තීක්ෂණ බුද්ධිය සහ ආශ්වාදය බෙදා ගැනීමට මෙතුළින් අපි බලාපොරොත්තු වෙමු.

නායකත්වය සහ නිපුණතා සංවර්ධනය - Gavel Club (ජනවාරි - දෙසැම්බර් 2022)	
1	සවිබල ගැන්වීම සඳහා දැනුවත් කිරීම - සම්මන්ත්‍රණය (පිවිසුම; ශ්‍රී ලංකාවේ සියලුම : Gavel Clubs)
2	සෑම මාර්ගගත රැස්වීමකදීම වෘත්තීය පුහුණුකරුවන් විසින් මහජන කථන සහ නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම
3	ජාත්‍යන්තර Toastmasters ඉසව්වලට Gavel සාමාජිකයින් (සංගම්/අංශ/දිස්ත්‍රික් සම්මන්ත්‍රණ සහ මාර්ගගත ලෙස) සහභාගී වීම
4	Toastmasters තරඟ සඳහා සහභාගී වන Gavel සාමාජිකයින් (සමාජය/අංශය/දිස්ත්‍රික්ක තරඟ මාර්ගගතව) සම්බන්ධ කිරීම
5	ආශ්වාදයේ වචන - පෞරුෂ සම්මුඛ පරීක්ෂණ වැඩසටහන Face Book හි සජීවී ලෙස පැවැත්වීම
6	වෙනත් සමාජ ජාලා සමඟ මාර්ගගත තේමාත්මක අධ්‍යාපනික රැස්වීම් / ඒකාබද්ධ රැස්වීම් පැවැත්වීම
7	ජාත්‍යන්තර Gavel රැස්වීම් සහ තරඟ මාර්ගගතව සිදුකිරීම
8	My Gavel Life – NIBM Gavel Club හි සිසුන්ගේ සම්මුඛ සාකච්ඡාවක් සිදුකිරීම
9	Power fo Dreams - සාර්ථක ක්ෂේත්‍රයේ පුද්ගලයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම මුහුණු පොතහි සජීවී ලෙස සිදුකිරීම
10	Le Real Life Talks – මාර්ගගතව සිදුකිරීම Podcast සිදුකිරීම
11	ජාත්‍යන්තර Gavel සංගම් තරඟ පැවැත්වීම
12	ජාත්‍යන්තර Gavel ඒකාබද්ධ රැස්වීම්
13	Gavel සම්මන්ත්‍රණය 2022
14	Gavelliers ගෝලීය ශ්‍රුතා තරඟයට සහභාගීවීම

රොටරැක්ට් සමාජය (ජනවාරි - දෙසැම්බර් 2022)	
1	ජනවාරි - සෙන්චරි හිටර්ස් - කණ්ඩායම් 24 කින් සමන්විත රොටරැක්ට් ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම
2	ජනවාරි - Know Your Way - ඔබේ වෘත්තීය මාර්ගය තෝරා ගැනීම පිළිබඳ මාර්ගගත දැනුම බෙදාගැනීමේ සැසියක පැවැත්වීම
3	පෙබරවාරි - සෙනෙහස - මොරටුව තෙරේසා මව්තුමියට ඖෂධ සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම
4	මාර්තු - හරිත උරුමය - රොටරි මිලියනයක ගස් ව්‍යාපෘතියට අනුග්‍රාහකයාගෙන් රුපියල් 10,000 ක පරිත්‍යාගයක් සිදුකිරීම
5	මැයි 2022 - තිරසාර සමුළුව - රොටරැක්ටර්වරුන් සඳහා අනාගතයේ දී තිරසාරභාවය පිළිබඳ සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා වෙබිනාර් මාලාවක් සහ වැඩමුළුමාලාවක් සිදු කිරීම. මෙය දිස්ත්‍රික්ක මූලපිරීමකි.
6	ජූලි - නව සාමාජිකයින් සඳහා Induction & Orientation වැඩසටහන පැවැත්වීම
7	අගෝස්තු/සැප්තැම්බර් - සිහින දකින සිනාවන් - ප්‍රජා සේවා ව්‍යාපෘතිය - සුරස ළමා නිවාසයේ සිටින විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සත්වෝද්‍යානයට රැගෙන ගොස් දිනයක් ගතකරන ලදී.
8	ඔක්තෝබර් - ව්‍යාපෘති සබැඳිය - භාෂා බාධාවන්ගේ පරතරය පියවා ගැනීම සඳහා දැනුවත් කිරීමේ සැසියක් පැවැත්වීම.
9	නොවැම්බර් - LinkedIn සමඟ සම්බන්ධ වීම - වෘත්තීය සංවර්ධන වැඩසටහන
10	නොවැම්බර් - අපි අපේ වෙරළ පිරිසිදු කරමු - වෙරළ පිරිසිදු කිරීමේ පාරිසරික සේවා වැඩසටහන
11	නොවැම්බර් - මිත්‍රශීලී ක්‍රිකට් තරඟාවලියක් සමඟ NIBM Rotracters එකට එකතු වන්න වැඩසටහන
12	නොවැම්බර් - අනුග්‍රහය ලබාගන්න - පුද්ගලික මූල්‍ය කළමනාකරණය සහ අයවැය කළමනාකරණ සැසිය
13	දෙසැම්බර් - සතුටේ බැල්මක් - ප්‍රජා සේවය - පානදුර ආලෝක වැඩිහිටි නිවාසයේ ශ්‍රමදාන උත්සවය

ශිෂ්‍ය සම්බන්ධතා සහ ක්‍රියාකාරකම්

	AISEC NIBM ශිෂ්‍ය පරිච්ඡේදය (ජනවාරි - දෙසැම්බර් 2022)
1	ජනවාරි - බ්ලියන්ස් 2022 - සාමාජිකත්වය අගය කිරීම – ආයතනයේ වාර්ෂික ප්‍රදානය කිරීමේ උත්සවය. AIESEC NIBM
2	ජනවාරි - සාමාජික නියුක්ත වීමේ මාසික ආයතන රැස්වීම - ආරම්භක කණ්ඩායම් රැස්වීම පැවැත්වීම
3	පෙබරවාරි - ගිම්හාන ප්‍රේරණය - සාමාජිකත්වය සම්බන්ධ කිරීම සහ සවිබල ගැන්වීම
4	පෙබරවාරි - ඉදිරිපස කාර්යාල ක්‍රියාකාරී හමුවීම් - සෑම AIESEC කාර්යයක් සඳහාම සාමාජිකයන් අතර බැඳීම ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාකාරී හමුවීම්
5	මාර්තු - IGM රැස්වීම් - AIESEC පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා සාමාජිකයින්ගේ කණ්ඩායම් රැස්වීම
6	අප්‍රේල් - INVICTA – AIESEC විසින් සපයන ලබන සංස්කෘතික හරහා අවස්ථා ගවේෂණය කිරීම
7	අප්‍රේල් – අවුරුදු IGM – ආරම්භක කණ්ඩායම් රැස්වීම - සාමාජික සහභාගිත්වය ලබාගැනීම
8	මැයි - ආරම්භක කණ්ඩායම් රැස්වීම - සාමාජිකත්වය සම්බන්ධ කර ගැනීම
9	ජූනි - SkillUP 2022 - නායකත්ව සංවර්ධන සම්මන්ත්‍රණයක් (දවස පුරා) පැවැත්වීම
10	ජූනි - ආරම්භක මාසික රැස්වීම - සාමාජිකයින් සම්බන්ධ කරවීම
11	ජූලි - IGM - සාමාජික නියුක්ත වීම් වැඩසටහන
12	අගෝස්තු - IGM - සාමාජික බැඳීම
13	සැප්තැම්බර් – Winter Induction – සාමාජිකයන් බඳවා ගැනීමේ වැඩසටහන
14	සැප්තැම්බර් – Ignite – නායකත්ව සංවර්ධන සමුළුව
15	සැප්තැම්බර් – Futsal තරඟාවලිය
16	ඔක්තෝබර් – IGM – සාමාජිකයින් බඳවාගැනීම
17	නොවැම්බර් – Career Vista - සියලුම NIBM ශාඛාවන් සඳහා ගෝලීය කුසලතා දැනුම්දීම සහ AIESEC ප්‍රවර්ධනය සිදුකිරීම
18	නොවැම්බර් – IGM – සාමාජික බැඳීම
19	දෙසැම්බර් – වෘත්තීය විස්ටා - වෘත්තීය සංවර්ධන වැඩසටහන මාර්ගගතව සිදුකිරීම

	NIBM IEEE ශිෂ්‍ය ශාඛාව (ජනවාරි-දෙසැම්බර් 2022)
1	ජනවාරි – සාමාජික ගිවිසුම්ගත වීම - මාසික රැස්වීම සහ වර්ෂය සැලසුම් කිරීම
2	පෙබරවාරි – IEEE තීක්ෂණ බුද්ධිය 2022 - IEEE සමඟින් ඔබේ සිහින හබායෑම සහ අත්පත්කරගැනීම සම්මන්ත්‍රණය සහ සාකච්ඡා කිරීම
3	මාර්තු - IEEE දැනුවත් කිරීම - ශ්‍රී ලංකා අංශයේ සභාපති සහ IEEE කලාප 13 අධ්‍යක්ෂ හමුවීම - දැනුම බෙදාගැනීමේ සැසිය
4	IEEE ශ්‍රී ලංකා අංශයෙන් පවත්වනු ලබන අප්‍රේල් / මැයි පුහුණුවීම්
5	ජූනි – වාර්ෂික මහා සභා රැස්වීම සහ සාමාජික බැඳීම
6	ජූලි – සාමාජිකයින් සම්බන්ධ කරගැනීම සහ මාසික එක්කොම් රැස්වීම පැවැත්වීම
7	සැප් - IEEE ශ්‍රී ලංකා අංශයේ සම්මන්ත්‍රණ සහභාගිත්වය
8	ඔක් - IEEE අංශය සමඟ එක්ව IEEE දිනය සැමරීම
9	නොවැම්බර් -2023 දී හැකතෝන් වැඩසටහනක් සැලසුම් කිරීම සඳහා රැස්වීම
10	කලාපයේ ශ්‍රී ලංකා අංශය සහ IEEE ජාත්‍යන්තර ක්‍රියාකාරකම් සිදුකිරීම

NIBM LEO සමාජය (ජනවාරි - දෙසැම්බර් 2022)	
1	ජනවාරි / පෙබරවාරි - දැනුමට සවියක් - අඩු වරප්‍රසාදලත් පාසල් දරුවන් සඳහා පොත් පරිත්‍යාග වැඩසටහනක් සිදුකිරීම
2	මාර්තු – සමුදු ලෝකය සුරකින්න - බේබි - කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතිය
3	අප්‍රේල් – Hungry Paws - කොළඹ විදිවල අයාලේ යන සතුන්ට ආහාර සැපයීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම
4	මැයි – අලුත් ඉස්කෝලේ - අවිස්සාවේල්ල ග්‍රාමීය පාසලක් ප්‍රතිසංස්කරණය කිරීම
5	මැයි – වැළකී සිටීම.22 - හානිකර ඇබ්බැහි වීම වැළැක්වීමේ අරමුණ ඇතිව මාර්ගගත වැඩමුළුවක් පැවැතිවීම
6	ජූනි – අම්මා - කාසල් රෝහලේ ගැබිණි මව්වරුන්ට කිරි පැකට් බෙදා දීම
7	ජූලි – ආශිර්වාද පූජා - ආගමික සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා පවත්වන ලද ආශිර්වාද වැඩසටහන
8	අගෝස්තු – Unstoppable - පළමු නිල NIBM ලියෝ සඟරාව නිකුත් කිරීම
9	අගෝස්තු – Cresendo - නව සාමාජිකයින් ඇතුළත් කිරීම සහ ක්ලබ් ස්ථාපනය කිරීම
10	අගෝස්තු – ප්ලේටෝරා පුහුණු වැඩසටහන.22 - තරුණ සවිබල ගැන්වීමේ නායකත්ව වැඩසටහන
11	සැප්තැම්බර් – Unstoppable 2 වන සංස්කරණය නිල ආරම්භ කිරීම
12	සැප්තැම්බර් – රුක් රෝපණ අභියෝගය වැඩසටහන
13	සැප්තැම්බර් – Exco දිශානතිය - සිංහ සාමාජිකයන්ගේ අභිවෘද්ධිය
14	ඔක්තෝබර් – කුසගින්න පෝෂණය කිරීම - අවශ්‍යතා ඇති පුද්ගලයින්ට ආහාර පාර්සල් බෙදා හැරීම
15	ඔක්තෝබර් – Unstoppable 3 වන සංස්කරණය නිල සඟරා නිකුත් කිරීම
16	නොවැම්බර් – කුසගින්න - අයාලේ යන බල්ලන්ට ආහාර පිරිනැමීම
17	නොවැම්බර් – අත්වලක් අදියර 1 - මාවතගම කණිෂ්ඨ විද්‍යාලයේ සිසුන්ගේ නායකත්ව කුසලතා වර්ධනය කිරීමේ අභිප්‍රේරණ වැඩසටහන
18	නොවැම්බර් – Unstoppable 4 වන සංස්කරණය නිල සඟරා නිකුත් කිරීම
19	දෙසැම්බර් – කුසගින්න එපා - දිවා ආහාරය අවශ්‍යතා ඇති පුද්ගලයින්ට ආහාර පිරිනැමීම
20	දෙසැම්බර් – අත්වැලක් අදියර 1 - හෙන්රි ඕල්කට් විද්‍යාලයේ සිසුන්ගේ නායකත්ව කුසලතා වර්ධනය කිරීමේ අභිප්‍රේරණ වැඩසටහන

NIBM ආකෘතිය UN පරිච්ඡේදය (ජූලි -දෙසැම්බර් 2022)	
1	පෙබරවාරි - NIBM දෙවන MUN ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - exco සමඟ සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම
2	මාර්තු - MUN ප්‍රශ්නාවලිය - එක්සත් ජාතීන් සහ SDG ඉලක්ක සම්බන්ධව සිදුකිරීම
3	අප්‍රේල් - MUN නියෝජිතයෙකු වන්නේ ඇයි - මූලික සැසිය පැවැත්වීම
4	මැයි - ප්‍රශ්න විචාරාත්මක හෝරාව - MUN ක්‍රියාපටිපාටිය පිළිබඳ සාමාජිකයන් දැනුවත් කිරීම සහ යාවත්කාලීන කිරීම
5	ජූලි - 2022/23 සඳහා නව MUN කණ්ඩායම පිහිටුවීම
6	අගෝස්තු - NIBM - UNICEF තරුණ උපදේශකයින්ගේ උත්සවය - UNICEF කලාපීය අධ්‍යක්ෂ සංචාරය
7	අගෝස්තු / සැප්තැම්බර් - සම්මන්ත්‍රණ පුහුණුව - MUN ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සූදානම් කිරීමේ වැඩමුළුව
8	ඔක් – දේශගුණික ක්‍රියාකාරිශූරයන් – UNICEF පුහුණු වැඩසටහන
9	ඔක් – වාර්තාකරුවන්ගේ වැඩමුළුව සහ සහභාගීත්වය ක්‍රියාකාරකම්
10	නොවැම්බර් – ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පැමිණීම - ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා යුනිසෙෆ් තරුණ සහභාගීත්වය සම්බන්ධ පාර්ලිමේන්තු රැස්වීම සිදුකිරීම
11	නොවැම්බර් – MUN ජාත්‍යන්තර සමුළුව - ජාත්‍යන්තර නියෝජිත සහභාගීත්වය සහිත සමුළුව සහ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන කථානායක සහභාගීත්වය සිදුකිරීම
12	දෙසැම්බර් – SLYCAN යෞවනය විශ්වාස කරන්න Pre-Cop 27 - දේශගුණික විපර්යාස පිළිබඳ තරුණ සංසදය සහ ක්‍රුද්ව යෞවන තනතුර සංවාදය

ශිෂ්‍ය සම්බන්ධතා සහ ක්‍රියාකාරකම්

	2022 වාර්ෂික ශිෂ්‍ය නියැලීම්
1	ජනවාරි – The CEO Global - ව්‍යාපාර ආකෘති ගැටළු පරිවර්තනය කිරීම 1 - CEO ප්‍රකාශ බෙදාහැරීම සහ වීඩියෝ පටිගත කිරීම් සිදුකිරීම
2	පෙබරවාරි – The CEO Global – ව්‍යාපාර ආකෘති ගැටළු පරිවර්තනය කිරීම 2 - සැලසුම් කිරීමේ අදියර
3	පෙබරවාරි – ඔස්ට්‍රේලියානු දිනය - සිසුන් 250කගේ සහභාගිත්වයෙන් කොළඹ හිල්ටන්හිදී බඳවා ගැනීමේ ප්‍රගති වැඩසටහන පැවැත්වීම
4	මාර්තු – ආදි ශිෂ්‍ය වෘත්තීය උපදේශන ප්‍රකාශන පටිගත කිරීම්
5	මාර්තු – NIBM වෘත්තීය ප්‍රදර්ශනය - සියලුම පීඨ සඳහා පැවැත්වීම
6	අප්‍රේල් – කෝණ මංගල්‍යය - 2023 අප්‍රේල් 28 දින - ශිෂ්‍ය සහභාගිත්වය 700
7	මැයි – වෙසක් උත්සවය - ඩිජිටල් සහ භෞතික වෙසක් පහන් කූඩු තරඟය
8	ජූනි – පොසොන් උත්සවය - දන්සල පැවැත්වීම හා භක්ති ගී සහ ධර්ම දේශනාව
9	ජූලි – විශ්වවිද්‍යාල සමඟ නෙට්බෝල්, ක්‍රිකට්, පාපන්දු ක්‍රීඩා තරඟාවලි
10	ජූලි – Eid උත්සව සැමරුම් - සිසුන් 500 සහභාගිත්වයෙන් සිදු කිරීම
11	ඔක්තෝබර් – Deepavali දින සිසුන් 500 සහභාගිත්වයෙන් දීපවාලි සැමරුම
12	දෙසැම්බර් – චැම්පියන්ස් ලීග් - ක්‍රිකට් තරඟාවලිය - ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල වලට ආරාධනා කිරීම
13	දෙසැම්බර් – නත්තල් උත්සවය - Frozen Fest උත්සවය - සියලුම පීඨවල සිසුන් සහභාගිත්වයෙන් සිදුකිරීම

	NIBM - එක්සත් ජාතීන්ගේ හවුල්කාරිත්වය ස්ථාපිත කිරීම
1	UNDP – නායකත්ව වැඩසටහන සහ අනෙකුත් UNDP නායකත්ව ක්‍රියාකාරකම් සහ සමාජ ව්‍යවසායකත්ව වැඩසටහන පැවැත්වීම
2	UNICEF – වාර්ෂික UNICEF ව්‍යාපෘති සිදුකිරීම - සිසුන්ගේ නායකත්ව සංවර්ධනය සහ SDGs සමඟ කටයුතු කිරීම පිළිබඳ දැනුවත් කිරීම
3	UNV – එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා ව්‍යාපෘති / ජාතික තරුණ සේවා සභා ව්‍යාපෘති - UN ස්වේච්ඡා සේවයට NIBM තරුණයන් සවිබලගැන්වීම වැඩසටහන පැවැත්වීම
4	එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා ප්‍රධාන කාර්යාලය - NIBM ආදර්ශ එක්සත් ජාතීන්ගේ සමුළුව - සමුළුව සඳහා කථිකයන්ගේ සහභාගී කරවීම

	2023 සඳහා සැලසුම්
A	ශිෂ්‍ය ව්‍යාපෘති හරහා ආයෝජකයින් සම්බන්ධ කරගනිමින් සහ UNDP සමඟ හවුල්කාරිත්වයෙන් CREST නවෝත්පාදන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම
B	NIBM හි සියළුම ශිෂ්‍ය ප්‍රජාව සමඟ සහයෝගයෙන් වාර්ෂික විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් සිදුකිරීම සහ වර්ධනය කිරීම
C	වාර්ෂික ක්‍රියාකාරකම් සංවිධානය කිරීම - ඔන්ලයින් සහ නොබැඳිව සියළුම සමාජ සංගම් සහ සමිති සම්බන්ධ කරගැනීම සහ අනෙකුත් විශ්වවිද්‍යාල සමඟ හවුල් වී සිදුකිරීම
D	NIBM හි වඩාත් ජනප්‍රිය ක්‍රීඩා 6ක් සඳහා සිසුන්ගේ සහභාගිත්වය සහ නියැලීම වැඩි දියුණු කිරීම
E	අපගේ සියළුම පීඨවල සිසුන්ට UNDP/UNICEF/UNV වාර්ෂික සිදුවීම්වල නිරත වීමට අවස්ථාව ලබා දී ඇත.
F	The CEO Global - ව්‍යාපාර ආකෘති පරිවර්තන වාර්ෂික සඟරාව - 3 වෙනි එළිදැක්වීම

තරඟකාරී වෙළඳපොළට මුහුණ දීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේද

දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ පාඨමාලා සඳහා සුදුසුකම් හා කුසලතාවන්ගෙන් යුත් වෘත්තිකයින්, උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන්, බිහිකිරීම අරමුණු කරගෙන ආයතනයේ පාඨමාලාවන් විධිමත්ව හා සංවිධානාත්මකව පැවැත්වීමේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා 2022 වර්ෂයේදී අනුගමනය කරන ලද ක්‍රමවේදයන් පහත දැක්වේ.

	2022 වාර්ෂික ශිෂ්‍ය නියැලීම්
1	ආයතනය පෝය දින හැර සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල (පෙ.ව. 8.30 සිට ප.ව.4.30 දක්වා) සියළුම සේවා සැපයීම සඳහා විවෘතව තැබීම.
2	පාඨමාලා සඳහා අයදුම්කරුවන් දුරකථනයෙන් සහ අන්තර්ජාලය මඟින් මාර්ගගත ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු යොදා තිබීම.
3	අපේක්ෂකයින්ට අදාළ තොරතුරු ලබාගෙන ආයතනයේ වෙබ් අඩවිය මඟින් ලියාපදිංචි විය හැකිය වෙබ් අඩවිය www.nibm.lk.
4	පාඨමාලා ගාස්තු මුදලින්, චෙක්පත් මඟින් මෙන්ම ණයපත් වලින් ද මාර්ගගතව ගෙවීමට පහසුකම් සලසා ඇත.
5	අධ්‍යයන වර්ෂය ආරම්භ වීමට පෙර පාඨමාලා සැලසුම්කර ඇති අතර එමඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ට තම සේවකයින් සඳහා සුදුසු පුහුණු පාඨමාලා කල්තියාම තෝරා ගත හැකිය.
6	ආයතනයේ කාර්යභාරය, එහි වැඩසටහන් හා සේවාවන්, ලිපි, මුද්‍රිත ද්‍රව්‍ය හා අන්තර්ජාලය හරහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ලබා දෙනු ඇත.
7	වැඩමුළුවේ කාලය දින 7ට අඩු නම් වැඩමුළුව අවසන් වූ දිනයේම සහතිකපත්‍ර නිකුත් කිරීම.
8	අනෙකුත් පාඨමාලා සම්බන්ධයෙන් සහතිකපත්‍ර පාඨමාලාව අවසන් වූ දින සිට මාසයක් ඇතුළත නිකුත් කෙරේ.
9	ප්‍රදර්ශන, වැඩමුළු, පුවත්පත් දැන්වීම්, විවිධ සමාජ මාධ්‍යන් ඔස්සේ සහ රූපවාහිනී දැන්වීම් තුළින් ආයතනයේ සේවාවන් ආකර්ෂණීය ලෙස ජනතාවගේ අවධානයට යොමු කිරීම.
10	කොළඹ පමණක් සීමා වී පැවති පාඨමාලා මහනුවර, කුරුණෑගල, ගාල්ල සහ මාතර යන ප්‍රදේශවලට ද ව්‍යාප්ත කර ඇත.
11	උපදේශනය, ඵලදායිතාව සහ කළමනාකරණ සංවර්ධන සේවාවන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල අවශ්‍යතාවන්ට අනුගතව සකස් කර ඇත.
12	ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සහ උපාධි ප්‍රදානෝත්සවය වාර්ෂිකව චාරිත්‍රානුකූලව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීම.


DESIGN YOUR
GLOBAL LIFE
with
NIBM
POWERING
GREAT
MINDS

වැදගත් සිදුවීම්

2022 ජනවාරි 01

වසරේ හොඳම සමස්ත කාර්යසාධනය සඳහා සම්මාන පිරිනැමීම


2020 වසරේදී ආයතනයේ සියළුම පීඨ අතරින් සමස්ත කාර්යසාධනය වෙනුවෙන් NIBM හි පරිගණක පාසල අබණ්ඩව තෙවැනිවරටත් ජයග්‍රහණය කර ඇත. මේ සඳහා 2022 ජනවාරි 01 දින එම අංශය ඇගයීමට ලක්කරන ලද අතර ඉන් අනතුරුව අංශ ප්‍රධානී විසින් NIBM වෙනුවෙන් කරන ලද කැපවූ සේවාවන් සඳහා ඔවුන්ගේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ස්තූතිය පුද කරමින් ඇගයීමක් සිදු කරන ලදී.



2022 මාර්තු 02

ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය - 2022 Design පාඨමාලා සමාරම්භක උත්සවය

මැලේසියාවේ ලිමිකොක්වින්ග් නිර්මාණාත්මක තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන 2022 වසරේ අභ්‍යන්තර ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය සහ විලාසිතා නිර්මාණ අංශයේ BA (ගෞරව) උපාධි සමාරම්භක උත්සවය ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයේදී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතාගේ ගෞරවනීය පැමිණීමත් සමඟ ආරම්භකරන ලදී.



2022 පෙබරවාරි 02

ආචාර්ය. ඩී.එම්.ඒ. කුලසූරිය මහතා - අධ්‍යක්ෂ ජනරාල් NIBM විසින් සිදුකරනු ලබන සේවාවන් සඳහා UNV50 කන්ට්‍රි සම්මානයක් ලබා ගැනීම

ආචාර්ය ඩී. එම්. ඒ කුලසූරිය - තිරසාර සංවර්ධන ඉලක්ක 17 සහ නායකත්වයේ තරුණයින් සවිබල ගැන්වීම කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාව තුළ ස්වේච්ඡා සේවයේ කැපී පෙනෙන කාර්යයන් ඇගයීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) විසින් සිදු කරනු ලබන සේවාවන් සඳහා NIBM හි අධ්‍යක්ෂ ජනරාල් UNV50 කන්ට්‍රි සම්මානයක් ලබා ගන්නා ලදී. 2021 දෙසැම්බර් 7 වන දින පවත්වන ලද UN50 කන්ට්‍රි සම්මාන උළෙල එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයන්ගේ ස්වර්ණමය සංවත්සරය සනිටුහන් කරමින් ස්වේච්ඡා සේවය පිළිගෙන සමරනු ලැබීය.



2022 මාර්තු 15

මහනුවර නගර මධ්‍යයේ EDUFIRST ප්‍රදර්ශනය පැවැත්වීම

2022 මාර්තු 12 සහ 13 දිනවල පැවති කැන්ඩි සිටි සෙන්ටර් ප්‍රදර්ශනයේ NIBM මහනුවර මධ්‍යස්ථානය ප්‍රදර්ශන කුටියේ සම්පූර්ණ ආයතනයෙහිම ආවරණය කරන ලදී. වර්තමානයේ නිවැරදි තේරීමක් කරමින් අනාගත නායකයින් බිහිකරගැනීමට තරුණ සිත් පෝෂණය කිරීම මෙහිදී අපට හැකි විය.



2022 පෙබරවාරි 08

NIBM GLOBaL CAREERS - ඕස්ට්‍රේලියාවේ දිනය 2022

මූල්‍ය පහසුකම් ඇති කිරීම සඳහා පිරිවැය ඵලදායී විසඳුම් ලබා දෙමින් ශ්‍රී ලංකාව සිය දේශීය සිසුන්ට මෙන්ම ව්‍යාත්තිකයන්ට ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපන ආයතන වන ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සහ ඩීකින් විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ පුරෝගාමී උසස් අධ්‍යාපන ආයතනයක් වන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය සමඟ සම්බන්ධ වී මෙරට ජනතාවට ඔස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට මාර්ගයක් සකසන ලදී. එමඟින් ඔවුන්ට ගෝලීය පිළිගැනීමක් ලබා ගැනීමට සහ ඔවුන්ගේ ජාත්‍යන්තර අධ්‍යයන සුදුසුකම් වර්ධනය කිරීමට හැකියාව ලැබේ.

ඕස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයක් විසින් පිරිනමනු ලබන ඕනෑම තෝරාගත් වැඩසටහනක මූල්‍ය අවශ්‍යතාවයෙන් නිශ්චිත ප්‍රතිශතයක් සපුරාලීමට හැකි වන පරිදි NIBM හි ආරම්භක වසර සම්පූර්ණ කළ හැකි බැවින් මෙම හවුල්කාරිත්වය මඟින් සිසුන්ට වසරකට ආසන්න වශයෙන් මිලියන 8 ක් පමණ ඉතිරි කරගැනීමට හැකියාව ලැබේ. 2022 පෙබරවාරි 26 වන දින ඕස්ට්‍රේලියානු නියෝජිතයින් සමඟ කොළඹ හිල්ටන් හිදී උත්සවයක් පවත්වන ලද අතර එමඟින් සිසුන්ට ඕස්ට්‍රේලියාවට යන අධ්‍යාපන මාර්ගය පිළිබඳ වැඩි විස්තර ලබා ගැනීමට හැකි විය.



2022 මාර්තු15

ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයේ මූර්ති කුසලතා වැඩි දියුණු කිරීම

NIBM හි නිර්මාණාත්මක සහ නවෝත්පාදන අංශය වන ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය නිර්මාණ සිසුන්ගේ මූර්ති කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. සිසුන්ගේ අවසන් හොඳම නිර්මාණ ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයේ ගැලරියේ ප්‍රදර්ශනය සඳහා තබනු ලැබේ.



වැදගත් සිදුවීම්

2022 මාර්තු 24

උපාධි වැඩසටහන් ආරම්භ කිරීම - 2022.


පරිගණක හා ඉංජිනේරු පාසලේ උපාධි වැඩසටහන් සමාරම්භක උත්සවය 2022/03/24 දින ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ ශ්‍රවනාගාරයේදී පැවැත්විණි. ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය, ඩොයිෂ් බැංකුවේ තොරතුරු තාක්ෂණ හා ශාඛා මෙහෙයුම් ප්‍රධානී ප්‍රභාත් වික්‍රමරත්න, අධ්‍යක්ෂවරු, අංශ ප්‍රධානීන් සහ පීඨ සාමාජිකයින්ගේ ගෞරවනීය සහභාගිත්වයෙන් මෙම උත්සවය පැවැත්විණි.



2022 මාර්තු 25

අනාගත මනස (FUTURE MIND) අධ්‍යාපන ප්‍රදර්ශනය





2022 මාර්තු 24

BSC (ගෞරව) ග්ලෝබල් ලොජිස්ටික්ස් උපාධි පාඨමාලාවේ දෙවන වසරේ සිසුන් හේලිස් ඇඩ්වාන්ටිස් හි 3PL ප්ලස්, ලොජිස්ටික්ස් සිට, කොටුගොඩ, ජා ඇල සියළුම මෙහෙයුම් නැරඹීම.

BSc (Hons) Global Logistics උපාධි පාඨමාලාවේ දෙවන වසරේ සිසුන් 2022 මාර්තු 23 වන දින හේලිස් ඇඩ්වාන්ටිස් 3PL ප්ලස්, ලොජිස්ටික් සිටි, කොටුගොඩ, ජා ඇල හි සියලුම මෙහෙයුම් නැරඹීම සිදුකරන ලදී. ගබඩා කළමනාකරණය හි මොඩියුල අවශ්‍යතාවයේ කොටසක් ලෙස ආරක්ෂක ප්‍රොටෝකෝලවලට අනුකූලව කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව මෙම ක්ෂේත්‍ර චාරිකාවේදී සම්පූර්ණ පහසුකම් සහ ස්ථානය ගවේෂණය කිරීමට සිසුන්ට අවසර දෙන ලදී. පාඨමාලා අධ්‍යක්ෂ බුද්ධි තිලකරත්න මහතා විසින් මෙම ක්ෂේත්‍ර චාරිකාව සංවිධානය කරන ලදී. මෙම අවස්ථාව සම්බන්ධීකරණය කිරීම සම්බන්ධයෙන් අලෙවි සහ ව්‍යාපාර සංවර්ධන ප්‍රධානී රාජික සෙනෙවිරත්න මහතා සහ මානව සම්පත් කළමනාකරණයේ කනිෂ්ඨ විධායක ලක්මිණී ජයසේකර මහත්මියට විශේෂ ස්තුතිය පුදකර සිටිමු.



2022 මාර්තු 29

NIBM හි සිසුන් සඳහා වෘත්තීය අවස්ථා ලබා දීම සඳහා NIBM OREL IT (PVT) LTD සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරයි.

NIBM හි සිසුන් සඳහා වෘත්තීය අවස්ථා ලබා දීම සඳහා NIBM Orel IT (Pvt) Ltd සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරයි. ඔරෙල් තොරතුරු තාක්ෂණ (පුද්ගලික) සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය උපේන්ද්‍ර පීරිස් සහ ප්‍රධාන අලෙවි නිලධාරී කලින්ද වික්‍රමගේ යන මහත්වරුන් සමඟ ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය, NIBM අධ්‍යක්ෂ මණ්ඩල ශාලාවේදී අත්සන් කිරීම සිදු විය.



2022 මාර්තු 25

NIBM වෘත්තීය පොල 2022

"NIBM Career Fair 2022" අනාගත නායකයින් 300 කට වඩා වැඩි පිරිසකට වෘත්තීය අපේක්ෂාවන් ලබාගැනීමට වැඩිම සේවා යෝජකයින් සංඛ්‍යාවක් සහිතව 2022 මාර්තු 25 වන දින පවත්වන ලදී.



2022 මාර්තු 25

ENTRE 2022 - අනාගත ව්‍යාපාරික නායකයින් දිරිමත් කිරීම - HDBM 21.2 NIBM ව්‍යාපාරික පාසලේ පූර්ණ කාලීන සිසුන් සඳහා බාහිර දේශනමාලාව

බ්‍රිතාන්‍ය ආලේපන ප්‍රධාන විධායක නිලධාරී නිරෝෂා ජාගොඩආරච්චි මහත්මිය - විශිෂ්ට කාන්තා ව්‍යවසායක (මහාපරිමාණ කාණ්ඩයේ) සම්මානය සමඟින් පසුගියදා නිමාවට පත් වූ හොඳම 50% 2019 වෘත්තීය හා වෘත්තීය කාන්තා සම්මාන උළෙලේදී තරුණ තරුණියන් ඩිජිටල් තාක්ෂණයේ මීළඟ පරම්පරාව බවට පත් කිරීමට සවිබල ගන්වමින් සාර්ථකව අවසන් කරන ලදී.



2022 මාර්තු 31


ඩිප්ලෝමා සමාරම්භක උත්සවය 2022 - NIBM මහනුවර මධ්‍යස්ථානය

NIBM මහනුවර මධ්‍යස්ථානයේ තවත් නායක පරපුරක් බිහි කිරීම. NIBM හි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතාගේ ගෞරවනීය සහභාගිත්වයෙන් 2022 මාර්තු 29 වන දින මහනුවර මහවැලි රීච් හෝටලයේදී ඩිප්ලෝමා සමාරම්භක උත්සවය සාර්ථකව නිම කරන ලදී.



2022 අප්‍රේල් 01

ඉන්ටර්නෙට් ඔෆ් තින්ග්ස් (IOT) වැඩමුළුව 2022



2022 මාර්තු 29

ඔස්ට්‍රලියාවේ ඩිකින් විශ්වවිද්‍යාලයේ නියෝජිතයින් ඩිකින් විශ්වවිද්‍යාල හවුල්කාරිත්වය ආයතනයේ අනෙකුත් පීඨ සඳහා සංවර්ධනය කිරීමට සාකච්ඡාවක් නිරත වීම සඳහා NIBM වෙත පැමිණීම.


මහාචාර්ය කොලින් හිගින්ස් (ආශ්‍රිත පීඨාධිපති, ජාත්‍යන්තර සහ හවුල්කාරිත්වය, ව්‍යාපාර සහ නීති පීඨය - ඩිකින් විශ්ව විද්‍යාලය) සහ බ්‍ර. ගන්. මෙනවිය (ජාත්‍යන්තර කළමණාකරු - ඩිකින් ඉන්ටර්නැෂනල්) සමඟ සන්දි සෙනෙවිරත්න මෙනවිය (ජ්‍යෙෂ්ඨ හවුල්කාරිත්ව සම්බන්ධීකාරක - ඩිකින් ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකා කාර්යාලය) ඩිකින් විශ්වවිද්‍යාල හවුල්කාරිත්වය අනෙකුත් පීඨ දක්වා වර්ධනය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක නිරත වීමට NIBM ආයතනයට පැමිණෙන ලදී.



2022 අප්‍රේල් 07


ස්මාර්ට් ලෝකයක ව්‍යාපාරික විශ්ලේෂණ පිළිබඳ වැඩමුළුව

මහාචාර්ය කොලින් හිගින්ස් සහ බ්‍ර. ගුන්. මහත්මිය අපගේ ඩිකින් විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා ස්මාර්ට් ලෝකයේ ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.



2022 මාර්තු 29

සමාරම්භක උත්සවය 2022 - ව්‍යාපාර පාසල



2022 අප්‍රේල් 08

සමාරම්භක උත්සවය 2022 - ඵලදායිතා සහ තත්ත්ව මධ්‍යස්ථානය



වැදගත් සිදුවීම්

2022 අප්‍රේල් 12

ETHIQUES22 - HDBM 21.2 පූර්ණකාලීන


කණ්ඩායමේ ආරාධිත දේශනමාලාවේ අවසන් ක්‍රියාකාරකම අප්‍රේල් 4 වෙනිදා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ (පුද්ගලික) සහකාර උප සභාපති අසිත පින්නදූව මහතා සමඟ සාර්ථකව අවසන් කරන ලදී.

මෙහිදී තාරුණ්‍යයේ මනස සවිබල ගන්වන ආචාරධර්ම සහ වෘත්තීයභාවය යන කාලෝචිත මාතෘකාවක් සමගින් ශ්‍රේෂ්ඨ තීක්ෂණ බුද්ධිය සහ අත්දැකීම් ප්‍රේක්ෂකයින් සමඟ බෙදා ගන්නා ලදී.




2022 අප්‍රේල් 18

උපාධි වැඩසටහන් ආරම්භ කිරීම 2022 - මාතර සහ ගාල්ල මධ්‍යස්ථාන



2022 අප්‍රේල් 19

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ 2022 සිංහල හා දෙමළ අලුත් අවුරුද්දෙන් පසු පලමුවන දින වැඩකටයුතු ආරම්භ කිරීම.



2022 අප්‍රේල් 23

ජාත්‍යන්තර ඉංග්‍රීසි දිනය සැමරීම - 2022

ජාත්‍යන්තර ඉංග්‍රීසි දිනය සෑම වසරකම අප්‍රේල් 23 වන දින සමරනු ලබන අතර මෙම දිනය බොහෝ හේතු නිසා වැදගත් වේ. ඉංග්‍රීසි සාහිත්‍යයේ පියා වන විලියම් ෂේක්ස්පියර්ගේ උපන්දිනය සහ මියගිය දිනය ප්‍රධාන වශයෙන් අප්‍රේල් 23 වැනිදාය. එපමණක් නොව, අද සන්දර්භය තුළ Lingua Franca ලෙස ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම මෙම දිනය සංකේතාත්මකව අපට මතක් කර දෙයි. එරන්දි හරිස්චන්ද්‍ර මෙනවියගේ මඟපෙන්වීම ඇතිව භාෂා පාසලේ සිසු සිසුවියන් විසින් මෙම සුවිශේෂී දිනය සමරනු ලැබූ අතර සිසුන් විසින් ඉංග්‍රීසි භාෂාවට අදාළ කුසලතා ප්‍රදර්ශනය කරන ඉංග්‍රීසි දිනයක් සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට විනෝදාස්වාදය, භාෂා ක්‍රීඩා, කතා සහ ක්‍රියාකාරකම් ඇතුළත් වූ අතර සිසුන්ගේ සැඟවුණු කුසලතා ප්‍රදර්ශනය කරන අතරම විනෝදාස්වාදය සමඟ ඉගෙනීමට වේදිකාවක් සම්පාදනය කරන ලදී. 2022 ජාත්‍යන්තර ඉංග්‍රීසි දින සැමරුම් තේමාව ද මනසේ: "බහුභාෂා ඉගෙනීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම: අභියෝග සහ අවස්ථා" තබා ගනිමින් මෙම උත්සවය සංවිධානය කරන ලදී.



2022 අප්‍රේල් 25

OBL දැනුවත් කිරීමේ වැඩසටහන - HDBM 22.1

ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා 22.1 FT කාණ්ඩායමේ OBL සමාරම්භක උත්සවය 2022 අප්‍රේල් 25 වන දින NIBM ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. OBL ඇගයීම් ක්‍රමය යනු සිසුන්ගේ කාර්යසාධනය තක්සේරු කිරීම පමණක් නොව සිසුන්ගේ වෘත්තීය ආශ්‍රිත නිපුණතා වර්ධනය කිරීම සඳහා යාන්ත්‍රණයක් ලෙස ස්වීඩනය, ෆින්ලන්තය ඇතුළු ලෝකයේ ප්‍රමුඛ රටවල් බොහොමයක් භාවිතා කරන නව ශිෂ්‍ය ඉගෙනුම් ඇගයීම් ක්‍රමයකි.



2022 අප්‍රේල් 27

සැපයුම් දාම කළමනාකරණයේ වෘත්තීන් - සම්මන්ත්‍රණය

සැපයුම් දාම කළමනාකරණයේ වෘත්තීන් පිළිබඳ සම්මන්ත්‍රණයක් ලොජිස්ටික් සහ ප්‍රවාහනය (WILAT) පිළිබඳ කාන්තා ගෝලීය සභාපතිනි ගයනි ද අල්විස් මහත්මිය සමඟ NIBM හිදී සාර්ථකව පවත්වන ලදී.



2022 අප්‍රේල් 28

NIBM කෝන මංගල්‍යය 2022



2022 අප්‍රේල් 29

NIC සූර්යාභිෂේක මංගල්‍යය 2022



2022 මැයි 02

KIC සූර්ය මංගල්‍යය 2022



2022 මැයි 04

NIBM NTECHLAB සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම

AI පදනම් කරගත් මුහුණ හඳුනාගැනීම තුළින් පැමිණීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා NIBM NTECHLAB සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කළේය.



2022 මැයි 05

අනාගත ව්‍යාපාර සඳහා ජාතික මධ්‍යස්ථානය - විවෘත කිරීම

NIBM සිය නව පරිශ්‍රය රාජගිරියේ ව්‍යාපාරික පාසල සඳහා සැහැල්ලු ආකාරයෙන් ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම. එය සොභාග්‍යමත් අනාගතයක් සඳහා ඔවුන්ගේ දැනුම සහ කුසලතා ඉහළ නැංවීම සඳහා කුඩා ව්‍යවසායකයින් සහ ව්‍යාපාරික නායකයින් සඳහා අධි-තාක්ෂණික ඉගෙනුම් අවකාශයකි.



2022 මැයි 16

වෙසක් දන්සල - NIBM මාතර මධ්‍යස්ථානය



2022 මැයි 18

ව්‍යාපාර පාසල - කුසලතා ප්‍රදර්ශනය 2022

NIBM විසින් සිසුන් සඳහා කුසලතා ප්‍රදර්ශනයක් පැවැත්විය, සිසුන්ගේ අද්විතීය කුසලතා ප්‍රේක්ෂකයින් ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව සලසා දීම සඳහා දක්ෂ සිසුන් පෝෂණය කිරීමට, සංවර්ධනය කිරීමට, උපදේශකයින්ට සහ ව්‍යවසායකත්ව සහ ජීවන කුසලතා තිරසාර ජීවනෝපාය මූලාශ්‍රයක් ලෙස නිර්මාණශීලිත්වය, නවෝත්පාදනය සහ නව නිපැයුම් පිළිබඳ ඉගැන්වීම සහ පහසුකම් සැලසීමෙන් ඔවුන් සවිබල ගැන්වීම පිළිබඳ උපදේශනයද මෙහිදී සිදුකරන ලදී.



2022 මැයි 20

NIBM වෙසක් උදානය 2022



2022 මැයි 28

KIC සමාරම්භය - BA(ගෞරව) කළමනාකරණය සහ නායකත්වය

NIBM හි මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය විසින් එක්සත් රාජධානියේ කොවෙන්ට්‍රි විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන BA (ගෞරව) කළමනාකරණ සහ නායකත්ව උපාධිය ආරම්භ කරන ලදී.



වැදගත් සිදුවීම්

2022 මැයි 29

NIC ආරම්භය - ව්‍යවහාරික මනෝ විද්‍යාව පිළිබඳ MSC උපාධිය

NIBM හි ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය 2022 මැයි 29 වන දින එක්සත් රාජධානියේ කොවෙන්ට්‍රි විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන ව්‍යවහාරික මනෝවිද්‍යාව පිළිබඳ පස්චාත් උපාධියෙහි පළමු කණ්ඩායම ආරම්භ කළ බව ප්‍රකාශ කිරීමට හැකිවීම අපි අතිශයින් ආඩම්බර වෙමුග NIBM ඉතිහාසයේ සුවිශේෂ සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි වී සිටින සිසුන්ට සහ මෙම කාර්යය පිටුපස සිටින සියළු දෙනාටම ආශිර්වාද කරන ලදි.



2022 ජූනි 01

NIBM හි ව්‍යාපාරික පාසල ඔවුන්ගේ සිසුන් සඳහා එහි දොරටු විවෘත කරන ලදී

NIBM හි ව්‍යාපාරික පාසල ඔවුන්ගේ ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කිරීම සඳහා නවීනතම යටිතල පහසුකම් වලින් සමන්විතව රාජගිරියේ නව ගොඩනැගිල්ලක් තුළ අපගේ සිසුන් සඳහා දොරටු විවෘත කළේය.



2022 ජූනි 05

NIC – Bsc (ගෞරව) මනෝවිද්‍යාව සහ උපදේශනය සමාරම්භක උත්සවය

NIBM හි ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය විසින් 2022 වසර සඳහා BSc (ගෞරව) මනෝවිද්‍යා සහ උපදේශන උපාධියේ දෙවන කණ්ඩායම ආරම්භ කරන ලදී. NIBM හි සිටින කාලය තුළ සිසුන්ට සාර්ථක උසස් අධ්‍යාපන ගමනක් සාර්ථකව නිම කිරීමට සියලු දෙනාටම ආශිර්වාද කරන ලදී.



2022 ජූනි 07

පරිසර දිනය පෝස්ටර් තරඟය



2022 ජූනි 13

NIBM ව්‍යාපාරික පාසල - පොසොන් දන්සල 2022



2022 ජූනි 13

ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය - පොසොන් දන්සල 2022



2022 ජූනි 13

NIBM කොළඹ ප්‍රධාන කාර්යාලය- පොසොන් දන්සල 2022



2022 ජූනි 13

NIBM ව්‍යාපාරික පාසල - පොසොන් දන්සල 2022



2022 ජූනි 15

NIBM මහනුවර මධ්‍යස්ථානය - පොසොන් දන්සල 2022



2022 ජූනි 30

NIBM | කොවෙන්ට්‍රි සම්මන්ත්‍රණය 2022



2022 ජූලි 04

NIBM ඉංග්‍රීසි භාෂාවේ ස්වභාවය



2022 ජූලි 06


NIBM - හවුල්කාරිත්වය දියත් කිරීමේ වැඩසටහන



2022 ජූලි 27

පරිගණක හා ඉංජිනේරු පාසැල - උපාධි 2 වැනි වසර සමාරම්භක උත්සවය 2022

NIBM හි පරිගණක හා ඉංජිනේරු විද්‍යාලය සිසුන් 100 කට අධික සංඛ්‍යාවක් සඳහා උසස් ජාතික ඩිප්ලෝමා වැඩසටහන් ආරම්භ කරන ලද්දේ උත්සවයේ ප්‍රධාන ආරාධිතයන් ලෙස ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය (NIBM හි අධ්‍යක්ෂ ජනරාල්) සහ ආචාර්ය ලලිත් වේරගොඩ (Sampath Bank PLC) හි සමූහ ප්‍රධාන මානව සම්පත් කාර්යාලය) සහභාගිත්වයෙනි.



2022 ජූලි 29

NIBM හජ් බසාර්-ඊද් සැමරුම්



2022 ජූලි 04

උපාධිය සඳහා පදනම - සමාරම්භක උත්සවය 2022



2022 අගෝස්තු 07

View 2022

2022 අගෝස්තු 7 වැනි ඉරිදා දින ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පෙළේ ව්‍යවසායකයින් 3 දෙනෙකු සමඟ ඔවුන්ගේ ඉගෙනුම් විෂය මාලාවේ කොටසක් ලෙස, සිදුවීම් කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍රයේ 21.2 කණ්ඩායමේ සිසුන් විසින් ව්‍යවසායකත්වය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට සම්පත් දායකයින් ලෙස සහභාගී වූ මාස්ටර් කුඹල්කරු අජිත් පෙරේරා, ධනංජය විජේසේකර සහ පූර්ණ රත්නායක යන මහත්වරුන්ගේ අදහස් වලින් පොහොසත් විය.



2022 අගෝස්තු 14

දත්ත විද්‍යාව පශ්චාත් උපාධිය සමාරම්භක උත්සවය

ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය එහි පළමු දත්ත විද්‍යාව පශ්චාත් උපාධි පාඨමාලාව 2022 අගෝස්තු 14 වැනි දින නිල වශයෙන් ආරම්භ කරන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය - NIBM හි අධ්‍යක්ෂ ජනරාල්, සහ ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, ආචාර්ය සමීර විජයසිරි, සහකාර අධ්‍යක්ෂ වැඩසටහන් ධම්මිකා දංගල්ල මිය, පාඨමාලා අධ්‍යක්ෂ දිලිප සමයවර්ධන, තුරෙයිරාසා බාලකුමාර් මහතා සහ සිසුන් සහභාගිත්වයෙන් සිදුකරන ලදී. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නවත් සුවිශේෂී අවස්ථාවකට පිවිසීමත් සමඟ NIBM ඉතිහාසයේ නවත් කඩඉමක් සනිටුහන් කළේය.



වැදගත් සිදුවීම්

2022 අගෝස්තු 16

NIBM 54 වැනි සංවත්සරය - ව්‍යාපාර පාසල

NIBM හි ව්‍යාපාරික පාසල, සියලුම සිසුන් සඳහා රෝපණය කළ හැකි පෑන් බෙදා දීමත් ඉතා තිරසාර ලෙස මෙම ඓතිහාසික අවස්ථාවට ප්‍රමුඛත්වය දෙමින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ 54 වසරක විශිෂ්ටත්වය සමරනු ලැබීය.



2022 අගෝස්තු 16

NIBM 54 වන සංවත්සරය - ප්‍රධාන කාර්යාලය

NIBM උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ 54 වසරක විශිෂ්ටත්වය සැමරුවේ එය ආයතනයේ ඉගෙන ගන්නන්ට සතුටුන් ඉගෙනගැනීමට අවස්ථාවන් ලබා දෙමින්ය. මෙම අවස්ථාවට ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතා පැමිණ සිටි අතර ඔහු නම සේවා කාලය තුළ NIBM විසින් අද දක්වා ඇති ඩිජිටල් පරිවර්තනය සමඟින් තම අත්දැකීම් බෙදාහදා ගත්තේය.



2022 සැප්තැම්බර් 06

OBL දැනුවත් කිරීමේ සැසිය - ව්‍යාපාර පාසල



2022 අගෝස්තු 26

යුනිසෙෆ් දකුණු ආසියාවේ කලාපීය අධ්‍යක්ෂ ශ්‍රී ලංකාවට පැමිණීම

යුනිසෙෆ් කලාපීය අධ්‍යක්ෂ ආචාර්ය ජෝර්ජ් ලැරියා - ඇඩ්ජේ ශ්‍රී ලංකාවට පැමිණ NIBM සිසුන් හමුවිය. යුනිසෙෆ් සංවිධානයේ දකුණු ආසියාවේ කලාපීය අධ්‍යක්ෂ ආචාර්ය ජෝර්ජ් ලැරියා-ඇඩ්ජේ මහත්මිය ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකාවේ සියලුම පළාත් නියෝජනය කරන NIBM සිසුන් හමු වී ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් මුහුණදෙන වත්මන් ගැටළු සහ වඩා යහපත් අනාගතයක් සඳහා ගත හැකි විසඳුම් සම්බන්ධයෙන් තීක්ෂණ බුද්ධිය සහිත තරුණ සංවාදයක් සිදුකරන ලදි.




2022 සැප්තැම්බර් 02

ටැලන්ට් ෂෝ - ADBM22.2 FT කණ්ඩායම



2022 ජූනි 13

NIBM කොළඹ ප්‍රධාන කාර්යාලය- පොසොන් දන්සල 2022



2022 සැප්තැම්බර් 16

ව්‍යාපාර පාසැල - විවෘත දිනය




2022 සැප්තැම්බර් 16

ව්‍යාපාරික පාසැල - ටැලන්ට් ෂෝ



2022 සැප්තැම්බර් 17

සුගීතා ධ්වනි




2022 සැප්තැම්බර් 20

සමාරම්භක උත්සවය – Bsc (ගෞරව) ගෝලීය ලොජිස්ටික්ස් (අවසන් වසර)



2022 සැප්තැම්බර් 22


ව්‍යාපාර පාසැල - සමාරම්භක උත්සවය



2022 සැප්තැම්බර් 21

හෙළ ඇඟලුම් කර්මාන්තශාලාව නැරඹීම

BSc (ගෞරව) Global Logistics (පූර්ණ කාලීන) පාඨමාලාවේ පළමු වසරේ උපාධි අපේක්ෂකයින් 2022 සැප්තැම්බර් 21 වන දින හෙළ ක්ලෝතින්, නිහාරිය කර්මාන්තශාලාවට පැමිණෙන ලදී. ඇඟලුම් අංශයේ ප්‍රායෝගික අත්දැකීම වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පාඨමාලාවෙහි විෂයමාලාවේ අවශ්‍යතාවයක් ලෙස මෙම කර්මාන්ත චාරිකාව සංවිධානය කරන ලදී. හෙල ක්ලෝතින් හි නිෂ්පාදන ක්‍රියාවලිය කැපීමේ කාර්යයේ සිට අවසන් ඇසුරුම් කිරීම දක්වා සිසුන්ට අවබෝධ කරගැනීමට අවස්ථාව මෙහිදී ලැබිණි. සිසුන් සඳහා මෙම සංචාරය සංවිධානය කිරීම සඳහා හෙළ ඇඳුම් ආයතනය සම්බන්ධ කර ගැනීමට සහාය වීම සම්බන්ධයෙන් ආචාර්ය හිමේන්ද්‍ර බලල්ලේ මහතාට සැබවින්ම කෘතඥ වේ. තවද හෙළ ඇඟලුම් ප්‍රධාන කාර්යාලයේ ලක්මිණි රංගිකා මෙනවිය සහ කසුනි මාවලගෙදර මෙනවිය සහ කම්හලේ කාර්යමණ්ඩල සාමාජිකයින් විසින් ලබා දුන් සියලු සහයෝගය විශේෂයෙන් අගය කළ යුතුය.



2022 සැප්තැම්බර් 23

ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය - සමාරම්භක උත්සවය



2022 සැප්තැම්බර් 27

UNDP – NIBM සම්මාන උළෙල - ව්‍යාපාරික පාසල

සමාජ නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය පිළිබඳ විද්‍යුත් ඉගෙනුම් පාඨමාලාව (E-BOOTCAMP) NIBM – UNDP ව්‍යාපාර පාසලේ සම්මාන උළෙල



2022 සැප්තැම්බර් 29

සමාරම්භක උත්සවය - NIBM මහනුවර මධ්‍යස්ථානය

NIBM හි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය සහ NIBM මහනුවර මධ්‍යස්ථානයේ අංශ ප්‍රධානී ඉෂාන් විරතුංග යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් අපගේ ගෝලීය වශයෙන් පිළිගත් උපාධි ප්‍රථම වසර NIBM මහනුවර මධ්‍යස්ථානයේදී ආරම්භ කරන ලදී. සිසුන් 150කට අධික සංඛ්‍යාවක් ඔවුන්ගේ දෙමාපියන් සමඟ NIBM සමඟින් තම උසස් අධ්‍යාපන ගමන ආරම්භ කළේ ගෝලීය පුරවැසියෙකු වීමට ඔවුන්ගේ අනාගතය සකස් කර ගැනීම සඳහාය.



2022 සැප්තැම්බර් 30

සමාරම්භක උත්සවය - මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය



2022 ඔක්තෝබර් 04

ව්‍යාපාරික පාසැල - ව්‍යාපාරික සංසදය

NIBM ව්‍යාපාර පාසලේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ 22.1 කණ්ඩායමේ සිසුන් විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ අර්බුදකාරී තත්ත්වයට දැන් මුහුණ දී ඇති අතර එය විසඳිය හැක්කේ කෙසේද" යන මැයෙන් ව්‍යාපාරික සංසදයක් 2022 සැප්තැම්බර් 28 වන දින සාර්ථකව පවත්වන ලදී. මේ සඳහා සුවිශේෂී පුද්ගලයින් තිදෙනෙකු වන MAS Linea Aqua පෞද්ගලික සමාගමහි ප්‍රධාන විධායක නිලධාරී මුදිත ෆර්ඩිනැන්ඩෝ මහතා, ඇඩිවකැටෝ ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විධායක රොෂාන් පෙරේරා මහත්මිය සහ Barrista පෞද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී දිලූප පතිරණ යන මහත්වරු සහභාගී වූහ.



2022 ඔක්තෝබර් 05

සමාරම්භක උත්සවය - BSc ගෝලීය ලොජිස්ටික්ස් (ගෞරව) උපාධිය[පළමු වසර]



වැදගත් සිදුවීම්

2022 ඔක්තෝබර් 06

සමාරම්භක උත්සවය - පරිගණක හා ඉංජිනේරු පාසැල



2022 ඔක්තෝබර් 07

නවකයන් සාදරයෙන් පිළිගනිමු - ඩිජිටල් බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ උසස් ඩිප්ලෝමාව



2022 ඔක්තෝබර් 14

දිවාලි උත්සවය– NIBM ව්‍යාපාර පාසැල



2022 ඔක්තෝබර් 16

ආශ්චර්ය - සංගීත ඉසව්ව




2022 ඔක්තෝබර් 25

දීපාවලි සැමරුම් - ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය



2022 ඔක්තෝබර් 28

ඉන්දියාවේ ශිව් නාඩාර් විශ්ව විද්‍යාලය සමඟ හවුල්කාරිත්වය



2022 ඔක්තෝබර් 31

ඉදිරි දැක්ම 2022 - ව්‍යාපාරික සංසදය



2022 නොවැම්බර් 04

ව්‍යාපාර පාසැල - කුසලතා ප්‍රදර්ශනය



2022 නොවැම්බර් 05

KIC සමාරම්භක උත්සවය



2022 නොවැම්බර් 13

සමාරම්භක උත්සවය - භාෂා පාසැල



2022 නොවැම්බර් 15

ගෝලීය ව්‍යාපාරික සංසදය 2022

ගෝලීය ව්‍යවසායකත්ව සතිය සමරමින් ශ්‍රී ලංකාවේ ICTA ආයතනයේ සහයෝගිතාවයෙන් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේදී Global Business Forum පැවැත්විණි. මෙම සංසදය 2022 නොවැම්බර් 15 වන දින NIBM Colombo පරිශ්‍රයේ දී වෘත්තීය විශේෂඥයින් වන ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතා (අධ්‍යක්ෂ ජනරාල්, NIBM) මහාචාර්ය ආනන්ද ජයවර්ධන (සභාපති - කොමර්ෂල් බැංකුව), රජීව බණ්ඩාරනායක මහතා (ප්‍රධාන විධායක නිලධාරි කොළඹ කොටස් වෙළෙඳපොළ, සැන්ඩ්‍රා ද සොයිසා මෙනවිය (සමූහ ප්‍රධාන පාරිභෝගික නිලධාරිනි - ඩයලොග් ආසියාටා), ධනික පෙරේරා මහතා (භාෂා හි ප්‍රධාන විධායක නිලධාරි සහ ශ්‍රී ලංකා මෘදුකාංග නිෂ්පාදන සමාගමේ නිර්මාතෘ, "හෙලකුරු," පේ නියර්, සහ, හෙළපේ,) මහත්වරුන්ගේ අගනා සහභාගිත්වයෙන් පැවැත්විණි.



2022 නොවැම්බර් 20

සමාරම්භක උත්සවය - ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය

NIBM හි ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය විසින් එක්සත් රාජධානියේ කොවෙන්ට්‍රි විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන BA (ගෞරව) ඉංග්‍රීසි සහ TESOL උපාධිය ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන් මඟින් ඉංග්‍රීසි භාෂාවල සාහිත්‍යය සහ නිවැරදි ඉගෙන්වීමේ පරිචය පිළිබඳ අත්‍යවශ්‍ය කුසලතා සඳහා අධ්‍යාපනය හදාරන්නන් සන්නද්ධ කරනු ඇත, එමඟින් පරිපූර්ණ සහ ආකර්ෂණීය අධ්‍යාපන අත්දැකීමක් ලබා දිය හැකිය.



2022 නොවැම්බර් 27

සමාරම්භක උත්සවය - BA(ගෞරව) කළමනාකරණය සහ නායකත්වය උපාධිය

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය හා එක්ව කොවෙන්ට්‍රි විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන BA (ගෞරව) කළමනාකරණ සහ නායකත්ව පාඨමාලාවේ සමාරම්භක උත්සවය 2022 නොවැම්බර් 27 වැනි ඉරිදා දින සාර්ථකව පැවැත්විණි. NIBM හි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය කුලසූරිය ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර ප්‍රධාන දේශකයා ලෙස පෑන් ඒෂියා බැංකු සංස්ථාවෙහි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී නලින් එදිරිසිංහ මහතා සහභාගී විය.



2022 නොවැම්බර් 25

Design (නිර්මාණ) උපාධි ප්‍රධානෝත්සවය 2022



2022 නොවැම්බර් 20

MBA සමාරම්භක උත්සවය - ව්‍යාපාර පාසල

එක්සත් රාජධානියේ කොවෙන්ට්‍රි විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන ගෝලීය ව්‍යාපාර පිළිබඳ MBA පාඨමාලාව 2022 නොවැම්බර් 20 දින NIBM හි ව්‍යාපාර පාසලේදී ආරම්භ කරන ලදී. උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආචාර්ය ඩී. එම්. ඒ කුලසූරිය මහතා සහභාගී වූ අතර වැඩසටහනේ සවස ප්‍රධාන දේශකයා වූයේ ශ්‍රී ලංකාවේ ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතාය. ගෝලීය ව්‍යාපාර පිළිබඳ MBA සඳහා පාඨමාලා අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන ආචාර්ය ලලිත් වීරගොඩ මහතා එම වැඩසටහන සඳහා ලියාපදිංචි වූ සිසුන් සමඟ තම දැනුම බෙදාගැනීමේ ගෞරවය ද අපට හිමි විය.



2022 දෙසැම්බර් 11

සමාරම්භක උත්සවය - BA (ගෞරව) මානව සම්පත් කළමනාකරණය



2022 දෙසැම්බර් 15

සමාරම්භක උත්සවය - ප්‍රථම උපාධිය සඳහා පදනම් වැඩසටහන



අංශවල කාර්යසාධනය

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වටිනා ගණුදෙනුකරුවන් සඳහා ඵලදායි ලෙස සේවා සැපයීම අරමුණු කරගෙන ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් යුත් නිපුණතා හා හැකියාවන්ගෙන් යුත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා ආයතනය සිය මෙහෙයුම් කටයුතු ප්‍රධාන අංශ තුනක් යටතේ සිදුකරනු ලැබේ.

1. ව්‍යාපාරික පාසැල (SOB)

2. පරිගණක සහ ඉංජිනේරු පාසැල (SOCE)

3. භාෂා, නිර්මාණකරණය සහ මානවශාස්ත්‍ර පාසැල (SOD)




NIBM
POWERING GREAT MINDS



DESIGN YOUR GLOBAL LIFE WITH NIBM

011 - 732 1000

ව්‍යාපාරික පාසැල (SOB)



ව්‍යාපාර පාසැල මඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා විවිධ විෂයන් සඳහා උසස් ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා ලබා දේ.

- සාමාන්‍ය කළමනාකරණ වැඩසටහන්
- මානව සම්පත් කළමනාකරණය
- ව්‍යාපාර කළමනාකරණ
- ඵලදායිතාව සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන්
- උපදේශන සේවා
- භාෂා වැඩසටහන්
- පරිගණක යෙදවුම් වැඩසටහන්
- ටේලර් - මේඩ් පුහුණු වැඩසටහන්

එහි මූලික පරමාර්ථය වන්නේ ව්‍යාපාරික සංවිධාන වල මෙන්ම පුද්ගලයින්ගේ ඵලදායිතාව සහ කළමනාකරණ පුරුදු පහසු කිරීම සහ වැඩිදියුණු කිරීමයි. මෙම අංශය මඟින් පුහුණුව, අධ්‍යාපනය සහ උපදේශන සේවා යන ක්ෂේත්‍රයන්හි පුළුල් පරාසයක වැඩසටහන් ඉදිරිපත් කෙරේ. එහි සේවාවන් පාසැල් හැරගිය තැනැත්තාගේ සිට ඉහළම වෘත්තිකයා දක්වා සමාජයේ සියළුම පැතිකඩවලට ලබාගත හැකිය. මෙම අධ්‍යාපන හා පුහුණු අවස්ථා රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සංවිධානවල උනන්දුවක් දක්වන පුද්ගලයින් සඳහා නිර්දේශ කෙරේ.

දශක ගණනාවක් පුරාවට ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා ඵලදායිතාව සහ තත්ත්ව කළමනාකරණ පද්ධති හඳුන්වා දීමේදී ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ඉදිරියෙන්ම සිටියේය. මෑතකදී මෙම අංශය ලොව පිළිගත් ඵලදායිතාව සහ ගුණාත්මක වර්ධන පද්ධතියක් වන ලීන් (Lean) නිෂ්පාදන සහ සිග් සිග්මා පද්ධති හඳුන්වා දුන්නේය. ලීන් නිෂ්පාදන සහ සිග් සිග්මා පද්ධති භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත විශාල සංඛ්‍යාවක් මේ වන විටත් ගුණාත්මකභාවය සහ ඵලදායිතාව ඉහළ නැංවීම ආරම්භ කර ඇත.

මෙම අංශය සිය උපදේශන කටයුතු කරගෙන යාමේදී උසස් වෘත්තීය මට්ටමක් පවත්වා ගනී. අපගේ උපදේශකයින්ගේ උපදෙස් සියළුම අදාළ කරුණු සහ මතයන් විශ්ලේෂණයක් මත පදනම් වූ ස්වාධීන දෘෂ්ඨියකින් උපදේශනය කරනු ඇත. අභ්‍යන්තර හා බාහිර වෘත්තිකයින්ගෙන් සමන්විත NIBM උපදේශක කණ්ඩායමට ඕනෑම අධ්‍යයන ව්‍යාපෘතියක් හසුරුවා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා කළමනාකරණ කුසලතාවයන් සහ ප්‍රායෝගික භාවිතය පිළිබඳ පළපුරුද්දක් සහිත උපදේශක මඩුල්ලකින් සහිතය.

ව්‍යාපාරික පාසැලේ වැඩසටහන්

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ව්‍යාපාරික පාසැල වැඩසටහන් 65ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් පශ්චාත් උපාධි වැඩසටහන් 01ක්, උපාධි වැඩසටහන් 04ක්, උසස් ඩිප්ලෝමා වැඩසටහන් 08ක්, උසස් ඩිප්ලෝමා වැඩසටහන් 10ක්, ඩිප්ලෝමා වැඩසටහන් 14ක්, උසස් සහතික පත්‍ර වැඩසටහන් 12ක්, සහතික පත්‍ර වැඩසටහන් 14ක් සහ උපදේශන වැඩසටහන් 02කින් සමන්විත වේ.

2021 සහ 2022 වර්ෂය තුළදී ව්‍යාපාර පාසැල මඟින් සිදු කරන ලද වැඩසටහන්වල සාරාංශයක් පහත වගුවේ දක්වා ඇත.

පාඨමාලාව	2021		2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
පශ්චාත් උපාධි	0	0	1	16
උපාධි	4	225	4	251
උසස් ඩිප්ලෝමා	9	266	8	230
ඉහල ඩිප්ලෝමා	9	325	10	421
ඩිප්ලෝමා	12	380	14	436
උසස් සහතිකපත්‍ර	14	235	12	207
සහතිකපත්‍ර	11	218	14	221
පදනම් පාඨමාලා	1	34	0	0
කෙටි කාලීන	1	24	0	0
උපදේශන	0	0	2	2
එකතුව	**61**	**1707**	**65**	**1784**

ව්‍යාපාර පාසැලට වැඩසටහන් සඳහා සහභාගී වීම

2022 වර්ෂය තුළ ව්‍යාපාරික පාසැලේ වැඩසටහන් සඳහා 1784 දෙනෙක් සහභාගී වූහ.

ව්‍යාපාරික පාසැලේ සංවර්ධන ප්‍රයත්නයන් පෞද්ගලික අංශයේ සේවාලාභීන්ගේ ඉල්ලුම හා අවශ්‍යතා සපුරාලන පුහුණු වැඩසටහන් දියුණු කිරීමට විවිධ උත්සාහයන් ගෙන ඇත. ඒ අනුව මෙම වසර තුළදී නව පුහුණු වැඩසටහන් කිහිපයක් හඳුන්වා දෙන ලදී. මේ සියළු වැඩසටහන් වලින් ව්‍යාපාරික පාසැල විසින් හඳුන්වා දුන් පාඨමාලා වැදගත් වේ. මෙම වසර තුළදී භාෂා පුහුණුව පිළිබඳ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. නව වැඩසටහන් දියුණු කිරීම සඳහා ව්‍යාපාර පාසැල මඟින් ගනු ලබන පියවර කිහිපයක් පහත දැක්වේ.

- පාරිභෝගික ඇගයීම් පද්ධතිය ස්ථාපිත කර වැඩි දියුණු කිරීම
- ගණුදෙනුකරුවන් සඳහා යාවත්කාලීන දත්ත බැංකුවක් පවත්වාගෙන යාම සහ ඔවුන් තුළ ආයතනයේ ගෞරවය ඉහළ නැංවීම
- නව ප්‍රචාරණ ශිල්පීය ක්‍රම හඳුන්වාදීම
- පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා සපුරාලන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම
- අභ්‍යන්තර පුහුණු වැඩසටහන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම

ආදායම් උත්පාදනය


2022 වර්ෂය තුළ ව්‍යාපාරික පාසැල රු. මිලියන 393 ක ආදායමක් උපයා ඇත. පහත වගුව සහ රූප සටහන පෙන්නුම් කරන්නේ පෙර වසරවලට සාපේක්ෂව ව්‍යාපාරික පාසැලෙහි ආදායමේ සැලකිය යුතු වර්ධනයක් ඇති බවයි.

ආදායම් උත්පාදනය - ව්‍යාපාරික පාසැල (රු: මිලියන)

	2018	2019	2020	2021	2022
ආදායම් උත්පාදනය - ව්‍යාපාරික පාසැල	274	388	352	391	393

වගුව 05 - ආදායම් උත්පාදනය - ව්‍යාපාරික පාසැල

කළමනාකරණ වැඩසටහන්



රූපය: 05 - ආදායම් උත්පාදනය - ව්‍යාපාරික පාසැල (2018-2022)



ඵලදායිතා සහ තත්ත්ව මධ්‍යස්ථානය (PQC)

1968 දී ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) පිහිටුවීමට මූලික හේතුවක් වූයේ ශ්‍රී ලංකාවේ කර්මාන්තවල ඵලදායිතාව ඉහළ නැංවීම බව කවුරුත් දන්නා කරුණකි. මුලදී එයට ප්‍රමුඛත්වය ලබා දී ඇති අතර එහිදී NIBM ආයතනය ආසියානු ඵලදායිතා සංවිධානයේ (APO) නියෝජිත ආයතනය වී ඇත. මෙම යුගයේදී NIBM ඵලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් මෙන්ම ජාතික මට්ටමේ ඵලදායිතා සම්මාන සඳහා සම්බන්ධ වූ අතර දිවයිනේ සියලුම ප්‍රමුඛ පෙළේ ආයතන/කර්මාන්ත සමඟ ඉතා ශක්තිමත් සම්බන්ධයක් ගොඩනගාගෙන තිබුණි.

නමුත් කාලයත් සමඟ කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු වූ අතර ඉලක්ක කණ්ඩායම වෘත්තිකයන්ට වඩා පාසැල් හැර ගිය ශිෂ්‍යයන්ගෙන් සමන්විත වූහ. NIBM ආයතනය කර්මාන්තය සමඟ පැවති ශක්තිමත් සම්බන්ධය ක්‍රමක්‍රමයෙන් අඩු වී ඇති අතර මෙය අපගේ වැඩමුළු සඳහා වෘත්තිකයන්ගේ සහභාගීත්වය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී. අපගේ උපාධි අපේක්ෂකයින් සඳහාද කර්මාන්තය සඳහා යොමුකිරීමේදී මෙම සම්බන්ධතාවය අපට ඉතා වැදගත් වේ.

මෙම කර්මාන්ත සබඳතාව වැඩිදියුණු කිරීම සඳහා කර්මාන්තවල ගුණාත්මකභාවය සහ ඵලදායිතා වැඩිදියුණු කිරීම කෙරෙහි පූර්ණ අවධානය යොමු කරන ස්වාධීන ව්‍යාපාර ඒකකයක් තිබිය යුතු අතර ඔවුන්ට එකිනෙකා සමඟ අන්තර් ක්‍රියා කිරීමට, ඉගෙනීමට, පිළිගැනීමට සහ ව්‍යාපාර කරගෙන යාමේදී ඔවුන් මුහුණ දෙන ගැටළු සඳහා විසඳුම් සෙවීමට අවස්ථාව සලසා දිය යුතු බව කළමනාකාරිත්වයේ අදහසයි. එපමණක් නොව, ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයට සහ සමෘද්ධිමත්භාවය සඳහා මෙම තීරණාත්මක කාල පරිච්ඡේදයේදී අපට උපකාර කළ හැකි වීම NIBM හි ජාතික යුතුකමක් ලෙස සලකනු ලැබේ.



ඵලදායිතා සහ තත්ත්ව මධ්‍යස්ථානය (PQC)

ඵලදායිතා සහ තත්ත්ව මධ්‍යස්ථානයේ (PQC) ඉලක්ක

- දැනුවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ඵලදායිතාව සහ ගුණාත්මක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම.
- අදාළ ඵලදායිතා තොරතුරු ලබා ගැනීම, සැකසීම සහ බෙදා හැරීම.
- ඔවුන්ගේ ඵලදායිතාව සහ තත්ත්ව වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයන් හඳුනා ගැනීම සහ අගය කිරීම තුළින් කර්මාන්ත දිරිමත් කිරීම.
- ඵලදායිතා ව්‍යාපාරයට සම්බන්ධ ජාතික සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සම්බන්ධතා වර්ධනය කිරීම.

PQC හි අපේ කාර්යභාරය

1. සියළුම NIBM මධ්‍යස්ථාන වල ISO 9001 (2015 ප්‍රමිතිය පවත්වා ගැනීම
2. වෘත්තීය මාර්ගෝපදේශන සහ කාර්මික පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම. 2022 වර්ෂයේ මෙරට කීර්තිමත් සේවායෝජකයින් 25 කට වැඩි පිරිසකගේ සහ උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයින් 700 කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් සාර්ථක වෘත්තීය මාර්ගෝපදේශන ප්‍රදර්ශනයක් පවත්වන ලදී.
3. ආයතනවල ගුණාත්මක භාවය සහ ඵලදායිතාව ඉහළනැංවීම සඳහා, වැඩමුළු සහ උපදේශන සේවා පැවැත්වීම.
4. පාසැල් හැර ගිය අය සහ වෘත්තිකයන් සඳහා පදනම, උසස් සහතිකය, උසස් ඩිප්ලෝමාව, උසස් ජාතික ඩිප්ලෝමාව සහ උපාධිය වැනි විවිධ මට්ටම්වල, අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම.

2021 සහ 2022 කාලය තුළ පහත පාඨමාලා PQC අංශය විසින් පවත්වන ලදී.

පාඨමාලාව	2021		2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
උපාධි	1	38	2	63
උසස් ඩිප්ලෝමා	3	92	2	66
ඉහල ඩිප්ලෝමා	8	149	6	175
ඩිප්ලෝමා	3	59	2	39
උසස් සහතිකපත්‍ර	4	73	3	70
සහතිකපත්‍ර	1	23	1	32
පදනම් පාඨමාලා	1	5	5	64
උපදේශන	22	22	4	23
එකතුව	**43**	**461**	**25**	**532**

2022 වසරේ PQC විසින් උපයා ඇති ආදායම රුපියල් මිලියන 99 කි.

පරිගණක හා ඉංජිනේරු පාසල (SOCE)



ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය යනු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සුදුසුකම් සහ පුහුණුව ලබා දෙන පරිගණක පුහුණු ආයතනයකි. සහභාගිවන්නන්ට රැකියා ලබා ගැනීමට හා පිළිගත් සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කිරීම සඳහා එම අංශය පරිගණක වැඩසටහන් පවත්වයි. නව අවශ්‍යතා සපුරාලීම සඳහා පාඨමාලා මොඩියුලන් නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලැබේ.

"Get. Set. Code, කේතය යටතේ NIBM සැමවිටම එහි නව්‍යතම සහ පරිවර්තනීය අධ්‍යාපනය වෙනුවෙන් පෙනී සිටී. පරිගණක විද්‍යා ඒකකය මඟින් මෘදුකාංග ඉංජිනේරු, ජාල ඉංජිනේරු, තොරතුරු පද්ධති කළමනාකරණය සහ බහුමාධ්‍ය යන විශේෂිත ක්ෂේත්‍ර හතරක් යටතේ පශ්චාත් උපාධි සහ උපාධි පාඨමාලා, උසස් ජාතික ඩිප්ලෝමා, ඩිප්ලෝමා, උසස් සහතික සහ සහතික මට්ටමේ වැඩසටහන් රාශියක් ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු වීමට සහ සැබෑ ලෝකයේ වෙනසක් කිරීමට ඉදිරිපත් කරයි. මෙම හොඳින් ව්‍යුහගත පරිගණක පුහුණු වැඩසටහන් සිසුන් අතර පුළුල් පිළිගැනීමක් ලබා ඇති අතර ඒවා දේශීය හා විදේශීය සේවා යෝජකයන් විසින් පිළිගෙන ඇත.

මෙම වැඩසටහන් පාසල් හැර යන අය මෙන්ම තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් සඳහා පවත්වනු ලැබේ. මෙම අධ්‍යයන වැඩසටහන් වලට අමතරව, මෙම ඒකකය පුද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතන සඳහා ගැලපෙන වැඩසටහන් ද පවත්වයි. වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අමතරව මෙම ඒකකය සිය මෘදුකාංග සංවර්ධන ඒකකය (SDU) හරහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සඳහා කර්මාන්ත ප්‍රමිතියෙන් යුත් මෘදුකාංග සංවර්ධනය කිරීමේ නිරතව සිටී.

2008 සිට අංශයන් මඟින් සපයන ලද උසස් අධ්‍යාපනයේ සහ සේවාවන්හි උසස් තත්ත්වය තහවුරු කරමින් Sola අංශය ISO 9001: 2000 සහතිකය ලැබිය.

පරිගණක සහ ඉංජිනේරු පාසල (SOCE)

පරිගණක හා ඉංජිනේරු පාසලේ අනෙකුත් ක්‍රියාකාරකම්

2022 වර්ෂය තුළ පරිගණක හා ඉංජිනේරු පාසල විසින් උපාධි වැඩසටහන් 07ක්, ඉහල ඩිප්ලෝමා වැඩසටහන් 05ක්, ඩිප්ලෝමා වැඩසටහන් 18ක්, උසස් සහතිකපත්‍ර 01ක්, සහතික පත්‍ර වැඩසටහන් 29ක්, පදනම් වැඩසටහන් 02ක්, ගෘහස්ථ වැඩසටහන් 4ක් සහ උපදේශන වැඩසටහන් 01ක් ලෙස වැඩසටහන් 67ක් පාසල විසින් පවත්වන ලදී.

පාඨමාලාව	2021		2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
උපාධි	7	157	7	179
උසස් ඩිප්ලෝමා	7	213	5	172
ඩිප්ලෝමා	18	547	18	924
උසස් සහතිකපත්‍ර	1	12	1	50
සහතිකපත්‍ර	26	796	29	1331
පදනම් පාඨමාලා	3	25	2	22
ගෘහස්ත	5	595	4	108
උපදේශන	1	1	1	11
එකතුව	**68**	**2346**	**67**	**2797**

රූප සටහන 06 - පරිගණක හා ඉංජිනේරු පාසල විසින් පවත්වන ලද වැඩසටහන්

2022 වර්ෂය තුළ පරිගණක සහ ඉංජිනේරු පාසලේ වැඩසටහන් සඳහා සිසුන් 2797 ක් සහභාගී වී ඇත.

ආදායම් උත්පාදනය


2022 වසර තුළ පරිගණක සහ ඉංජිනේරු පාසල විසින් රුපියල් මිලියන 379 ක ආදායමක් උපයා ඇත. 2017-2022 කාලපරිච්ඡේදය තුළ උපයාගත් ආදායම පහත වගුව 07 මඟින් පෙන්නුම් කෙරේ.

ආදායම් උත්පාදනය - පරිගණක සහ ඉංජිනේරු පාසල

මිලියන

	2017	2018	2019	2020	2021	2022
පරිගණක සහ ඉංජිනේරු පාසලේ ආදායම් උත්පාදනය	172	241	345	350	336	379

වගුව 07 - පරිගණක සහ ඉංජිනේරු පාසලේ ආදායම් උත්පාදනය



රූපය. 07 : පරිගණක සහ ඉංජිනේරු පාසලේ ආදායම් උත්පාදනය (2017 - 2022)

මානව ශාස්ත්‍ර, නිර්මාණකරණ සහ භාෂා පාසල (SOD)

ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය (NIC)

NIBM ලිමිකොක්විං ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය (NIC) යනු ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සිය ස්වර්ණ ජුබිලිය සමරන ලද වසරේදී ජාතියට කරන ලද සුවිශේෂී දායකත්වයකි. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය මැලේසියාවේ ලිමිකොක්විං නිර්මාණාත්මක තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ අත්වැල් බැඳගනිමින්, නිර්මාණාත්මක තාක්ෂණයන් සඳහා 23 වන සියවසේදී ශ්‍රී ලංකාව ඩිජිටල් ජාතියක් බවට පත් කිරීමට දරන අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස මෙය ස්ථාපිත කර ඇත. ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය පිහිටුවීමේදී NIBM හි දැක්ම සිව් වැදෑරුම් වේ.

පළමුව, NIBM සිසුන් ඔවුන්ගේ අනාගතය ගැන සැලකිලිමත් වනු ඇතැයි අපේක්ෂා කරයි. ඔබේ අනාගතය සැලසුම් කරන්න, ඔවුන්ට කියනු ලැබේ. "ඔබට ඇත්තේ එකම ජීවිතයකි, අන් අයට ඔබ වෙනුවෙන් තීරණ ගැනීමට ඉඩ දෙන්නේ ඇයි, එය ඔබේම කරගන්න. අත්හදා බලන්න, නිර්භීත වන්න සහ අභියෝගවලට මුහුණ දෙන්න. එවිට ඔබට ඔබ වීමට හැකි වනු ඇත.

ඔබ අන් අය වෙනුවෙන් වැඩ කිරීමට කැමැතිනම් එම සිතුවිල්ල ඉතා හොඳය. ඔබේම ව්‍යාපාරයක් ආරම්භ කරන්න, ඒ තුළින් හොඳ ව්‍යවසායකයෙකු වීමට උත්සාහ කරන්න.
ඔබ රැකියා සොයන්නෙකු නොව රැකියා උත්පාදකයෙකු විය යුතුය. (NIBM විසින් ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයේ කළමනාකරණ කුසලතා පුහුණු කරනු ලබන්නේ ඒ සඳහා ය) දෙවනුව, NIBM



සිසුන් ජාත්‍යන්තර පුරවැසියන් වීම සඳහාද පුහුණු කරයි. NIBM-ලිමිකොක්විං NIC හි "ඔබේ ජාත්‍යන්තර සම්බන්ධතා ජාලය ගොඩනගා-න්න, ඔවුන් රටවල් 150ක සිසුන් සමඟ සම්බන්ද වී ඇත. ඔවුන්ගේ අධ්‍යයනවලින් කොටසක් විදේශයකදී සිදුකරනු ලැබේ. ඔවුන්ට අලුත් මුහුණු පමණක් නොව නව සංස්කෘතීන් හි නව අදහස් සහිත වූවන් හමු වේ.ඔවුන්ට මහද්වීප පහක මිතුරන් හමුවනු ඇත. ඔවුන් තම සීමාවන් පුළුල් කරනු ලැබේ. පැරිසියේ සිට මෙල්බර්න් දක්වා ඕනෑම තැනක ජීවත් විය හැකි සැබෑ ජාත්‍යන්තර පුරවැසියන් විය හැක, ආයතනයේ සිසුන් අපේක්ෂා කරන්නේද එයයි.

ඉහල ආදායම් ලබන වෘත්තිකයන් සඳහා හොඳම මාර්ගය ද ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විසින් ගොඩනගයි. ආයතනයේ සිසුන්ගේ දැනුම නව ලෝකයට ගමන් කිරීම ඔවුන්ගේ මාවත වනු ඇත. NIBM - ලිමිකොක්විං NIC හි ඔවුන් ජාත්‍යන්තර ව්‍යාපාරික ක්ෂේත්‍රයේ තරුවක් වීම සඳහා සිසුන්ගේ පූර්ණ හැකියාවන් වර්ධනය කර ගැනීමට පුහුණු කරනු ලැබේ. එහිදී සිසුන්ට ජාත්‍යන්තරය පිළිගත් සහතිකයක් ලැබේ. එය ඔවුන්ගේ විදේශ ගමන් සඳහා බලපත්‍රයක් ලෙස සැබෑ වෘත්තිකයන්ගේ ලෝකය පුරා ගෙන යා හැකිය.

අවසාන වශයෙන්, ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විසින් කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ උසස් අධ්‍යාපනය ලබාදෙනු ලැබේ. NIBM - ලිමිකොක්විං සහ NIC, ක්ෂේත්‍රයේ කර්මාන්තය සමඟ ඇති සමීප සබඳතාවයන්

මානව ශාස්ත්‍ර, නිර්මාණකරණ සහ භාෂා පාසල (SOD)

සමඟ සිසුන්ට කාර්ය ආරම්භ කිරීමට පුහුණු කරනු ලැබේ, එය ඔවුන්ගේ ප්‍රියතම කණ්ඩායම් සමඟ හෝ ඔවුන්ගේ ම ජීවිතයේ නව ආරම්භයක් විය හැකිය. ඔවුන්ට එලිදැක්විය හැකි කුසලතා කට්ටලයක් පවතී. ඒ අනුව ඔවුන් සැබෑ වෘත්තිකයන්, නිර්මාණශීලී සහ ව්‍යවසායකයින් වනු ඇත. ඔවුන් ව්‍යාපාරික භාෂාව කතා කරන අතර කර්මාන්තයේ අවශ්‍යතාවයන් තේරුම් ගනු ඇත.

මෙහි සෘජු ප්‍රතිලාභීන් වන්නේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන නමුත් එකවර දැරිය හැකි මිලකට පුහුණු වීමට කැමති ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් වේ.

මීට අමතරව, මෙම මුලපිරීම තරුණයින්ට ඔවුන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට ව්‍යවසායකත්ව කුසලතා ද ලබා දෙනු ඇත. ග්‍රැෆික් නිර්මාණකරුවන්, අභ්‍යන්තර නිර්මාණකරුවන්, විලාසිතා නිර්මාණකරුවන්, ලේඛකයින්/කර්තෘවරුන්, කලාකරුවන්, කලා අධ්‍යක්ෂවරුන්, බහුමාධ්‍ය කලාකරුවන්, මාධ්‍ය සංස්කාරකවරුන්, ඡායාරූප ශිල්පීන්, බහුමාධ්‍ය ඉංජිනේරුවන්, චිත්‍රපට අධ්‍යක්ෂවරුන්, මාධ්‍යවේදීන් සහ නිර්මාණශීලී තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්, වාණිජ/කාර්මික නිර්මාණකරුවන්, වැනි කර්මාන්තවල කෙටි කාලයක් තුළ රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් නිර්මාණය කිරීම මෙහි අරමුණය.

ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගේ සහ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ආරාධනයෙන් 2017 ඔක්තෝම්බර් 20 වැනි දින අතිගරු ජනාධිපතිතුමා අතින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

ශ්‍රී ලංකාවේ ආයතනයන්හි නිර්මාණාත්මක අංශය වෙනස් කරන්නෙකු ලෙස, ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය විසින් බහුමාධ්‍ය, විලාසිතා සැලසුම්, අභ්‍යන්තර ගෘහ නිර්මාණ ශිල්පය, සන්නිවේදනය, පුවත්පත් කලාව, ශබ්ද සහ සංගීතය, තොරතුරු තාක්ෂණය වැනි වැඩසටහන් රාශියක් ඉදිරිපත් කරනු ලැබේ. නිර්මාණාත්මක කර්මාන්තවලට නායකත්වය ලබා දෙන නව උපාධිධාරී පරම්පරාවක් මේ තුළින් සවිබල ගන්වනු ඇත.

NIC පවත්වන ලද වැඩසටහන්

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ නිර්මාණ පාසල වැඩසටහන් 51ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් පශ්චාත් උපාධි වැඩසටහන් 02ක්, උපාධි වැඩසටහන් 24ක්, උසස් ඩිප්ලෝමා වැඩසටහන් 06ක්, උසස් ඩිප්ලෝමා වැඩසටහන් 08ක්, උසස් සහතිකපත්‍ර වැඩසටහන් 01ක්, සහතික පත්‍ර වැඩසටහන් 06ක් සහ පදනම් වැඩසටහන් 04කින් සමන්විත වේ. NIC හි නිර්මාණ පාසල විසින් 2021 සහ 2022 වසර තුළ පවත්වන ලද වැඩසටහන්වල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

පාඨමාලාව	2021		2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
පශ්චාත් උපාධි	1	12	2	38
උපාධි	15	349	24	550
උසස් ඩිප්ලෝමා	5	62	6	79
උසස් ඩිප්ලෝමා	7	135	8	186
උසස් සහතිකපත්‍ර	1	9	1	5
සහතිකපත්‍ර	9	79	6	64
පදනම් පාඨමාලා	3	48	4	95
වැඩමුළු	1	20	0	0
එකතුව	**42**	**714**	**51**	**1017**

නිර්මාණ පාසලේ වැඩසටහන් වලට සහභාගී වීම

2022 වර්ෂය තුළ NIC හි නිර්මාණ පාසලේ වැඩසටහන් සඳහා 1017 දෙනෙක් සහභාගී විය.


ආදායම් උත්පාදනය

2022 වසරේ නිර්මාණ පාසල විසින් උපයා ඇති ආදායම රුපියල් මිලියන 346 කි. 2021-2022 කාලපරිච්ඡේදය තුළ උපයාගත් ආදායම පහත වගුව මඟින් පෙන්නුම් කෙරේ.

ආදායම් උත්පාදනය - නිර්මාණ පාසල

මිලියන

	2019	2020	2021	2022
නිර්මාණ පාසැලෙහි ආදායම් උත්පාදනය	82	140	263	346



රූපය 07 : නිර්මාණ පාසලෙහි ආදායම් උත්පාදනය (2019 - 2022)



භාෂා පාසල ඉංග්‍රීසි භාෂා ඒකකය

එක් පූර්ණ කාලීන උපදේශකයෙකු සමඟ 2006 නොවැම්බර් මාසයේදී ඉංග්‍රීසි භාෂා ඒකකය පිහිටුවන ලදී. මෙම ඒකකය දැන් ව්‍යාපාරික පාසලේ අධ්‍යක්ෂ යටතේ පූර්ණ කාලීන උපදේශකයින් තිදෙනෙකු සමඟ ක්‍රියාත්මක වේ. සෑම වර්ගයකම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ඉංග්‍රීසි භාෂා කුසලතා පිළිබඳ නිපුණතා ගොඩනැගීමට නමක් දිනා ඇති අතර පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකෙහිම සේවකයින් සඳහා ඉංග්‍රීසි භාෂා වැඩසටහන් මෙන්ම අභ්‍යන්තර ඉංග්‍රීසි වැඩසටහන් ද සාර්ථකව පවත්වා ඇත.

ගුණාත්මක ඉංග්‍රීසි වැඩසටහන් සඳහා දිනෙන් දින ඉහළ යන ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන්, ඉංග්‍රීසි ඒකකය සහතිකපත්‍ර මට්ටමේ සිට ඩිප්ලෝමා මට්ටම දක්වා වැඩසටහන් කිහිපයක් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇති අතර සහභාගිවන්නන්ට ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමේ ප්‍රවීණයින් බවට පත් විය හැකිය. සාර්ථක වෘත්තියක් සඳහා ශක්තිමත් පදනමක් ලෙස ඉංග්‍රීසි භාෂා නිපුණතා වැඩිදියුණු කර ගැනීමට උත්සාහ කරන අයට මෙම වැඩසටහන් ඉතා යෝග්‍ය වේ. සියලු වර්ගවල දෙවන භාෂා ඉගෙන ගන්නන් හසුරුවා ගැනීමේදී පළපුරුද්දක් ඇති සම්පත්දායකයින්ගේ සේවාවන් ඉංග්‍රීසි ඒකකය මඟින් සපයනු ලැබේ. ඉංග්‍රීසි සන්නිවේදන මාධ්‍යයක් ලෙස භාවිතා කිරීමේදී ඉගෙනගන්නන්ගේ විශ්වාසය ගොඩනැගීමට ඔවුන්ගේ නිවැරදි මඟ පෙන්වීම අත්‍යවශ්‍යයි. ඉංග්‍රීසි භාෂා ඒකකය කර්මාන්තයට සහ රටට ඉංග්‍රීසි නිපුණතා පිළිබඳ පුහුණු සපයන්නෙකු ලෙස සේවය කරන අතර අනෙකුත් දේශීය හා විදේශීය භාෂාවලින් භාෂා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ ව්‍යාප්තිය සඳහා සැලසුම් කර ඇත.

2021 සහ 2022 වසර තුළ SOL විසින් පවත්වන ලද වැඩසටහන් වල සාරාංශයක් පහත වගුවේ දක්වා ඇත.

පාඨමාලාව	2021		2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
උපාධි	0	0	1	29
උසස් ඩිප්ලෝමා	2	65	1	17
ඩිප්ලෝමා	4	79	3	90
උසස් සහතිකපත්‍ර	9	201	12	345
සහතිකපත්‍ර	6	169	7	272
එකතුව	**21**	**514**	**24**	**753**

2022 වර්ෂය තුළ භාෂා පාසල රුපියල් මිලියන 41ක ආදායමක් උපයා ඇත.



ප්‍රාදේශීය මධ්‍යස්ථාන



ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය 2022 වසර වනවිට ප්‍රාදේශීය මධ්‍යස්ථාන හතරක් පිහිටුවා ප්‍රාදේශීය මට්ටමින් පුහුණු පාඨමාලා සිදු කරනු ලැබේ.


NIBM
POWERING GREAT MINDS

කුරුණෑගල

HOME OF
INSPIRED SOLUTIONS

070-2222 779 | 070-2222 780 | 070-2222 781

කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය



1986 දී ආරම්භ කරන ලද කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මඟින් පවත්වනු ලබන පාඨමාලා අතර පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලා සහ පරිගණක පද්ධති සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා, පරිගණක යෙදුම් පිළිබඳ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා, මානව සම්පත් කළමනාකරණය සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පදනම් පාඨමාලා, උසස් සහතික පත්‍ර සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා ආදිය ඇතුළත් වේ. මෙම වැඩසටහන් ක්‍රමානුකූලව පැවැත්වීම සඳහා 2008 වර්ෂයේදී නව ගොඩනැගිල්ලක් ඉදිකර විවෘත කරන ලද අතර එම ව්‍යාපෘතියේ මුළු වියදම රු. මිලියන 141 කි. එය පහත සඳහන් පහසුකම් සහිත සිව්මහල් ගොඩනැගිල්ලකි.

- අංග සම්පූර්ණ දේශන ශාලා.
- අවශ්‍ය සියලුම උපකරණ සහිත පරිගණක පර්යේෂණාගාර.
- නවීන ශ්‍රවණාගාරයක්
- පුස්තකාල පහසුකම්
- අන්තර්ජාල සහ බ්‍රෝඩ් බෑන්ඩ් පහසුකම්
- සුභසාධන සහ ආපනශාලා පහසුකම්
- සියලු පහසුකම් සහිත බද්ධ නිවාස දෙකක්
- වාහන නැවැත්වීමේ පහසුකම්

කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය

NIBM යනු පවුලක් වන අතර, එය අපට උපතින් ඇති විශාලතම හා ශක්තිමත්ම බැඳීමයි. එතුලින් ආදරය, සහයෝගය සහ යහපත් වටිනාකම් ඇති කරයි. එවැනි පවුලකින් ඔබ ආශීර්වාද ලබන විට ඔබට කිසිදා තනිකමක් දැනෙන්නේ නැත. අපගේ NIBM කුරුණෑගල පවුල මෙම ආදරය, සහයෝගය සහ යහපත් වටිනාකම් අපගේම පවුලේ සාමාජිකයින් සිදුකරන ආකාරයටම තම සිසුන්ට ලබා දෙනු ලැබේ.

අපගේ කුරුණෑගල නිවස සිසුන්ට ඔවුන්ගේ අනාගත සිහින සැබෑ කර ගැනීමට පොළඹවා ගත හැකි පිරිසිදු හදවත් වලින් සමන්විත වේ. අපක්ෂපාතීත්වය, විශ්වාසය සහ කැපවීම අපගේ කණ්ඩායමේ ප්‍රධාන ගුණාංගයන් වේ. සෑම අඳුරු වලාකුළකටම රිදී රේඛාවක් ඇති සේම අපගේ NIBM කුරුණෑගල පවුලට ඕනෑම කෙනෙකුව ප්‍රබුද්ධ ප්‍රද්ගලයෙක් බවට පත් කිරීමේ හැකියාව ඇත.

ඔබ අපගේ කුරුණෑගල ආයතන පරිශ්‍රයට ගිය පසු, ඒ අවට ඇති හරිත පරිසරයෙන් ඔබ ප්‍රබෝධමත් වනු ඇත. එය ඔබේ මානසික ආතතිය අඩු කර ඔබේ අධ්‍යයන කටයුතුවල නිරත වීමට උනන්දුවක් ඇති කරයි. අපගේ අවසාන ඉලක්කය විසඳුම් සපයන්නන් වන දක්ෂ උපාධිධාරීන් විසින් බිහි කරනු ඇත. එබැවින්, NIBM - කුරුණෑගල ඔබට සතුටින්, ජීවත්වීමට සහ ඔබේ අනාගතයට අරුතක් ගෙන ඒමට ඉඩ සලසයි.

පහත පාඨමාලා 2021 සහ 2022 කාලය තුළ කුරුණෑගල මධ්‍යස්ථානයේදී පවත්වන ලදී

පාඨමාලාව	2021		2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
උසස් ඩිප්ලෝමා	4	74	6	107
ඉහල ඩිප්ලෝමා	5	122	4	77
ඩිප්ලෝමා	9	150	9	248
උසස් සහතිකපත්‍ර	10	204	8	168
සහතිකපත්‍ර	17	401	18	532
පදනම් පාඨමාලා	1	4	2	14
වැඩමුළු	1	9	0	0
එකතුව	**47**	**964**	**47**	**1146**

කුරුණෑගල මධ්‍යස්ථානයේ ජයග්‍රහණ සහ සිදුවීම් 2022


- නිකවැරටිය ප්‍රදේශයේ අක්කර 17.5 ක ආදර්ශ ගොවිපලක් සහ පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කරමින් වයඹ පළාතේ කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ වසර 30ක බදු ගිවිසුමක් අත්සන් කරන ලදී.
- 2022 පෙබරවාරි 01 වැනි දින කුරුණෑගල ලක්දාස් ද මෙල් විද්‍යාලයේ සාමාන්‍ය පෙළ සිසුන් සඳහා නොමිලේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.
- "අපේක්ෂාවට සෙනෙහසින්" යනු 2022 පෙබරවාරි මස අනුරාධපුර ශික්ෂණ රෝහලේ තැලසීමියා වාට්ටුවේ සමාප්ත සත්කාර ව්‍යාපෘතියක් පවත්වන ලදී.
- 2022 අප්‍රේල් මාසයේ දී සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය පැවැත්වීම.
- 2022 අප්‍රේල් මාසයේදී ගමට අවුරුදු CSR පැවැත්වීම.
- 2022 වසරේ නොවැම්බර්හිදී සුපිරි හයේ පහර සය සාමාජික ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම
- 2022 ජූනි මාසයේදී දන්සල පැවැත්වීම
- 2022 දෙසැම්බර් මාසයේදී නත්තල් උත්සවය පැවැත්වීම
- දෙසැම්බර් මාසයේ කෘෂිකර්ම වෙළඳපල සහ ප්‍රදර්ශනය පැවැත්වීම

ආදායම් උත්පාදනය

කුරුණෑගල මධ්‍යස්ථානයේ 2022 වර්ෂයේදී, ව්‍යාපාරික සහ පරිගණක පාසල මඟින් රු. මිලියන 100ක් උත්පාදනය කර ඇති අතර කුරුණෑගල මධ්‍යස්ථානයේ ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව පහත දැක්වේ.

ආදායම් උත්පාදනය - කුරුණෑගල මධ්‍යස්ථානය (රුපියල් මිලියන)

	2017	2018	2019	2020	2021	2022
කුරුණෑගල මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය	82	87	96	81	94	100



රූපය 09 - කුරුණෑගල මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය (2017 - 2022)




NIBM
POWERING
GREAT
MINDS
මහනුවර
ENTERPRISING HEARTS
081 - 562 1604 | 070 - 562 1604

මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය

පරිගණක හා කළමනාකරණ සංවර්ධන අධ්‍යයන සඳහා මධ්‍යම පළාතේ වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි මහනුවර මධ්‍යස්ථානය 1996 දී විවෘත කරන ලදී. පසුව එම මධ්‍යස්ථානය මහනුවර අස්ගිරි පාරේ පිහිටි නවීන පහසුකම්වලින් සමන්විත වඩාත් ඉඩකඩ සහිත සිව්මහල් ගොඩනැගිල්ලකට ගෙන යන ලදී. අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සහ පරිසරය වඩාත් යෝග්‍ය වන මෙම මධ්‍යස්ථානයෙන් වඩාත් හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. මධ්‍යස්ථානය තුළ එකවර සිසුන් 600 කට වැඩි සංඛ්‍යාවක් සඳහා පුළුල් පරාසයක තොරතුරු තාක්ෂණ සහ කළමනාකරණ වැඩසටහන් හැදෑරීම සඳහා පහසුකම් පවතින අතර, නවීන පරිගණක විද්‍යාගාර සහ පන්තිකාමර පහසුකම් වලින් පරිපූර්ණ වේ. දළදා මාලිගාව ඇතුළු මහනුවර දර්ශනීය දසුනක් මෙහිදී අධ්‍යාපනය හදාරන්නන්ට දැකගත හැකිය.



මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය

2021 සහ 2022 කාලය තුළ මහනුවර මධ්‍යස්ථානයේ පවත්වන ලද පාඨමාලා පහත සඳහන් කර ඇත.

පාඨමාලාව	2021		2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
උපාධි	4	102	0	0
උසස් ඩිප්ලෝමා	8	159	6	110
ඉහල ඩිප්ලෝමා	5	91	2	90
ඩිප්ලෝමා	18	258	16	327
උසස් සහතිකපත්‍ර	8	104	9	165
සහතිකපත්‍ර	18	261	17	438
පදනම් පාඨමාලා	3	22	0	0
වැඩමුළු	0	0	2	13
එකතුව	**64**	**997**	**52**	**1143**

වගුව 10 - මහනුවර මධ්‍යස්ථානයේ පවත්වන ලද පාඨමාලා (2021- 2022)


ආදායම් උත්පාදනය

2022 වර්ෂයේදී මහනුවර මධ්‍යස්ථානයේ ව්‍යාපාරික පාසල සහ පරිගණක පාසල විසින් උපයා ඇති ආදායම රු. මිලියන 129 කි. පහත වගුවේ දැක්වෙන්නේ මහනුවර මධ්‍යස්ථානයේ ආදායම වසර ගණනාවක් තිස්සේ වෙනස් වී ඇති ආකාරය වේ.

ආදායම් උත්පාදනය - මහනුවර මධ්‍යස්ථානය **රු. මිලියන**

	2017	2018	2019	2020	2021	2022
මහනුවර මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය	101	102	109	122	95	129

වගුව 11 - මහනුවර මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය



මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය (KIC)




මෙම මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය 2021 වර්ෂය අවසානයේ විවෘත කරන ලද අතර 2022 වර්ෂයේදී මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානයේදී (KIC) පහත වැඩසටහන් සිදු කර ඇත.

පාඨමාලාව	2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
උපාධි	7	185
උසස් ඩිප්ලෝමා	1	17
ඉහල ඩිප්ලෝමා	2	25
ඩිප්ලෝමා	1	15
උසස් සහතිකපත්‍ර	1	3
සහතිකපත්‍ර	4	45
පදනම් පාඨමාලා	2	21
එකතුව	**18**	**311**


NIBM
POWERING
GREAT
MINDS
ගාල්ල
CALIBRATING THE
FUTURE OF SOUTHERNERS
077-4977 550
077-2790 590
077-1571 324

ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය

දකුණු පළාතේ කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානයක් ගාල්ලේ දී ආරම්භ කරන ලදි. එය අලුතින් ගොඩනඟන ලද අංගසම්පූර්ණ ආයතනයක් වන අතර උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන සෑම ශිෂ්‍ය ශිෂ්‍යයාවකටම පියවරෙන් පියවර අධ්‍යාපනය සහ වෘත්තීය මාර්ග විවර කරදීම සහතික කරයි. කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උපාධි වැඩසටහන්, ඩිප්ලෝමා වැඩසටහන්, සහතික පත්‍ර වැඩසටහන්, උපදේශන සහ ගෘහස්ථ වැඩසටහන, විවිධ වැඩමුළු සහ පුහුණු වැඩසටහන් 2010 වර්ෂයේ සිට ගාලු මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබේ. මෙම කලාපයේ දිනෙන් දින ඉහල යන පුහුණු සහ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා NIBM විසින් ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් තුළ ගුණාත්මක වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ග්‍රාමීය ප්‍රදේශවලට ගෙන යාමේ අරමුණින් වැඩසටහනක් ආරම්භ කර ඇත. එම අරමුණ මනසේ තබා ගනිමින් තරුණ තරුණියන්ගේ අභිලාෂයන් සහ සුදුසුකම් ලත් සහ පුහුණු පුද්ගලයින් නිර්මාණය කරමින් කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රධාන දිස්ත්‍රික්කවල තවත් කලාපීය මධ්‍යස්ථාන ඉදිරියේදී පිහිටුවනු ඇත.



ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය

ගාල්ල මධ්‍යස්ථානයේ අරමුණු,

1. සෑම විටම දකුණු පළාතේ උසස් අධ්‍යාපනයේ පුරෝගාමියා වීම.
2. අධ්‍යාපනයේ දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ තත්ත්ව රාමුව පවත්වා ගැනීම.
3. ප්‍රතිඵල මත පදනම් වූ ඉගෙනුම් (OBL) ක්‍රමය මඟින් රැකියා කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම.
4. නවීන අධ්‍යාපනික තාක්ෂණය භාවිතා කිරීමේදී අංක එක බවට පත්වීම.
5. ජාතික අධ්‍යාපන සම්පාදකයා බවට පත්වීම.

NIBM දකුණු කැම්පස් එක ලෙස, සිසුන්ගෙන් සහ ඔවුන්ගේ දෙමාපියන්ගෙන් අප ලබා ගත් දේ සහ ඔවුන් අප කෙරෙහි තැබූ විශ්වාසය මත පාඨමාලා සඳහා ලද විශාල ඉල්ලීම් හේතුවෙන් 2022 වර්ෂය තුළ අපේක්ෂා කළ අයවැයද ඉක්මවා සිසුන්ගේ ඉලක්ක ළඟා කර ගෙන ඇත. දකුණු පළාතේ උසස් අධ්‍යාපනයේ පුරෝගාමියා ලෙස පසුගිය වසරවලට සාපේක්ෂව සෑම වසරකම කටයුතු ඉතා හොඳින් ඉටුකරමින් පවතී. NIBM සඳර්න් කැම්පස් එක පවුලක් ලෙස, දකුණේ ජනතාවගේ අනාගතය පිළිබඳ අභියෝගය භාරගෙන කටයුතු කරමින් ඇත. Professional IT Business Analyst වැඩසටහන හඳුන්වා දීමෙන් අපි තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ අඩුව පුරවාලීම සහ වෙළඳපල අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගෙන තවත් නව වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී ඇති අතර තවත් බොහෝ දේ ක්‍රියාත්මක කරමින් පවතී. ගාලු මධ්‍යස්ථානයේදී 2022 වසර තුළ දී පහත ක්‍රියාකාරකම් සිදුකර ඇත.

- ක්‍රික් ක්ලැෂ් - වාර්ෂික ක්‍රිකට් තරඟාවලිය
- අලුත් අවුරුදු උත්සවය
- නත්තල් කැරොල් ගීත
- පොසොන් දන්සැල
- NIBM පැදුර

2021 සහ 2022 කාලය තුළ ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී පහත පාඨමාලා පවත්වන ලදී.

පාඨමාලාව	2021		2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
උසස් ඩිප්ලෝමා	7	134	3	58
ඉහල ඩිප්ලෝමා	5	75	3	67
ඩිප්ලෝමා	13	186	11	229
උසස් සහතිකපත්‍ර	5	90	7	215
සහතිකපත්‍ර	16	237	18	381
එකතුව	**46**	**722**	**42**	**950**

ආදායම් උත්පාදනය

ගාල්ල මධ්‍යස්ථානයේ ව්‍යාපාර පාසල සහ පරිගණක පාසල විසින් 2022 වර්ෂයේදී රු. මිලියන 88ක ආදායමක් උපයා ඇත. පහත වගුවේ දැක්වෙන්නේ ගාලු මධ්‍යස්ථානයෙන් උපයාගත් ආදායම ඉහළ ගොස් ඇති ආකාරය වේ.

ආදායම් උත්පාදනය - ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය (රු. මිලියන)

	2018	2019	2020	2021	2022
ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය	68	74	77	85	88

Table **13** - ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය




Table 13 - ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය


NIBM
POWERING
GREAT
MINDS
මානව
CALIBRATING THE
FUTURE OF SOUTHERNERS
076-097 2550 | 071-355 7770 | 070-204 7749

මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය



දකුණු පළාත සඳහා මාතර නගර මධ්‍යයෙහි පිහිටා ඇති NIBM මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය තුළ ඵලදායිතාවය, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ භාෂා යන ක්ෂේත්‍රවලට අදාළ ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපනයට පහසුකම් ලබාදීම සඳහා නවීනතම පරිගණක විද්‍යාගාර සහ කැප වූ අධ්‍යයන සහ කාර්ය මණ්ඩලයේ පහසුකම් සපයා ඇත.

මෙම කලාපවල වර්ධනය වන පුහුණු සහ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා තරුණයින්ගේ අභිලාෂයන් සහ සුදුසුකම් ලත් සහ පුහුණු පුද්ගලයින් සඳහා කර්මාන්ත අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රධාන දිස්ත්‍රික්කවල අනාගතයේදී තවත් කලාපීය මණ්ඩපයක් පිහිටුවීමට NIBM කටයුතු කරයි. මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි 2020 සහ 2021 කාලය තුළ පහත වැඩසටහන් පවත්වා ඇත.

2021 සහ 2022 කාලය තුළ මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී පහත පාඨමාලා පවත්වන ලදී

පාඨමාලාව	2021		2022	
	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව	පාඨමාලා ගණන	සිසුන් සංඛ්‍යාව
උසස් ඩිප්ලෝමා	3	76	5	89
ඉහළ ඩිප්ලෝමා	2	33	2	36
ඩිප්ලෝමා	10	155	7	148
උසස් සහතිකපත්‍ර	5	79	4	178
සහතිකපත්‍ර	9	171	10	285
එකතුව	**29**	**514**	**28**	**736**

මාතර මධ්‍යස්ථානය 2022 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- ක්‍රික් ක්ලැෂ් - වාර්ෂික ක්‍රිකට් තරඟාවලිය
- අලුත් අවුරුදු උත්සවය
- නත්තල් උත්සවය
- ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය - සිනහව අරන්
- වෙසක් දන්සැල
- පොසොන් දන්සැල


ආදායම් උත්පාදනය

මාතර මධ්‍යස්ථානයේ ව්‍යාපාරික පාසල සහ පරිගණක පාසල මඟින් 2022 දී ආදායම් උත්පාදනය රු. මිලියන 65ක් වේ. පහත වගුවේ දැක්වෙන්නේ මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් 2018 සිට 2022 දක්වා උපයා ඇති ආදායමයි.

ආදායම් උත්පාදනය - මාතර මධ්‍යස්ථානය (රු. මිලියන)

	2018	2019	2020	2021	2022
මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය	51	67	56	63	65

වගුව 15 - මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය



විභාග ඒකකය (EU)



2007 දී වෙනම පිහිටුවන ලද NIBM හි විභාග ඒකකය (EU) විභාග ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයෙහි ප්‍රධානතම මෙහෙයුම් අංශයකි. එබැවින් විභාග ඒකකයට සිසුන්ගේ වාර්තා ආරක්ෂා කිරීමේ භාරදූර වගකීමක් පැවරේ. ප්‍රශ්න පත්‍ර සහ ප්‍රතිඵල රහස්‍ය තොරතුරු ලෙස සලකමින් රහස්‍යභාවය මෙන්ම ආරක්ෂාව ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි සෑම පියවරක්ම ගන්නා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් විභාග අංශය සමන්විත වේ.

විභාග අංශයේ කාර්යයන්

- ආයතනයේ නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූලව සියලුම විභාග ක්‍රියාවලීන් කළමනාකරණය කිරීම.
- විභාග පැවැත්වීමේදී සිසුන්ගේ විනය නිරීක්ෂණය කිරීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන සමඟ විභාගවලට අදාළ සියලුම සිසුන්ගේ වාර්තා කළමනාකරණය කිරීම.
- මුල් සහතික නිකුත් කිරීම.
- සිසුන්ට පිටපත් සැකසීම සහ නිකුත් කිරීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සියලුම වාර්තා කළමනාකරණය කිරීම.
- අධීක්ෂණ අවශ්‍යතා කළමනාකරණය කිරීම.

වෘත්තීය මාර්ගෝපදේශනය සහ කාර්මික පුහුණු ඒකකය

වෘත්තීය මාර්ගෝපදේශනය සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ජීවිත කාලය පුරාවටම මග පෙන්වීමේ ප්‍රධාන කාර්යයකි. ආයතනිකව අධ්‍යාපනය ලබන සිසුන් ලෝකයට පිවිසීමට පෙර උපාධි අපේක්ෂකයින් සඳහා කාර්මික පුහුණුවකට මුහුණදීමට අවශ්‍ය වේ.

වෘත්තීය මාර්ගෝපදේශන සහ කාර්මික පුහුණු ඒකකය (CGITU) සිසුන්ට ඔවුන්ගේ ඉදිරි කාර්මික පුහුණු වැඩසටහනට හැඩගැසීමට මගපෙන්වීම ලබා දෙයි, එහිදී එම ඒකකය සිසුන්ට ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල සේවා යෝජකයින්ගේ විවිධ කර්මාන්තකරුවන් හමුවීමට සහාය, උපදෙස් සහ මග පෙන්වීම ලබා දෙයි.

මෙම ඒකකයේ ප්‍රධාන අරමුණ වන්නේ සිසුන් කර්මාන්තයට යොමු කිරීම සහ කර්මාන්තයේ අපේක්ෂාවන් සහ සිසුන්ගේ වර්තමාන දැනුම් මට්ටම, කුසලතා සහ ආකල්ප අතර පරතරය අවම කිරීමයි.

CGITU **ඒකකයේ ප්‍රධාන කාර්යයන්**

- කාර්මික පුහුණු වැඩසටහන් සකස් කිරීම, සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- සිසුන්ගේ වෘත්තීය සංවර්ධන සැලැස්ම සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් සහ සහාය ලබා දීම.
- සිසුන් ඔවුන්ගේ දැනුම, කුසලතා සහ කර්මාන්තය කෙරෙහි දක්වන ආකල්ප සමඟින් හැඩගැස්වීම.
- කර්මාන්ත සබඳතාව පවත්වා ගැනීම සඳහා වෘත්තීය පොළවල් සංවිධානය කිරීම.
- කර්මාන්ත විශ්ලේෂණයන් පැවැත්වීම.
- පුහුණු හා සංවර්ධන කටයුතු සිදු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.



NIBM - ජාත්‍යන්තරයට

ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) වසර 54කට වඩා වැඩි උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වයේ උරුමය සහ ශ්‍රී ලංකාවේ හොඳම උසස් අධ්‍යාපන ආයතනය බවට පත්වීමේ දැක්ම සමඟින් ව්‍යාපාර, පරිගණක විද්‍යාව, ඉංජිනේරු, භාෂා, මානව ශාස්ත්‍ර සහ සැලසුම් යන ක්ෂේත්‍රවල අසමසම අවස්ථා උදාකර දී ඇත.

වර්තමානයේ, NIBM ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වේ. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ, රටේ විවිධ ප්‍රදේශවල, විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පිරිසට අධ්‍යාපනය හදාරා පිළිගත් උපාධි ලබා ගැනීමට NIBM ආයතනය මඟින් හැකියාව ලබා දී ඇත.
අපි අවශ්‍යතාවයන්ට අනුරූපව වෙනස්කරන ලද පුහුණු වැඩසටහන් සහ උපදේශන සේවා හරහා කර්මාන්තයේ නිශ්චිත අවශ්‍යතා සපුරා දී ඇත. අපගේ කොළඹ ප්‍රධාන කාර්යාලය, මහනුවර, කුරුණෑගල, ගාල්ල සහ මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථාන, කිරුළපන ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය සහ පේරාදෙණිය ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය හරහා දිවයින පුරා ගුණාත්මක පුහුණුවක් පුළුල් පරාසයකට සහ අපගේ වටිනා සිසුන් වැඩි ප්‍රමාණයකට ලබා ගත හැකි බව සහතික කර ඇත. දැනට අපගේ ඩිජිටල් කැම්පස්හි විවිධ පීඨවල විවිධ පාඨමාලාවන්හි මාර්ගගතව ඉගෙනුම ලබන සිසුන් 12,000කට ආසන්න ප්‍රමාණයක් ඇත.

එබැවින්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස, ජාත්‍යන්තර අධ්‍යයන ප්‍රජාවන් සමඟ ඇති ශක්තිමත් සබඳතා අපගේ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම. සහයෝගිතාවය පෝෂණය කරන අතර අපගේ ඉගෙනුම් ප්‍රජාව ගෝලීය සංස්කෘතියක් බවට පත් කිරීම. ශ්‍රී ලාංකික සිසුන්ට පුළුල් අවස්ථා ලබා දෙන අතරම ජාත්‍යන්තර සිසුන්ට ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලැබීමට සහ උසස් අධ්‍යාපනය ලබා දීමට ද හැකි බව අපි විශ්වාස කරන්නෙමු. මීට අමතරව, තාක්ෂණයේ වර්ධනයන් ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සඳහා අප සමඟ හවුල් වීමට මාර්ග විවෘත කර ඇති අතර දේශීය සහ ජාත්‍යන්තර සිසුන්ට අපගේ ඩිජිටල් මධ්‍යස්ථානයේ මාර්ගගතව අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමි වේ.

එබැවින් NIBM ජාත්‍යන්තර අධ්‍යයන කාර්යාලය, ජාත්‍යන්තර ශාස්ත්‍රීය විශ්ව විද්‍යාල සමඟ ඒකාබද්ධව පර්යේෂණ සහ අධ්‍යාපනික ව්‍යාපෘති සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පෝෂණය කරන අතරම ප්‍රමුඛ පෙළේ විදේශීය උසස් අධ්‍යාපන ආයතන සහ ජාත්‍යන්තර අධ්‍යයන සංවිධාන සමඟ අධ්‍යාපනික සහ පර්යේෂණ සහයෝගිතාව ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම මෙහෙයවනු ලැබේ. සිසුන්ගේ ගෝලීය - ජීවිතය සහ අත්දැකීම් පරිපාලනය කිරීම, ස්ථාන මාරු වැඩසටහන් කළමනාකරණය කිරීම, ශිෂ්‍ය මණ්ඩලය ජාත්‍යන්තර අධ්‍යයනය, සීමාවාසික පුහුණුව සහ විදේශයන්හි පර්යේෂණ අවස්ථාවන් වෙත යොමු කිරීම සඳහා අපගේ කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට ආකර්ෂණීය ගෝලීය ඉගෙනුම් අත්දැකීමක් ලබා දීමට අපි කටයුතු කරන්නෙමු.



අරමුණ

NIBM ජාත්‍යන්තර අධ්‍යයන කාර්යාලය විසින් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සහයෝගීතාවයන් සම්බන්ධයෙන් විද්වතුන් සහ සිසුන් සඳහා සූක්ෂම සේවාවන් පෝෂණය කරමින් ශිෂ්‍ය ජීවිතය, ගෝලීය නියැලීම සහ පලපුරුද්ද, අධ්‍යයන කීර්තිය, පර්යේෂණ සහ සංවර්ධනය ඉහළ නැංවීම සඳහා විවිධ ආයතනික සහාය ලබා දෙන උපායමාර්ගික බහුමාන ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් කළමනාකරණය කිරීම සහ ගොඩනැගීම සඳහා වගකීමට බැඳීම.

විෂය පථය

NIBM ජාත්‍යන්තර අධ්‍යයන කාර්යාලය ජාත්‍යන්තර අධ්‍යයන වැඩසටහන් කළමනාකරණය කරමින්, අධ්‍යයන විශිෂ්ඨත්වය ලඟාකර ගැනීමට පුළුල් පරාසයක දිරි උත්සාහ කිරීම. අපගේ ජාත්‍යන්තර මානව සංවර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ අනාගතයට මුහුණ දීමට සූදානම් ගෝලීය උපාධිධාරීන් බිහි කිරීමට අපගේ උපාධිධාරීන්ට උපකාර කරමින් පර්යේෂණ, ඉගැන්වීම් සහ නවෝත්පාදනවල සහයෝගීතාව වැඩිදියුණු කරන අතරම ගෝලීය උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස NIBM හි පැතිකඩ සංවර්ධනය කිරීමයි.

- ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත ශිෂ්‍ය ස්ථාන මාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තර ශාස්ත්‍රීය සහයෝගීතා වැඩසටහන් - හවුල්කාර විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම.
- ජාත්‍යන්තර උපාධි, ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි පාඨමාලා සංවිධානය කිරීම.
- ජාත්‍යන්තර ජාල සහ සංගමයේ (International Network and Association) සාමාජිකත්වය දැරීම.
- අධ්‍යයන උපාය මාර්ග සමඟ සමපාත වන ජාත්‍යන්තර හවුල්කාරිත්ව සංවර්ධනය කිරීම.
- ශිෂ්‍ය සහයෝගීතා අත්දැකීම ලබා දීම.
- ජාත්‍යන්තර ශිෂ්‍ය සහ ආදි ශිෂ්‍ය බැඳීම - ගෝලීය බැඳීම.
- ගෝලීය ඉගෙනුම් සහ ශිෂ්‍යත්ව සඳහා ඇති අවස්ථා ඇති කිරීම.
- සහයෝගිතා සහ නවෝත්පාදන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- විද්‍යුත් ඉගෙනුම් සහ දුරස්ථ ඉගෙනුම් වැඩසටහන් ශක්තිමත් කිරීම.



විශ්වවිද්‍යාල හවුල්කාරිත්වය

ඩීකින් විශ්වවිද්‍යාලය - ඕස්ට්‍රේලියාව

ඕස්ට්‍රේලියාව ප්‍රමුඛ පෙළේ තෘතීයික අධ්‍යාපන සැපයුම්කරුවෙකු ලෙස වසර 45කට වැඩි පලපුරුද්දක් ඇති ඩීකින් විශ්වවිද්‍යාලය සම්මාන රාශියක් දිනාගෙන ඇති අතර සෑම වසරකම සිසුන් 60,000කට වඩා වැඩි පිරිසකට අධ්‍යාපනය ලබාදෙනු ලැබේ. ඩීකින් විශ්වවිද්‍යාලය අපගේ සිසුන්ට ගෝලීය මට්ටමේ වැඩසටහන් සඳහා අසීමිත අවස්ථා ලබා දේ. ඩීකින්හි දී, නිදහස් ඉගැන්වීම් සහ නව පර්යේෂණ තුළින් අධ්‍යාපනය ඉදිරියට අපි ගෙන යන්නෙමු. අධ්‍යාපනයේ සහ පර්යේෂණවල නවෝත්පාදන සහ විශිෂ්ටත්වය තුළින්, ඩීකින් විශ්වවිද්‍යාලය සමාජ, සංස්කෘතික, ආර්ථික සහ පාරිසරික යහපැවැත්ම වැඩිදියුණු කරන අදහස් නිර්මාණය කරයි. ඕස්ට්‍රේලියාව ඩීකින් විශ්ව විද්‍යාලය, ලෝකයේ හොඳම තරුණ විශ්වවිද්‍යාල 50 අතරට ශ්‍රේණිගත කර ඇති අතර ඕස්ට්‍රේලියානු වික්ටෝරියා ප්‍රාන්තයේ අංක 1 ලෙස ශ්‍රේණි ගත කර ඇත. නව්‍ය සහ දූරදර්ශී, දේශීය හා ගෝලීය වශයෙන් නව මංපෙත් විවර කිරීම සඳහා ඩීකින් විශ්වවිද්‍යාලය කීර්තියක් නිමිකරගන ඇත. ඇත්ත වශයෙන්ම, අප වැඩි වැඩියෙන් ඩිජිටල් අනාගතයක් කරා ගමන් කරන විට, අපගේ සිසුන් හෙට දවසේ රැකියා සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් සන්නද්ධ බව සහතික කිරීම සඳහා නවීන තාක්ෂණය, අති නවීන ඉගෙනුම් මෙවලම් සහ පහසුකම් සඳහා ඩීකින් විශ්වවිද්‍යාලය සඳහා අප ආයෝජනය කර ඇත. විශිෂ්ට කැම්පස් පහක් සහ නම්‍යශීලී අධ්‍යයන විකල්පයන් හරහා පිරිනැමෙන පාඨමාලා සිය ගණනක් සමඟින්, අනාගතය සඳහා ඔබේ ඉලක්ක හඹා යන අතරතුර ඔබට දැන් ඔබේ ජීවන රටාවට ගැලපෙන උපාධියක් මෙමගින් තෝරා ගත හැකිය. NIBM හි පරිගණක සහ ඉංජිනේරු පාසල මෙම වසරේ පෙබරවාරි 19 වන දින ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය සමඟ හවුල් වී තොරතුරු තාක්ෂණ උපාධිය, මෘදුකාංග ඉංජිනේරු උපාධිය (ගෞරව) සහ ව්‍යාපාර විශ්ලේෂණ උපාධිය පිළිබඳ උපාධි වැඩසටහන් පිරිනැමීමට ද කටයුතු කළේය.









ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය - ඕස්ට්‍රේලියාව

ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය නිර්මාණය කරන ලද්දේ වෙනස් ආකාරයේ විශ්වවිද්‍යාලයක් ලෙස එනම් අභියෝගාත්මක සම්මුතීන්, ප්‍රවණතා වලට ප්‍රතිචාර දැක්වීම සහ නව්‍ය ඉගැන්වීම් සහ පර්යේෂණ හරහා පුරෝගාමී විසඳුම් සෙවීම සඳහාය. එහි දී උසස් තත්ත්වයේ උපාධි ලබාදෙමින් අනාගතය සඳහා සිසුන් සූදානම් කිරීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත. අපගේ උපාධි කර්මාන්තය සමඟ සසඳමින් උපදේශනයෙන් සංවර්ධනය කර ඇති අතර අති නවීන පර්යේෂණ මත පදනම්ව, සහ ඕස්ට්‍රේලියාව වඩාත්ම සම්මාන ලත් ගුරුවරුන් විසින් උගන්වනු ලැබේ. ක්වීන්ස්ලන්තයේ (ගෝල්ඩ් කෝස්ට්, ලෝගන් සහ බ්‍රිස්බේන්) ප්‍රධාන නගර තුනක් පුරා පැතිර ඇති අග්නිදිග ක්වීන්ස්ලන්තයේ කැම්පස් පහක් හරහා ග්‍රිෆිත් සිසුන් 50,000කට පහසුකම් සපයනු ලැබේ. සිසුන් ක්වීන්ස්ලන්තය තෝරා ගන්නේ ගුණාත්මක අධ්‍යාපනය සඳහා පමණක් නොව, එහි විශිෂ්ට උපනිවර්තන දේශගුණය, ආකර්ෂණීය පරිසරය සහ ස්වාභාවික අරුම පුදුම දේ සහ විචිත්‍රවත් නගර සමඟ ජීවිතය ගත කිරීම සඳහා ය. ආරම්භයේ සිටම, ග්‍රිෆිත් ආසියානු කලාපයට ගැඹුරින් සම්බන්ධ වී ඇත, පාරිසරික වශයෙන් දැනුවත්ව, ප්‍රජාවට විවෘතව සහ කර්මාන්ත කෙරෙහි අවධානය යොමු කර ඇත. සෑමවිටම එහි කාලයට වඩා ඉදිරියෙන් සිටී, ග්‍රිෆිත් නවීන ආසියානු අධ්‍යයන සහ පාරිසරික විද්‍යාව ඇතුළු වැදගත් ක්ෂේත්‍ර පරාසයක පිහිටා ඇති අතර ඕස්ට්‍රේලියාව පළමු උපාධි හඳුන්වා දුන්නේය. ලොව පුරා විශ්වවිද්‍යාලවල අතර ඉහලම ශේණි ගත කිරීම 2% තුළ සිදු කරනු ලබයි. ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය ගෘහ නිර්මාණ ශිල්පය, ඉදිකිරීම් සහ සැලසුම්, ව්‍යාපාර සහ රජය, අපරාධ විද්‍යාව සහ නීතිය, අධ්‍යාපන, ඉංජිනේරු, තොරතුරු තාක්ෂණ සහ ගුවන් සේවා, මානව ශාස්ත්‍ර, භාෂා සහ සමාජ විද්‍යාව, ඖෂධ, දන්ත වෛද්‍ය විද්‍යාව සහ සෞඛ්‍ය, සංගීතය සහ රංග කලාව, විද්‍යාව සහ පරිසරය, දෘශ්‍ය හා නිර්මාණාත්මක කලා උපාධි පිරිනමයි. NIBM ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සමඟ හවුල් වී තොරතුරු තාක්ෂණය, ඉංජිනේරු සහ ව්‍යාපාර පිළිබඳ උපාධි පිරිනැමීම ආරම්භ කරන ලදී.

විශ්වවිද්‍යාල හවුල්කාරිත්වය

කාර්යසාධනය 2022 - 2022 දී ඕස්ට්‍රේලියාවේ ඩීකින් සහ ග්‍රිෆිත් විශ්වවිද්‍යාල සඳහා සිසුන් මාරු කිරීම් යාවත්කාලීන බඳවාගැනීම

	උපාධි	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ගෙවීම් කර ලියාපදිංචි ව)
ඩීකින් විශ්ව විද්‍යාලය	ව්‍යාපාර විශ්ලේෂණ උපාධිය	12
	මෘදුකාංග ඉංජිනේරු උපාධිය (ගෞරව)	20
	තොරතුරු තාක්ෂණ උපාධිය	-
	උප එකතුව	32
ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය	ව්‍යාපාරවේදී උපාධිය	47
	ඉංජිනේරු (ගෞරව) සිවිල් ඉංජිනේරු උපාධිය	1
	බුද්ධිමය ඩිජිටල් තාක්ෂණය පිළිබඳ උපාධිය	-
	ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳ උපාධිය	-
	උප එකතුව	48
මුළු එකතුව		80

සටහන: මෙම සිසුන් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය තුළ වසර 1 - 2ක අධ්‍යාපනයෙන් පසු මාරු කරනු ලැබේ.

1. ඕස්ට්‍රේලියානු දිනය - ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස්, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල නියෝජිතයින්, ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ විද්වතුන්ගේ හා ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් 250කගේ සහභාගීත්වයෙන් 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ කොළඹ හිල්ටන් හි දී සංවිධානය කිරීම.

2. ඕස්ට්‍රේලියාවේ Griffith විශ්වවිද්‍යාලය අන්තර්ජාලය ඔස්සේ ජාත්‍යන්තර කථිකාචාර්යවරුන්ගේ සහභාගීත්වය ඇතිව ආරාධිත දේශන මාලාවක් පැවැත්වීම සහ Griiffth විශ්වවිද්‍යාලයට සහ අනාගත සිසුන් සඳහා ආරාධනා කිරීම.

3. වත්මන් ඩීකින් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය කණ්ඩායම සහ ඩීකින් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනාගත සිසුන් සඳහා ආරාධිත දේශන සැසි පැවැත්වීම ඇතුළුව ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්ව විද්‍යාලයේ සිට NIBM වෙත ජාත්‍යන්තර අධ්‍යයන චාරිකා සඳහා පහසුකම් සැලසීම

4. වත්මන් ස්ථාන මාරු කණ්ඩායම් සඳහා වීසා ලබාගැනීම සඳහා උපදේශන පැවැත්වීම.

5. ඕස්ට්‍රේලියානු දින උත්සව සඳහා පහසුකම් සලසමින් වසරේ විවිධ බඳවාගැනීම් වලදී විවෘත දිනයන් සංවිධානය කිරීම.

6. 2023 ස්ථාන මාරු සිසුන් සඳහා IELTS අධ්‍යයන වැඩසටහන සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම.

2023 සඳහා සැලසුම් - පියවරක් ඉදිරියට අධ්‍යාපනය තුළින් ගෝලීය ජීවිතය ප්‍රවර්ධනය කරමින් ජාත්‍යන්තර අධ්‍යයන කාර්යාලය වෙත නව වර්ධනයන් ගෙන ඒමට අපි බලාපොරොත්තු වෙමු.

- NIBM හි ජාත්‍යන්තර අධ්‍යයන කාර්යාලය හරහා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සහයෝගිතා සහ හවුල්කාරිත්වයන් ඇතිව විවිධ පීඨවල උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් ස්ථාපිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන කාර්යමණ්ඩලය සමඟ පර්යේෂණ සිදුකිරීමේ හවුල්කාරිත්වය වර්ධනය කිරීම.

වර්තමානය වනවිට පහත සඳහන් විශ්ව විද්‍යාල සමඟ මූලික වශයෙන් ඉදිරියේදී ඉංජිනේරු, සැලසුම්, ව්‍යාපාර සහ නීති යන ක්ෂේත්‍රවල විෂයයන් NIBM හි අදාළ පීඨ සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා විවිධ විශේෂීකරණයන් පිරිනැමීමට සාකච්ඡා කරමින් පවතී.

- ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය - ඕස්ට්‍රේලියාව
- යුරල් ෆෙඩරල් විශ්වවිද්‍යාලය - රුසියාව
- ඕස්ට්‍රේලියාව ෆෙඩරේෂන් විශ්වවිද්‍යාලය

NSBM GREEN UNIVERSITY



NIBM පනතේ විධිවිධාන මත පදනම්ව ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ පාලක සභාව 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය (NSBM) නමින් ව්‍යාපාරික පාසලක් වාණිජ ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමට තීරණය කළේය. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් රාජ්‍ය ව්‍යවසායන්හි සභාපතිවරු සහ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ලබා දී ඇති මාර්ගෝපදේශකය අනුව මෙය ආරම්භ කරන ලදී. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් ලෙස NSBM ආයතනය පිහිටුවා ක්‍රියා කරයි.

NSBM දැක්ම

ජාත්‍යන්තරව පිළිගත් ශ්‍රී ලංකාවේ හොඳම ක්‍රියාකාරී උපාධි පාසල බවට පත්වීම.

NSBM මෙහෙවර

ව්‍යාපාර ඉල්ලා සිටින ගෝලීය වශයෙන් තරඟකාරී සහ වගකීම් සහගත උපාධිධාරීන් සංවර්ධනය කිරීම, අපගේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීව වැඩ කිරීම සහ සමාජයට අපගේ දායකත්වය ලබාදීම.

NSBM පාලනය සහ කළමනාකරණය

මහාචාර්ය ඊ. ඒ. වීරසිංහ
උපකුලපති, අධ්‍යක්ෂක

මහාචාර්ය චමින්ද රත්නායක
නියෝජ්‍ය උපකුලපති, අධ්‍යක්ෂක

මහාචාර්ය ජේ. බී. දොඩන්කොටුව
අධ්‍යයන සංවර්ධන සහ තත්ත්ව සහතික ප්‍රධානී,

ආචාර්ය එච්.ආර්.ආර්.ඒ. රණවීර
පීඨාධිපති, පරිගණක පීඨය, අධ්‍යක්ෂක

ආචාර්ය චන්දන පෙරේරා
පීඨාධිපති, ඉංජිනේරු පීඨය, අධ්‍යක්ෂක

තිළිණි ද සිල්වා මහත්මිය
පීඨාධිපති, ව්‍යාපාර පීඨය, අධ්‍යක්ෂක

වෛද්‍ය කේ ඒ එන් නුවන්ති කටුවාවිල
පීඨාධිපති, විද්‍යා පීඨය, අධ්‍යක්ෂ

ආචාර්ය සී. සී. බී. විජේසිංහ
පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන සහ වෘත්තීය උසස්වීම් පීඨය

වී.කේ. චොක්සි, (P.C.) මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

ජී.සී. වික්‍රමසිංහ මෙනවිය
විධායක නොවන අධ්‍යක්ෂ

කේ. එස්. එම්. ද. සිල්වා මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

ආචාර්ය එම්. එම්. පී. ප්‍රේමකුමාර
විධායක නොවන අධ්‍යක්ෂ

ඩී. ටී. එස්. එච්. මුදලිගේ මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

මහාචාර්ය ඒ. එච්. එන්. කාරියවසම්
විධායක නොවන අධ්‍යක්ෂ

එම්. එස්. මිහිඳුකුල මහත්මිය
විධායක නොවන අධ්‍යක්ෂ

NSBM සත්‍ය වශයෙන්ම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක්

NSBM හරිත විශ්වවිද්‍යාලය මුලින්ම 2011 වර්ෂයේදී ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව පාසල (NSBM) නමින් ආරම්භ කරන ලද්දේ දිගු කලක් පැවති අදහසක් යථාර්ථයක් බවට පත් කරමිනි. එය ශ්‍රී ලංකාව තුළ දැනුම පදනම් කරගත් ආර්ථිකයක් ගොඩනැගීමේ අරමුණ ඇතිව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2011 ඔක්තෝබර් 7 වැනි දින ආරම්භ කරන ලදී. NSBM යනු අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන උසස් අධ්‍යාපන ආයතනයකි.



2022 වසර ශ්‍රී ලංකාවට තවත් අභියෝගාත්මක වසරක් වූ අතර විදේශ විනිමය සංචිතවල හිඟය, විදේශ ණය වැඩිවීම, මුදල් ඒකකය නිදහස්ව ඉහළ පහළ වැටීම, අංක දෙකක උද්ධමනය ඇති වීම ආදිය හේතුවෙන් ආර්ථික තත්ත්වය අවුල් සහගත විය. NSBM හරිත විශ්වවිද්‍යාලය අවිනිශ්චිත හා වේගයෙන් වෙනස් වන පරිසරයක මෙම අභියෝගවලට අබණ්ඩව මුහුණ දෙමින් NSBM සැබෑ ශ්‍රී ලාංකේය උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස විශිෂ්ට අයුරින් සිය මූල්‍ය අරමුණු තිරසාරව සාක්ෂාත් කර ගෙන ඇත.

වසංගත සහ ආර්ථික අස්ථාවර තත්ත්වය තුළ බොහෝ විශ්වවිද්‍යාලවල බඳවාගැනීම් සංඛ්‍යාව අඩුවෙමින් පවතින අතර, NSBM ඉතිහාසයේ වාර්තාගත නව සිසුන් බඳවාගැනීම් සංඛ්‍යාවක් සමඟින් NSBM ශිෂ්‍ය සංඛ්‍යාව 2022 දී සුවිශේෂී ලෙස ඉහළ යෑමක් දක්නට ලැබුණි. NSBM හරිත විශ්වවිද්‍යාලය සිය කෙටි නමුත් ජයග්‍රාහී වසර හයක කැපී පෙනෙන සහ තේජාන්විත ගමනෙහි මූලික අරමුණොහි අදහස සන්ධිස්ථානයක් ලෙස සනිටුහන් කළ වසරයි. එබැවින්, NSBM උපාය මාර්ගික මෙහෙයුම් ක්‍රියාවලියෙන් විශිෂ්ට වූ සහ අරමුණු පිළිබඳ සාමූහික හැඟීමක් සහ සාමූහික වටිනාකම් තුළින් මූල්‍ය තිරසාරභාවයක් අත්කර ගත් වසරක් ලෙස 2022 වසර හැඳින්විය හැකිය.

කීර්තිමත් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන සමඟ අනුබද්ධ වීම පිළිබඳව නිරන්තරයෙන් විමසිල්ලෙන් සිටින ආයතනයක් ලෙස, 2022 වර්ෂයේ දී දිගුකාලීන අධ්‍යයන හවුල්කරුවන් වන එක්සත් රාජධානියෙහි Plymouth විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා විශ්වවිද්‍යාලය, අයර්ලන්තය ඩබ්ලින් විශ්වවිද්‍යාලය සමඟ සහයෝගිතාවයන් ශක්තිමත් කළ වසරකි - මෙම උපාධි වැඩසටහන් ශ්‍රී ලංකාවේ දියත් කිරීම ජාත්‍යන්තර අවස්ථා සොයමින් රට හැර යාමට තීරණය කරන බොහෝ තරුණ සිත් අධෛර්යමත් කළ අතර එය ශ්‍රී ලංකාව ආසියාවේ දැනුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කරමින් NSBM හි බලාපොරොත්තු වන අරමුණ ලඟාකර ගැනීම ශක්තිමත් කළේය.

එබැවින්, NSBM හරිත විශ්වවිද්‍යාලයහි දැක්ම සහ අරමුණ තුළින් අපේක්ෂා කරන පරිදි, වර්ධනය ශක්තිමත් කිරීම, බාධා ජය ගැනීම සහ එහි පැවැත්ම පුළුල් කර ශ්‍රී ලංකාවේ අධ්‍යාපන භූමිය ප්‍රතිනිර්මාණය කිරීම තුළින් 2021 මූල්‍ය වර්ෂය අවසානයේදී ආයතනය තවත්

NSBM සත්‍ය වශයෙන්ම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක්

ඉදිරියට ගමන්කිරීම සිදු වී ඇත. එපමණක් නොව, ආයතනයක් ලෙස NSBM හරිත විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ අනාගත පරපුරේ සහජ ශක්තීන් සහ විභවයන් උපයෝගී කර ගැනීමේ අරමුණින් අනාගත අධ්‍යාපනය සඳහා වන ගමන් මඟ අඛණ්ඩව අර්ථ දක්වා ඇත. පශ්චාත් උපාධි අධ්‍යයනය සහ වෘත්තීය සංවර්ධන පීඨය NSBM ආයතනයේ නවතම එකතු කිරීමක් වන අතර, විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි අවසාන උසස් කිරීම සහ සංවර්ධනය කිරීමේ අරමුණින් 2022 වසර සඳහා ඇතුළත් විය.

උසස් අධ්‍යාපනය තුළ අංශක 360 විසඳුම් සැපයුම්කරු ස්ථාපනය කරමින් පශ්චාත් උපාධි අධ්‍යයනය සහ උසස් අධ්‍යාපන පීඨය යටතේ ආචාර්ය උපාධිය සඳහා පළමු සිසුන් උපාධිය ලබා ගැනීම මෙම වසර තුළදී සිදු කරන ලදී. NSBM හරිත විශ්වවිද්‍යාලය සිය ඉංග්‍රීසි සහ නවීන භාෂා දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපනය කරමින් ගෝලීය උපාධිධාරීන් බිහි කිරීම සඳහා තවත් පියවරක් ගෙන ඇත.

2022 වසර වනවිට, NSBM දැනට වසරකට ආසන්න වශයෙන් නව බඳවා ගැනීම් 4400ක් පමණ සිදුකර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විෂය සීමාව හෝ ඉහල කීර්තිමත් ගෝලීය වශයෙන් ශ්‍රේණිගත කරන ලද විදේශීය විශ්ව විද්‍යාල සමඟ සහයෝගීතාවයෙන් උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා 50කට ආසන්න ප්‍රමාණයක් හදාරනු ලබන සිසුන් 11,000ක් පමණ නේවාසිකව ව්‍යාපාර පීඨය, පරිගණක පීඨය, ඉංජිනේරු පීඨය, විද්‍යා පීඨය, පශ්චාත් උපාධි අධ්‍යයන සහ වෘත්තීය සංවර්ධන පීඨය යන පීඨ 5 තුළ සිටී.

හරිත විශ්වවිද්‍යාල අත්දැකීම මීළඟ මට්ටමට සකසමින්, 2021 දී, NSBM විසින් NSBM හරිත විශ්වවිද්‍යාල ව්‍යාපෘතියේ II අදියරේ ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර, විශ්වවිද්‍යාල පරිශ්‍රයට යාබදව තවත් අක්කර 15ක් එක් කරමින්, නීති පීඨය, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය යන අලුතින් යෝජිත නව පීඨ තුන ඉදිකිරීමත් සමඟ පිරිනැමෙන පහසුකම් තවදුරටත් පුළුල් වනු ඇත. NSBM විසින් 5 වන සැමරීමට සමගාමීව, NSBM හරිත විශ්වවිද්‍යාලය -II අදියර මූලික ඉදිකිරීම් වල එක් අවස්ථාවක් ලෙස නව ක්‍රීඩා පිටිය විවෘත කරන ලදී.

එබැවින්, NSBM හරිත විශ්වවිද්‍යාලයට 2022 මූල්‍ය වර්ෂය, එහි දැක්ම සහ අරමුණ තුළින් අපේක්ෂා කරන පරිදි, වර්ධනය ශක්තිමත් කරමින්, උවදුරු ජයග්‍රහණය කර ගනිමින් සහ එහි පැවැත්ම පුළුල් කරමින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රතිනිර්මාණය කිරීමේ තවත් ඉදිරි මාවතකි.

ආදායම	- රුපියල් මිලියන 4,030 කි
මෙහෙයුම් ලාභය	- රුපියල් මිලියන 1,632 කි
බඳවාගත් සිසුන් සංඛ්‍යාව	- 4,422
උපාධිධාරී සිසුන් සංඛ්‍යාව	- 2,111
සමස්ත විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව	- 12,038
මුළු වත්කම්	- රුපියල් මිලියන 14,281

මෙහෙයුම් සමාලෝචනය

වසරේ ක්‍රියාකාරකම්වල සුවිශේෂ අවස්ථා

NSBM හරිත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන භූමිය තුළ කාර්යසාධන ව්‍යුහය ව්‍යාපාර, පරිගණකකරණය, ඉංජිනේරු සහ සැලසුම්, විද්‍යාව සහ පශ්චාත් උපාධි අධ්‍යයන යන ප්‍රධාන විෂය ධාරාවන් පහකට කේන්ද්‍රගතව සිදු කරනු ලැබේ. ඒවා ඔවුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රයේ දැනුම විහිදුවන සුවිශේෂී පීඨ පහක් යටතේ ව්‍යුහගත වී ඇත.

ආර්ථික අර්බුදයට අපගේ ප්‍රතිචාරය නිරන්තර මහජන නැගිටීම් මධ්‍යයෙ, සමස්ත සංචරනය සීමා කිරීම් හමුවේ NSBM විසින් සැලසුම් කළ පරිදි ශිෂ්‍ය අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම සහතික කිරීම සඳහා භෞතිකව සහ ඩිජිටල් වේදිකා හරහා සියලුම අධ්‍යයන කටයුතු කරන ලදී. වසංගතය අතරතුර ඩිජිටල් වේදිකා හඳුන්වාදෙමින් අවිනිශ්චිතතාවයන්ට මුහුණ දෙමින් සමස්ත මෙහෙයුම් ක්‍රමවත්ව සිදු කිරීමට උපකාර විය.

NSBM අඛණ්ඩව ශ්‍රී ලංකාව පුරා සිටින කර්මාන්ත නිමිකරුවන් සහ හවුල්කරුවන් සමඟ සබඳතා වර්ධනය කර ගනිමින් වෘත්තීය අවස්ථා වැඩිදියුණු කිරීමට කටයුතු කළේය. ආයතනික 500% කට වඩා වැඩි සංඛ්‍යාවක් සමඟ NSBM රැකියා අවස්ථා සඳහා අනුගමනය කළ යුතු මාර්ග නිර්මාණය කරන බව මේ තුලින් සහතික කර ඇත.

2022 දෙසැම්බර් 31 වනවිට රුපියල් බිලියන 7.145ක ණය හිඟයක් සහිතව පවතින මූල්‍ය ස්ථාවරත්වය ප්‍රමුඛතම උපායමාර්ගික තීරණය වේ. කළමනාකරණය විසින් මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපනයන් සමඟ කාරක ප්‍රාග්ධන කළමනාකරණය ප්‍රශස්ත ලෙස පවත්වාගැනීමේ ක්‍රම හොඳින් විශ්ලේෂණය කරනු ලබයි. තිරසාර සංවර්ධනය සහතික කිරීම සඳහා මූල්‍ය සහ ව්‍යාපාර කාර්යසාධනය පිළිබඳ ඉහල කළමනාකාරිත්වයට වාර්තා කිරීම සඳහා කමිටු පත් කරන ලදී.

ඉහල කාර්යක්ෂමතාවයක් සහ ඵලදායිතාවයක් පෙන්නුම් කරන ප්‍රශස්ත කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාවක් සමගින් විශ්වවිද්‍යාලය කටයුතු මෙහෙයවනු ලබන බැවින් NSBM කාර්ය මණ්ඩලයේ සුභසාධනයට වඩා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙයි. එබැවින්, ඉහල අනුපාත යටතේ බදු පැනවීම, උද්ධමනය සහ විදේශ විනිමය වෙළඳපොළෙහි අර්බුධකාරී තත්වයන් හේතුවෙන් ඉහල යන ජීවන වියදමට සරිලන පරිදි මුදල් සහ මුදල් නොවන ප්‍රතිලාභ සමාලෝචනය කර අවශ්‍ය විකල්ප ක්‍රමවේද හඳුනාගන්නා ලදී. අර්බුද මධ්‍යයේ NSBM කාර්ය මණ්ඩලයට සෑම තරාතිරමකම නිසි පුහුණුවක් සහ සංවර්ධනයක් ලබා දෙන බවට සහතික වූ අතර පුහුණුව, සංවර්ධනය සහ සෞඛ්‍ය ප්‍රතිලාභ සඳහා වසර තුළ රුපියල් මිලියන 29කට ආසන්න මුදලක් ආයෝජනය කර ඇත.


බාහිර පරිසරයේ නිරන්තරයෙන් සිදුවන බාධාවන් සහ තර්ජන නොතකා අඛණ්ඩ වර්ධනය සහතික කිරීමට සුදුසු පද්ධතීන් සහ කළමනාකරණයක් පවතින බව NSBM ආයතනය විසින් සහතික කර ඇත. බඳවා ගන්නා සිසුන් උපාධි ලබාගැනීමෙන් පසු දේශීය හා විදේශීය වෙළඳපොලේ රැකියා නියුක්ත වීම සහතික කිරීම සඳහා ඉදිරිපත් කර ඇති උත්සාහයන් ප්‍රමාණවත් බව NSBM විශ්වාස කරන අතර, දිගුකාලීන ආයතනික අරමුණු සාර්ථකව සාක්ෂාත් කර ගැනීම සඳහා අප ක්‍රියාත්මක කරන සෑම අංශයක්ම පර්යේෂණ සහ වෘත්තීය දියුණුව සඳහා අනාගතයේ දී විශිෂ්ට වනු ඇත.

බඳවාගැනීම් වල වර්ධනය

ශ්‍රී ලංකාවේ පවතින පශ්චාත් වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය මධ්‍යයේ විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවාගැනීම අභියෝගයක් ලෙස සලකනු ලැබූ වකවානුවක, NSBM 2022 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය බඳවා ගැනීම් වැඩසටහන් දෙකකින් සමන්විත වාර්තාගත සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් කරගන්නා ලදී. NSBM ආයතනික සැලැසුම්කරන ලද ඉලක්කවලට අනුකූලව, 2022 දෙසැම්බර් 31 වනදා වන විට මුළු විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව 10,920 ක් සමඟ ස්ථාවරව පැවතුනි.


මෙහෙයුම් සමාලෝචනය

	NSBM (UGC අනුමත උපාධි)	University College Dublin	Plymouth University	Victoria University	මුළු එකතුව
ව්‍යාපාරික පීඨය	3,084	279	2,579	176	6,118
පරිගණක පීඨය	1,688	172	2,329	129	4,298
ඉංජිනේරු පීඨය	522	-	121	-	643
විද්‍යා පීඨය	208	-	62	-	270
පශ්චාත් උපාධි පීඨය	709				709
විශ්වවිද්‍යාලයේ සිසුන්	**6,211**	**451**	**5,091**	**305**	**12,038**
ව්‍යාපාරික පීඨය	527	117	565	26	1235
පරිගණක පීඨය	172	75	368	25	640
ඉංජිනේරු පීඨය	73	-	-	-	73
පශ්චාත් උපාධි පීඨය	163	-	-	-	163
උපාධිධාරීන් ගණන	**935**	**192**	**933**	**51**	**2,111**




ශිෂ්‍ය බඳවාගැනීමේ ධනාත්මක වර්ධනය සහ ශිෂ්‍ය රැඳවා ගැනීමේ ඉහළ අනුපාත NSBM විසින් සෑම වසරකම අත්පත් කර ගැනීම, දේශීය අධ්‍යාපන ව්‍යුහය යටතේ සහ එක්සත් රාජධානිය, අයර්ලන්තය සහ ඕස්ට්‍රේලියාව ඇතුළු ලොව පිළිගත් ගමනාන්තයන් යටතේ විවිධ විෂය ක්ෂේත්‍රයන්හි විවිධ විකල්ප පරාසයක ඇති විශිෂ්ට උසස් අධ්‍යාපනය අවස්ථා ලබා දීම ආදිය සම්බන්ධයෙන් ආයතනය නිමිකරගෙන ඇති කීර්තිය උක්ත ප්‍රස්ථාර සටහනින් පෙන්නුම් කරයි.

සියළුම සිසුන් - විශ්වවිද්‍යාල අනුව




NSBM (UGC අනුමත උපාධි)	6191
ඩබ්ලින් විශ්වවිද්‍යාලය	451
ප්ලයිමවුත් විශ්වවිද්‍යාලය	5091
වික්ටෝරියා විශ්වවිද්‍යාලය	305

සියළුම සිසුන් - පීඨ අනුව




ව්‍යාපාරික පීඨය	6,118
පරිගණක පීඨය	4,298
ඉංජිනේරු පීඨය	643
විද්‍යා පීඨය	270
පශ්චාත් උපාධි පීඨය	709

උපාධිධාරී සිසුන් - විශ්වවිද්‍යාල අනුව



NSBM (UGC අනුමත උපාධි)	935
ඩබ්ලින් විශ්වවිද්‍යාලය	192
ප්ලයිමවුත් විශ්වවිද්‍යාලය	933
වික්ටෝරියා විශ්වවිද්‍යාලය	51

උපාධිධාරී සිසුන් - පීඨ අනුව




ව්‍යාපාරික පීඨය	1,235
පරිගණක පීඨය	640
ඉංජිනේරු පීඨය	73
පශ්චාත් උපාධි පීඨය	163

මූල්‍ය සමාලෝචනය

මූල්‍ය කාර්ය සාධනය

NSBM විසින් (ඉහළ ප්‍රාග්ධන ආයෝජනයක් සහිත ආයතන සමඟ පොදුවේ) භාවිතා කරන ප්‍රධාන මූල්‍ය තිරසාර ප්‍රමිතිය වන්නේ පොලී, බදු, ක්ෂයවීම් සහ ක්ෂයවීම් වලට පෙර ඉපැයීම් (EBITDA) වේ. අපගේ රුපියල් බිලියන 8.6ක කාලීන ණය සඳහා පාලනය කළ නොහැකි දැවැන්ත ණය පොලිය මුළු ලාභයෙන් සැලකිය යුතු කොටසක් අවශෝෂණය කරන බැවින් මේ පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

මෙහෙයුම් ක්‍රියාකාරකම් වල තිරසාර වර්ධනයත් සමඟ ආයතනයේ දළ ලාභය රුපියල් මිලියන 2,922ක් (2021 දී රුපියල් මිලියන 2,456) වේ. වසර සඳහා දළ ලාභ ආන්තිකය 2021 වර්ෂයේ 70.38% සිට 72.5% දක්වා සුළු වශයෙන් වැඩි වී ඇත. මෙහෙයුම් ආන්තිකය ප්‍රවණතාවය සහ වර්ධනය 2021 වසරේ සිට 39.75% සිට සලකා බලන විට වසර තුළ 40.49% දක්වා වැඩිදියුණු වේ. වසර තුළ මූල්‍ය කාර්ය සාධනය අතිශයින් ධනාත්මක වූ අතර වසර සඳහා අතිරික්තය සමඟ




වසරේ මුල් කාර්තුවේ පැවති ප්‍රවණතා දෙවන කාර්තුව ආරම්භයේදී පහත වැටීමට පටන් ගත් අතර වසරේ දෙවන අර්ධය තුළ එහි උච්චතම ස්ථානයට පැමිණියේය. පවතින අහිතකර ආර්ථික තත්ත්වයන් සහ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති 2022 වර්ෂය තුළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන කාර්යසාධනයේ පහළම අගයට ඍණාත්මක බලපෑමක් ඇති කළේය. 2021 දී වාර්තා වූ රුපියල් මිලියන 678 ට සාපේක්ෂව 2022 වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් මිලියන 191 දක්වා අඩු විය, එනම් 71.86% ක අඩුවීමක් (2021: 44.53% ක වැඩිවීමක්) වාර්තා විය.

2021 වසරට සාපේක්ෂව ශුද්ධ ලාභයේ 72% කින් අඩුවීමට මෙම වසර තුළ බරිත සාමාන්‍ය මූලික ණය දීමේ අනුපාතයෙහි (AWPLR) වැඩිවීම හේතු විය. මෙහෙයුම් ලාභයෙන් 95.45% ක් වූ වැඩි වූ පොලී වියදම් (2021 දී 45.08%) පියවා ගැනීම සඳහා සමාගම රුපියල් මිලියන 1,558 (2021 දී රුපියල් මිලියන 625) සේවයේ යොදවා ඇත. මෙය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය කාලය සඳහා 4.73% ක ශුද්ධ ලාභ අනුපාතයෙන් (2021දී 19.42%) පිළිබිඹු වේ.

පොලී සහ බදුවලට පෙර ඉපැයීම් රුපියල් මිලියන 1,632 ක් විය. (2021දී රුපියල් මිලියන 1,387 කි). මෙම වසරේ මෙම වටිනාකම් ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ ආදායම ඉහළ යාමයි.

ඉලක්කම් දෙකේ උද්ධමනය මෙහෙයුම් පිරිවැය කෙරෙහි අහිතකර ලෙස බලපානු ලැබුවද, වියදම් කළමනාකරණය කිරීමට ගත් විචක්ෂණ ක්‍රියාමාර්ග, පොලී සහ බදුවලට පෙර ලාභය වැඩිදියුණු කිරීමට ධනාත්මක බලපෑමක් ඇති කළේය.


2022 දෙසැම්බර් 31 වනවිට NSBM ප්‍රබල සහ නිරවුල් වඩා හොඳ ශුද්ධ වත්කම් තත්ත්වයක් අඛණ්ඩව පවත්වා ගෙන ගොස් ඇති අතර විශ්වවිද්‍යාලය රුපියල් මිලියන 3,747ක ශුද්ධ වත්කම් සන්තකයේ පවතී. (2021 දී රුපියල් මිලියන 1,600).



ආදායම්

ආදායම ප්‍රධාන වශයෙන් NSBM සිසුන් බඳවාගැනීමේ යෝජනා ක්‍රමය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ (MOHE) යෝජනා ක්‍රමය යටතේ සහනදායී මිලකට බඳවා ගන්නා සිසුන්ගෙන් ලැබෙන පාඨමාලා ආදායමින් සමන්විත වේ. පාඨමාලා ගාස්තු මුළු ආදායමෙන් 97%ක් වන අතර ඉතිරි 3% ලියාපදිංචි ගාස්තු, උපාධි පාඨමාලා ගාස්තු, පුස්තකාල ගාස්තු සහ පහසුකම් ගාස්තු ආදී ලෙස ආයතනයට ලැබෙන මුදල් වේ.

විදේශ මුදල් ගනුදෙනු සඳහා පනවා ඇති සීමාවන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලැබීමට අවස්ථාව විවර කළ අතර NSBM 2022 ඔක්තෝම්බර් මාසයේදී සිය විශාලතම බඳවාගැනීම (ශිෂ්‍යයින් 4000) සිදු කරන ලදි. සිසුන් සඳහා ඉගෙනුම් අවස්ථා වැඩිදියුණු කිරීම මඟින් NSBM මෙම අවස්ථාව කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගත්තේය. මීට අමතරව, ආයතනය 2022 වසර සඳහා පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය (IFSLS) යටතේ සිසුන් 1143 ක් සහනාධාර යෝජනා ක්‍රමය යටතේ අන්තර්ග්‍රහණය කර ගත් අතර, එය 2016 වසරේ සිට NSBM ඉතිහාසයේ ඉහලම බඳවාගැනීම වේ.



2022 වර්ෂයේදී විශාලතම ආදායම් මාර්ගය වන පාඨමාලා ගාස්තුව සමස්ත මෙහෙයුම් ආදායමෙන් 97.03%ක් (2021 දී 87% රුපියල් මිලියන 3,415 සිට රුපියල් මිලියන 3,911 දක්වා රුපියල් මිලියන 540කින් වර්ධනය විය. වාර්ෂික බඳවාගැනීම් ක්‍රමයෙන් වැඩි වුවද, වර්ධනය වන පාඨමාලා ආදායමට ප්‍රධාන දායකත්වය සපයන්නේ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම නිසා වන අතර, ආයතනයේ වර්ධන අපේක්ෂාවන් වැඩිවන පාඨමාලා ගාස්තුවෙන් මනාව පිළිබිඹු වේ.

ලියාපදිංචි ගාස්තුව 2021 වසරේ රුපියල් මිලියන 30 සිට රුපියල් මිලියන 47 දක්වා මෙම මූල්‍ය වර්ෂයේදී 53% කින් (2021 දී 12 %කි) වර්ධනය විය. වසර තුළ උපාධි පාඨමාලා ගාස්තු 12% කින් වර්ධනය වූ අතර එතුලින් පසුගිය වසර පුරා NSBM විසින් බිහිකරන ලද උපාධිධාරීන් සංඛ්‍යාව ඉහළ යාම පෙන්නුම් කරයි. 2021 වසරේ රුපියල් මිලියන 15ක් වූ නේවාසිකාගාර ගාස්තු 2022 වර්ෂයේදී රුපියල් මිලියන 58 දක්වා ඉහළ ගියේ ප්‍රධාන වශයෙන් 2022 වර්ෂයේදී භෞතික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් සම්පූර්ණයෙන්ම ආරම්භ කිරීම හේතුවෙනි.

වියදම්


මෙහෙයුම් ක්‍රියාකාරකම් වල වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස සමස්ත සෘජු වියදම් රුපියල් මිලියන 1,108 දක්වා 7.23%කින් (2021 දී 15%) වර්ධනය විය. රුපියල් මිලියන 381ක වැටුප් සඳහා වියදම (34.37%) අධ්‍යයන කාර්ය මණ්ඩලය වැඩි කිරීම සඳහා යොදවන ලදී. ඉහල යන ජීවන වියදමට සහ සෘජු බදුවලට හිලව් ගෙවීමේ ප්‍රතිලාභයක් ලෙස කළමනාකාරිත්වය විසින් වර්ෂය තුළ වැටුප් වැඩි කරන ලදී.


විදේශ ප්‍රේෂණ රුපියල් මිලියන 613 දක්වා (2021 දී මිලියන 682) 10.15%කින් සුළු වශයෙන් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ 2021 වසරේ උසස් පෙළ විභාගය කල් දැමීමත් සමඟ බඳවා ගැනීම් ප්‍රමාද වීමයි. විදේශ ප්‍රේෂණ මුළු සෘජු වියදම්වලින් 55.3%ක් (2021 දී 66%) වේ.

බදු ගෙවීමෙන් පසු මුළු වියදමෙන් 32.6 % ක් (2021 දී 37.71 %) නියෝජනය කරන පරිපාලන වියදම්, 21.51 % කින් (2021 දී 1%) වර්ධනය විය. කාර්යක්ෂම හා ඵලදායී පරිපාලන ශ්‍රම බලකාය සඳහා රුපියල් මිලියන 246 දක්වා වැටුප් 8.08 % කින් වැඩි කිරීම, එය සමස්ත පරිපාලන වියදම්වලින් 18.86% (2021 දී 21.2 %) කි. උද්ධමනය ඉලක්කම් දෙකක අනුපාතයකින් සහ ගාස්තු ඉහල යාමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂයේදී විදුලිබල වියදම රුපියල් මිලියන 41 සිට රුපියල් මිලියන 62 දක්වා 48.26 % කින් සහ අනෙකුත් උපයෝගිතා පිරිවැය රුපියල් මිලියන 459 දක්වා (2021 දී රුපියල් මිලියන 322) 42.47 % කින් ඉහල ගියේය.

භෞතික මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා NSBM විවෘත කිරීමත් සමඟ සිසුන්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා රුපියල් මිලියන 12ක් වැය කර ඇති අතර, එය 2021 වර්ෂයේ සිට රුපියල් මිලියන 10 ක වැඩිවීමක් වේ. සමාගම විසින් වර්ෂය තුළ සියලුම දේපල සහ උපකරණ නැවත ඇගයීම සිදු කරන ලද අතර එම නිසා ක්ෂයවීම් සහ ක්ෂය කිරීම් රුපියල් මිලියන 526 දක්වා (2021 දී රුපියල් මිලියන 481) 9.38 % කින් වැඩි විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද දැඩි මූල්‍ය ප්‍රතිපත්තියන්හි බලපෑම මත එහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය බර තබන ලද මූලික ණය දීමේ අනුපාතිකය (AWPLR) වැඩි වීම සිදුවිය.

මූල්‍ය වර්ෂය	2022		2021	
	රු. මිලියන	%	රු. මිලියන	%
සෘජු වියදම්	1,108	27.6%	1,034	36.3%
පරිපාලන වියදම්	1,307	32.6%	1,075	37.7%
පොලී වියදම	1,558	38.9%	625	21.9%
බදු වියදම්	36	0.9%	117	4.1%





මූල්‍ය තත්වය

NSBM හරිත විශ්වවිද්‍යාලයේ ජංගම නොවන වත්කම්වලට ප්‍රධාන වශයෙන් 2016 හි NSBM හරිත විශ්වවිද්‍යාල නගර ව්‍යාපෘතියේ ආයෝජනය කිරීම ඇතුළත් වේ. 2019 දී, NSBM විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඇතිකරන ලද වසර 30ක බදු ගිවිසුම යටතේ එහි II අදියර ආයෝජනය කිරීම සඳහා NSBM පරිශ්‍රයට වෙන්කරන ලද අක්කර 15.5ක තවත් ඉඩමක් ලබාගෙන එහි ඉදිකිරීම් 2021 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

පුස්තකාල පොත් හැර අනෙකුත් සියලුම දේපල, යන්ත්‍ර සහ උපකරණ 2022 දෙසැම්බර් 31 වන දිනට නැවත තක්සේරු කර ඇති අතර, සමාගම රුපියල් මිලියන 2,446ක් ලෙස වාර්තා කර ඇත. (ශුද්ධ බදු රු: මිලියන 1,946කි). එබැවින් මුළු ජංගම නොවන වත්කම්වල ස්ථාවරත්වය රුපියල් මිලියන 9,781 සිට රුපියල් මිලියන 12,258 දක්වා වර්ධනය විය.

දෙවන අදියරේ ඉදිකිරීම් සඳහා සමාගම 2022 වර්ෂය තුළ තවත් රුපියල් මිලියන 458ක් (2021 දී රුපියල් මිලියන 280) ආයෝජනය කර ඇත.

NSBM ලංකා බැංකුව සමඟ මුලින් රුපියල් මිලියන 8,600 ණය පහසුකම් සඳහා එකඟ වූ අතර, රුපියල් මිලියන 7,145ක කාලීන ණයක් 2022 වසර අවසානයේදී ගිණුම්ගත කර ඇත. හෝමාගම ව්‍යාපෘතියේ මාහේන්වත්ත, පිටිපන පිහිටි NSBM හරිත විශ්වවිද්‍යාල නගරයෙ ප්‍රාග්ධන ආයෝජනය සඳහා මෙම පහසුකම සම්පූර්ණයෙන්ම භාවිතා කරන ලදී. මෙම පහසුකම 2013 දෙසැම්බර් මස ආරම්භයේ සිටම කාලයක් තිස්සේ භාවිතා කර ඇත.

ශක්තිමත් අධ්‍යාපනික සහ මෙහෙයුම් ක්‍රියාකාරී නායකත්වය සහ කළමනාකාරිත්වය විසින් පිළිගෙන ඇති මනා ආරක්ෂාව හේතුවෙන් අපේක්ෂිත ආර්ථික පසුබෑම නොතකා විශ්වවිද්‍යාලය 2022 මූල්‍ය වසර අවසානයේදී ශක්තිමත් ස්ථාවර තත්වයක් අත්පත් කරගෙන ඇත. මෙහෙයුම් ක්‍රමවේදවල වෙනස්කම් පැහැදිලිව පිළිගත හැකි වුවද, ආර්ථික බාධාවන් නොතකා කර්මාන්තයේ ඉල්ලුම සහ දිගුකාලීනව රැඳී සිටීමට ඇති හැකියාව බොහෝ දුරට නොවෙනස්ව පවතින බව කළමනාකාරිත්වයේ අදහසය.

අධ්‍යයන හා පරිපාලන ක්‍රියාමාර්ග සහ ප්‍රයත්නයන් අනුව මෙහෙයුම් කටයුතු වලදී ඇති කරන ලද තිරසාර භාවිතයන්, කාල සීමාව පුරාවට සිදුවන අවිනිශ්චිතතාවයන් නොතකා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමට පහසුකම් සපයනු ඇත. ඉදිරි වසරවලදී අපගේ උපායමාර්ග සහ විශ්වවිද්‍යාල පහසුකම් වර්ධනය සඳහා තවදුරටත් ආයෝජනය කිරීමට අවශ්‍ය මුදල් ලබාදීම සඳහා අපි අපගේ දිගුකාලීන ණය සාර්ථකව ප්‍රතිමූල්‍යකරණය සිදු කර ඇත.



DESIGN YOUR GLOBAL LIFE

with

NIBM

POWERING
GREAT
MINDS

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන සටහන්

ආයතනික තොරතුරු

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

		NIBM		NSBM		සමූහය	
	සටහන්	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
වත්කම්							
ජංගම නොවන වත්කම්							
දේපළ, පිරියතල උපකරණ	3	1,096,328,395	1,000,528,702	11,955,383,146	9,454,464,492	13,051,711,541	10,454,993,194
අස්පාශ්‍ය වත්කම්	4	2,275,265	2,296,219	5,780,476	11,986,675	8,055,741	14,282,894
අනුබද්ධ ආයතනවල ආයෝජනය	5	800,000,010	800,000,010	-	-	-	-
වත්කම් නාවිතා කිරීමේ අයිතිය	6	235,817,282	274,849,898	297,049,594	314,905,314	532,866,876	589,755,212
වෙනත් ජංගම නොවන වත්කම්		17,341,552	16,623,061	-	-	17,341,552	16,623,061
මුළු ජංගම නොවන වත්කම්		**2,151,762,504**	**2,094,297,890**	**12,258,213,216**	**9,781,356,481**	**13,609,975,710**	**11,075,654,361**
ආරක්ෂිත තැන්පත්		15,362,500	15,062,500	-	-	15,362,500	15,062,500
ජංගම වත්කම්							
බඩු තොග	7	40,592,112	9,292,293	47,740,293	27,936,091	88,332,405	37,228,384
කෙටිකාලීන ආයෝජන	8	726,918,014	569,159,852	464,405,410	513,008,309	1,191,323,424	1,082,168,161
වෙළෙඳාම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ	9	317,488,573	323,952,011	1,183,444,604	960,873,143	1,500,933,177	1,284,825,154
වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්		3,103,592	6,861,410	-	2,838,790	3,103,592	9,700,200
මුදල් සහ මුදල් සමාන දෑ	10	14,630,209	41,681,364	326,793,794	(206,254,464)	341,424,003	(164,573,100)
මුළු ජංගම වත්කම්		1,102,732,500	950,946,930	2,022,384,101	1,298,401,869	3,125,116,601	2,249,348,799
මුළු වත්කම්		**3,269,857,504**	**3,060,307,320**	**14,280,597,314**	**11,079,758,350**	**16,750,454,811**	**13,340,065,660**
අරමුදල් සහ වගකීම්							
ප්‍රධාන							
රජයේ දායකත්වය	11	57,175,767	57,175,767	-	-	57,175,767	57,175,767
වෙනත් ප්‍රධාන	12	-	-	-	-	-	-
ප්‍රාග්ධන ප්‍රධාන	13	303,444,441	311,735,921	-	-	303,444,441	311,735,921
මුළු ප්‍රධාන		**360,620,208**	**368,911,688**	**-**	**-**	**360,620,208**	**368,911,688**
ප්‍රාග්ධන සහ වෙන්කිරීම්							
ප්‍රකාශිත ප්‍රාග්ධනය		-	-	800,000,010	800,000,010	-	-
නැවත ඇගයීම් සංචිතය	14	298,389,682	298,389,682	1,945,509,610	-	2,243,899,292	298,389,682
රඳවාගත් ඉපැයුම්		1,424,050,034	1,409,151,649	1,001,115,910	799,890,890	2,425,165,944	2,209,042,539
මුළු ප්‍රාග්ධනය සහ සංචිත		1,722,439,716	1,707,541,331	3,746,625,530	1,599,890,900	4,669,065,236	2,507,432,221
මුළු අරමුදල		**2,083,059,923**	**2,076,453,018**	**3,746,625,530**	**1,599,890,900**	**5,029,685,444**	**2,876,343,908**
ජංගම නොවන වගකීම්							
පුස්තකාල තැන්පත්		1,077,000	810,000	1,446,000	1,471,000	2,523,000	2,281,000
බැංකු ණය		-	-	6,350,000,000	7,260,589,070	6,350,000,000	7,260,589,070
විලම්බිත බදු බැරකම්	15	166,340,082	82,814,192	1,166,049,949	669,103,096	1,332,390,030	751,917,288
විශ්‍රාම පත්‍රිලාභ බැරකම්	16	22,537,977	44,234,866	23,617,195	30,615,800	46,155,172	74,850,666
බදු ණය දෙන්නන්	19	94,580,720	139,450,300	-	-	94,580,720	139,450,300
මුළු ජංගම නොවන වගකීම්		**284,535,779**	**267,309,358**	**7,541,113,144**	**7,961,778,966**	**7,825,648,922**	**8,229,088,324**
ජංගම වගකීම්							
පුස්තකාල තැන්පත්		792,000	810,000	-	-	792,000	810,000
නේවාසිකාගාර තැන්පත්		-	-	26,685,000	15,180,000	26,685,000	15,180,000
වෙළඳ සහ වෙනත් ණයගැතියෝ	17	803,537,646	605,207,429	1,883,950,916	708,493,468	2,687,488,562	1,313,700,897
බැංකු ණය		-	-	1,045,589,070	790,589,070	1,045,589,070	790,589,070
ජංගම බදු වගකීම	18	149,253	23,449,032	36,633,650	-	36,782,903	23,449,032
බදු ණය දෙන්නන්	19	97,335,310	86,310,700	-	3,825,939	97,335,310	90,136,639
වෙන්කිරීම්	20	447,593	767,780	-	-	447,593	767,780
මුළු ජංගම වගකීම්		902,261,801	716,544,941	2,992,858,636	1,518,088,477	3,895,120,438	2,234,633,418
මුළු හිමිකම සහ වගකීම්		**3,269,857,503**	**3,060,307,320**	**14,280,597,314**	**11,079,758,350**	**16,750,454,811**	**13,340,065,659**

සමූහයේ මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වල අවශ්‍යතාවයන්ට අනුකූල බව මම සහතික කරමි.

.....
අධ්‍යක්ෂ (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පාලක සභාව වගකිව යුතුය.

පාලක සභාව වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් අනුමත කර අත්සන් කර ඇත,

.....
අධ්‍යක්ෂ ජනරාල්

.....
පාලක සභා සාමාජික

දිනය :- 2023 මැයි 25
කොළඹ,

වරහන් වල සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි
පිටු 9 සිට 31 දක්වා වූ මූල්‍ය ප්‍රකාශනවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

		NIBM		NSBM		සමූහය	
	සටහන්	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
ආදායම	21	1,682,055,332	1,354,439,147	4,030,042,171	3,489,628,698	5,712,097,503	4,844,067,845
සෘජු වියදම්	22	(909,591,926)	(697,496,185)	(1,150,553,618)	(1,086,840,473)	(2,060,145,544)	(1,784,336,658)
දළ ලාභය		**772,463,406**	**656,942,962**	**2,879,488,553**	**2,402,788,225**	**3,651,951,959**	**3,059,731,187**
වෙනත් ආදායම්	23	11,821,436	11,589,193	16,776,502	6,622,553	28,597,938	18,211,746
පරිපාලන වියදම්	24	(685,944,486)	(477,196,649)	(1,230,099,392)	(1,010,429,230)	(1,916,043,878)	(1,487,625,879)
වෙනත් වියදම්	25	(17,522,950)	(7,795,595)	(5,101,774)	(11,750,084)	(22,624,724)	(19,545,679)
මෙහෙයුම් තුළින් ලද ලාභය		**80,817,406**	**183,539,911**	**1,661,063,889**	**1,387,231,464**	**1,741,881,295**	**1,570,771,375**
ශුද්ධ මූල්‍ය පිරිවැය / ආදායම	26	86,204,890	18,278,499	(1,434,507,902)	(592,590,395)	(1,348,303,012)	(574,311,896)
බදු පෙර ලාභය		**167,022,296**	**201,818,410**	**226,555,987**	**794,641,069**	**393,578,283**	**996,459,479**
බදු වියදම	27	(108,929,698)	(41,903,361)	(35,811,062)	(116,818,197)	(144,740,760)	(158,721,558)
වර්ෂයේ ලාභය		**167,022,296**	**201,818,410**	**226,555,987**	**794,641,069**	**393,578,283**	**996,459,479**
වෙනත් විස්තීර්ණ ආදායම්							
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත වෘත්තීයමය ලාභය /(පාඩුව)		30,071,822	(1,348,765)	14,971,565	1,670,831	45,043,387	322,066
දේපළ පිරියත සහ උපකරණ නැවත අගය කිරීම මත ඇති වූ අතිරික්තය		–	52,171,557	2,445,730,011	–	2,445,730,011	52,171,557
නැවත ඇගයීම මත කල් දැමූ බදු බලපෑම		–	–	(500,220,401)	–	(500,220,401)	–
සේවා නියුක්තියෙන් පසු ප්‍රතිලාභ වගකීම මත ක්‍රියාකාරී ලාභය /(අලාභය) මත බදු බලපෑම		–	(7,328,376)	(4,491,469)	(233,916)	(4,491,469)	(7,562,292)
විනිමය ප්‍රතිලාභ / පාඩු		–	–	–	–	–	–
		30,071,822	**43,494,416**	**1,955,989,706**	**1,436,915**	**1,986,061,528**	**44,931,331**
වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම		**88,164,420**	**203,409,465**	**2,146,734,631**	**679,259,787**	**2,234,899,051**	**882,669,252**

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

NIBM	රජයේ දායකත්වය	ප්‍රාග්ධන සහ වෙනත් ප්‍රධාන	නැවත අගයකිරීමේ අතිරික්තය	රඳවාගත් ඉපයීම්	මුළු හිමිකම
2021 ජනවාරි 01 දිනට ශේෂය	**57,175,767**	**321,804,027**	**247,392,885**	**1,272,584,953**	**1,898,957,632**
PPE හි නැවත ඇගයීමේ අගය	-	-	52,171,557	-	52,171,557
ඉවත්කරන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ වාසිය රඳවාගත් ඉපයුම් වලට මාරුකරන ලද	-	-	(1,174,780)	1,174,780	-
රැකියා ප්‍රතිලාභ මත සැබෑ ලාභ /(අලාභ)	-	-	-	(1,348,765)	(1,348,765)
ප්‍රත්‍යාගණනය මත කල් දැමූ බදුවල බලපෑම	-	-	-	(7,328,376)	(7,328,376)
පසුගිය වසරවල ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන	-	-	-	-	-
ඒකාබද්ධ අරමුදලට දායකත්වය	-	-	-	(15,845,992)	(15,845,992)
ප්‍රාග්ධන ප්‍රදාන වලින් හඳුනාගත් ආදායම	-	(10,068,107)	-	-	(10,068,107)
වර්ෂය සඳහා ලාභය	-	-	-	159,915,049	159,915,049
2021දෙසැම්බර් 31 දිනට ශේෂය	**57,175,767**	**311,735,920**	**298,389,662**	**1,409,151,649**	**2,076,452,998**
ප්‍රාග්ධන ප්‍රදාන වලින් හඳුනාගත් ආදායම	-	(8,291,481)	-	-	(8,291,481)
ඒකාබද්ධ අරමුදලට දායකත්වය	-	-	-	(73,266,035)	(73,266,035)
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත සැබෑ ලාභය / (අලාභය)	-	-	-	30,071,822	30,071,822
වර්ෂය සඳහා ලාභය	-	-	-	58,092,598	58,092,598
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**57,175,767**	**303,444,439**	**298,389,662**	**1,424,050,034**	**2,083,059,902**

NSBM	නැවත තක්සේරුකිරීමේ අතිරික්තය	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රඳවා ගත් ඉපැයීම්	මුළු හිමිකම
2021 ජනවාරි 01 දිනට ශේෂය	**-**	**800,000,010**	**120,631,103**	**920,631,113**
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත සැබෑ ලාභය/(අලාභය)	-	-	1,436,915	1,436,915
විනිමය ලාභය / (අලාභය)	-	-	-	-
වර්ෂය සඳහා ලාභය/(අලාභය).	-	-	677,822,872	677,822,872
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**800,000,010**	**799,890,890**	**1,599,890,900**
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත සැබෑ ලාභය/(අලාභය)	-	-	10,480,095	10,480,095
වත්කම් ප්‍රත්‍යාගණනය	2,445,730,011	-	-	2,445,730,011
විනිමය ලාභය/(අලාභය)	-	-	-	-
ප්‍රත්‍යාගණනය මත කල් දැමූ බදුවල බලපෑම	(500,220,401)	-	-	(500,220,401)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)	-	-	190,744,925	190,744,925
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,945,509,610**	**800,000,010**	**1,001,115,910**	**3,746,625,530**

Group	රජයේ දායකත්වය	ප්‍රාග්ධන සහ වෙනත් ප්‍රධාන	නැවත තක්සේරුකිරීමේ අතිරික්තය	රඳවා ගත් ඉපැයීම්	මුළු හිමිකම
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**57,175,767**	**311,735,920**	**298,389,662**	**2,209,042,539**	**2,876,343,888**
PPE හි නැවත ඇගයීමේ අගය	-	-	2,445,730,011	-	2,445,730,011
රැකියා ප්‍රතිලාභ මත සත්‍ය (අලාභ)/ලාභ	-	-	-	40,551,917	40,551,917
පසුගිය වසරවල ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන	-	-	-	-	-
ප්‍රාග්ධන ප්‍රදාන වලින් හඳුනාගත් ආදායම	-	(8,291,481)	-	-	(8,291,481)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)	-	-	-	248,837,523	248,837,523
ප්‍රත්‍යාගණනය මත කල් දැමූ බදුවල බලපෑම	-	-	(500,220,401)	-	(500,220,401)
රජයේ ඒකාබද්ධ අරමුදලට දායකත්වය	-	-	-	(73,266,035)	(73,266,035)
2021දෙසැම්බර් 31 දිනට ශේෂය	**57,175,767**	**303,444,439**	**2,243,899,272**	**2,425,165,944**	**5,029,685,422**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

	NIBM		NIBM		සමූහය	
2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය						
බදු පෙර ලාභය/පාඩු	167,022,296	201,818,435	226,555,987	794,641,069	393,578,283	996,459,504
ගැලපීම්	-	-	-	-	-	-
ක්ෂය වීම	132,964,559	77,819,379	505,331,076	448,452,613	638,295,635	526,271,992
ස්ථාවර වත්කම් විකිණීමේදී ශුද්ධ ලාභය/පාඩුව	39,449	613,447	(24,480)	-	14,969	613,447
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	9,430,054	6,086,169	9,267,619	7,980,385	18,697,673	14,066,554
ක්‍රමක්ෂය කිරීම් අස්පෘශ්‍ය දේ	1,620,954	1,187,214	20,614,933	13,446,171	22,235,887	14,633,385
කල්දැමූ ආදායම	(8,291,481)	(10,068,107)	-	-	(8,291,481)	(10,068,107)
ආයෝජන සඳහා පොලි	(106,829,869)	(26,656,216)	(144,641,032)	(31,014,488)	(251,470,901)	(57,670,704)
(අඩු වීම)/ප්‍රතිපාදන වැඩි කිරීම	62,402,310	48,041,524	-	-	62,402,310	48,041,524
බදු පොලිය	16,424,229	10,383,546	1,557,372,038	1,794,450	1,573,796,267	12,177,996
වත්කම් ක්‍රමක්ෂ කිරීම භාවිතා කිරීමේ අයිතිය	125,058,760	85,906,288	-	18,936,251	125,058,760	104,842,539
විනිමය ලාභය/(අලාභය)	-	-	-	-	-	-
ප්‍රාග්ධන වෙනස් කිරීමට පෙර මෙහෙයුම් ලාභය /(අලාභය)	**399,841,261**	**395,131,679**	**2,174,476,141**	**1,254,236,451**	**2,574,317,402**	**1,649,368,130**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්						
ඉන්වෙන්ටරිවල අඩුවීම /(වැඩිවීම)	(31,299,819)	2,994,982	(19,804,202)	(12,209,986)	(51,104,021)	(9,215,004)
වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දේවල අඩුවීම/(වැඩිවීම)	(56,259,059)	(93,795,613)	(206,817,703)	(450,816,643)	(263,076,762)	(544,612,256)
පුස්තකාල තැන්පතු වැඩි වීම/(අඩු වීම)	249,000	168,000	11,480,000	(153,000)	11,729,000	15,000
වෙනත් මූල්‍ය නොවන වත්කම්වල වැඩි වීම/(අඩු වීම)	3,039,342	2,336,225	-	(2,838,790)	3,039,342	(502,565)
තැන්පතු වැඩි වීම/(අඩු වීම)	(300,000)	(4,312,500)	-	2,204,000	(300,000)	(2,108,500)
කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවිය යුතු මුදල් වැඩි කිරීම/(අඩු වීම)	-	-	-	-	-	-
වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු වැඩි වීම/(අඩු වීම)	198,330,216	41,500,537	560,771,896	(847,371,370)	759,102,112	(805,870,833)
මෙහෙයුම් වලින් ලද මුදල් (උත්පාදනය කරන ලද)	**513,600,941**	**344,023,310**	**2,520,106,132**	**(56,949,338)**	**3,033,707,073**	**287,073,972**
ගෙවූ බදු	(48,703,590)	(23,301,729)	(2,943,131)	(9,029,626)	(51,646,721)	(32,331,355)
ලීසිං පොලි ගෙවා ඇත	-	-	(965,135,821)	(1,794,450)	(965,135,821)	(1,794,450)
පාරිතෝෂිත ගෙවීම්	(1,055,120)	(6,009,210)	(1,294,659)	(790,875)	(2,349,779)	(6,800,085)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය	**463,842,231**	**314,712,371**	**1,550,732,521**	**(68,564,289)**	**2,014,574,752**	**246,148,082**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහය						
දේපළ, පිරියත සහ උපකරණ අත්පත්කරගැනීම්/ කෙරිගෙන යන වැඩ සඳහා ප්‍රසම්පාදනයන්	(228,844,802)	(196,272,204)	(98,097,896)	(397,541,266)	(326,942,698)	(593,813,470)
දේපළල පිරියත සහ උපකරණ අපහරණය ක්‍රියාවලිය	41,103	683,635	384,400	13,600	425,503	697,235
ROU අත්පත් කරගැනීම	(38,115,000)	(66,000,000)	-	-	(38,115,000)	(66,000,000)
කෙරිගෙන යන වැඩ සඳහා ආයෝජනය	-	-	(435,255,423)	-	(435,255,423)	-
අස්පෘශ්‍ය වත්කම් අත්කරගැනීම	(1,600,000)	(1,225,440)	(1,630,000)	-	(3,230,000)	(1,225,440)
ලාභාංශ	-	-	-	-	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින්/(භාවිතා කරන) ශුද්ධ මුදල් ප්‍රවාහය	**(268,518,699)**	**(236,157,793)**	**(534,598,919)**	**(366,513,178)**	**(803,117,618)**	**(660,341,675)**
මූල්‍ය කටයුතු වලින් මුදල් ගලා ඒම						
ණය ගැනීම් වලින් ලැබෙන ශුද්ධ ආදායම (ගෙවීම්)	-	-	(655,589,070)	(68,821,860)	(655,589,070)	(68,821,860)
පොලි ලැබීම්	106,829,869	26,656,216	127,726,765	31,014,488	234,556,634	57,670,704
බදු දීමෙන් ලැබෙන ශුද්ධ ආදායම (ගෙවූම්)	(98,180,360)	(69,911,986)	(3,825,940)	(17,548,825)	(102,006,300)	(87,460,811)
රජයේ ඒකාබද්ධ අරමුදලට දායකත්වය	(73,266,035)	(15,845,992)	-	-	(73,266,035)	(15,845,992)
මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(64,616,526)	(85,757,978)	(531,688,245)	(86,370,685)	(596,304,771)	(114,457,959)
වර්ෂය තුළ මුදල් හා මුදල් සමානකම්වල ශුද්ධ වෙනස්කම්	130,707,006	(7,203,400)	484,445,357	(521,448,152)	615,152,363	(528,651,552)
වසරේ ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	610,841,216	618,044,618	306,753,844	828,201,995	917,595,060	1,446,246,613
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**741,548,223**	**610,841,216**	**791,199,204**	**306,753,844**	**1,532,747,427**	**917,595,060**

වරහන් වල සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි
පිටු 9 සිට 31 දක්වා වූ මූල්‍ය ප්‍රකාශනවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි

1. ආයතනික තොරතුරු

1.1 නෛතික හා ව්‍යවස්ථාපිත ආකෘතිය

1991 අංක 21 දරන සංශෝධන පනතින් සංශෝධනය කරන ලද 1976 අංක 23 දරන පාර්ලිමේන්තු පනත මඟින් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ස්ථාපිත කරන ලදී. ආයතනය පිහිටා ඇත්තේ අංක 120/5, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයෙහි ය.

1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

වසර පුරා සිදුකරන ලද ආයතනයේ සහ සමූහයේ කාර්යයන් පහත පරිදි වේ

- ගුණාත්මක ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනය හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන් සඳහා උපදෙස් සැපයීම.
- සංවිධානවල කළමනාකරුවන් හා අධීක්ෂණ කාර්යමණ්ඩල නිපුණතා සංවර්ධනය කිරීම.
- සංවිධානවල සේවකයන් පුහුණු කිරීම හා ඔවුන්ට අධ්‍යාපනය ලබාදීම.
- සංවිධානවල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා පහසුකම් සැපයීම.
- කළමනාකරණ උපදේශන හා උපදේශක සේවාවන් සැපයීම.

1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධව ආයතනයේ පාලක සභාව වගකියනු ලබයි.

2. අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLFRS/LKAS) අනුව මූල්‍ය ප්‍රකාශන සකසා ඇත.

මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLAS) වලට අනුකූලව 2011 දෙසැම්බර් 31 අවසන් වූ වසර තෙක්, එම වසර ද ඇතුළත්ව, ක්‍රියාත්මක වන කාලසීමාව සඳහා, ආයතනය මඟින් සකසන ලදී.

2.1.2 ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන, වෙළඳපොල වටිනාකම මත ඇතැම් වත්කම් හා බැරකම් හැර සකස්කර ඇත. ඓතිහාසික පිරිවැය පදනම මතයි.

2.1.3 ව්‍යවහාර මුදල් හා ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශනවල ඇති අයිතමයන් මැන ඇත්තේ ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ ඇති මුදල් වලිනි. (ව්‍යවහාර මුදල්) මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇත්තේ ආයතනයේ ව්‍යවහාර හා ඉදිරිපත් කිරීමේ මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.1.4 අනුකූලතා ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශන") යනාදිය සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය මඟින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS හා SLFRS) වලට අනුකූලව ය.

2.1.5 ප්‍රවර්තන ව්‍යාපාරය

පාලක සභාවේ සාමාජිකයන්, ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස පැවතීමට ආයතනයේ හා එහි ඇති හැකියාව තක්සේරු කර ඇති අතර එහි වාණිජ කටයුතු අවසන් කිරීමට හෝ නැවැත්වීමට අදහස් නොකරයි.

2.1.6 සන්සන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ආයතනය මඟින් සමානුයෝගීව භාවිතා කරන අතර පෙර වසර සමඟ ද අනුකූල වේ. මෙම වසරේ ඉදිරිපත් කිරීම/වර්ගීකරණය හා අනුගත වීම් පිණිස පෙර වසරේ සංඛ්‍යා හා ස්ථානවල අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකර ඇත.

2.1.7 ද්‍රව්‍යාත්මක හා සමාහාර බව

සමාන අයිතමයන්ගේ සෑම ද්‍රව්‍යාත්මක දේවල් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර ඇත. වෙනස් අයිතමයන් ද්‍රව්‍යාත්මකව අසමාන නොවන දේවල් නොවන්නේ නම් එකිනෙකට වෙනමම දක්වා ඇත.

2.1.8 අදාළ වන ගිණුම් විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී, ආදායම් වියදම් වත්කම් හා බැරකම්වල වාර්තාගත ප්‍රමාණයට බලපාන හා වාර්තා කරන දිනය වනවිට ඇති අනිශ්චිත බැරකම් අනාවරණය සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යනාදිය ඇති කර ගැනීමට කළමනාකාරිත්වයට සිදු වේ.

මීළඟ මූල්‍ය වර්ෂයේ වත්කම් හා බැරකම් ප්‍රමාණවලට ද්‍රව්‍යාත්මක ගැලපුම් සිදු කිරීමේ අවදානමක් ඇති කරන මූල්‍ය තත්ත්ව දිනයට අදාළ ඇස්තමේන්තු අනිශ්චිතතාවයන්ගේ ප්‍රධාන මූලාශ්‍ර සහ අනාගතයට බලපාන ප්‍රධාන උපකල්පනයන් අවධානයට ගෙන ඇත.

2.2 වත්කම් තක්සේරු කිරීමේ පදනම

2.2.1 දේපල, පිරියත හා උපකරණ

(අ) ඇගයීම

දේපල, පිරියත හා උපකරණයන්හි සියළු අයිතමයන් මූලික පිරිවැය මත වාර්තා කර ඇත. දේපල පිරියත හා උපකරණයන්හි අයිතමයන් ප්‍රත්‍යාගණනය කර ඇති විටක, එම වත්කම්වල සමස්ත වර්ගයට ප්‍රත්‍යාගණනය කරනු ලැබ ඇත. එදිනෙදා සේවා, සමුච්චිත ක්ෂයවීම් අවමය හා සමුච්චගත හානි කරන සඳහා පිරිවැය හැරුණු කොට දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත පදනම්ව ඉදිරිපත් කොට ඇත.

වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට ඉදිරියට රැගෙන යන ප්‍රමාණයේ ඕනෑම වැඩි වීමක්, එය නැවත වියදමක් නොවන්නේ නම්, සෘජුවම ප්‍රත්‍යාගණිත අතිරික්තය වෙත බැර කෙරේ. එවන් තත්ත්වයක් යටතේ දී පෙර ලියා තබන ලද වටිනාකමෙහි තරමට එම වැඩිවීම ආදායමක් ලෙස ගණන් ගැනේ. කිසියම් වත්කමක ඉදිරියට ගෙන ආ වටිනාකම ප්‍රත්‍යාගණනයක් හේතුවෙන් අඩු කරනු ලබන්නේ නම් එම අඩු කිරීම වත්කමට අදාළව පැවති පූර්ව වැඩි කිරීමක් ප්‍රතිවර්තනය නොවන්නේ නම් එවිට අදාළ අඩු කිරීම වියදමක් සේ හඳුනා ගැනේ. එවන් අවස්ථාවක දී එකී වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි රඳවා ගනු ලබන වටිනාකම ඉක්මවා අඩු කිරීම නොයන දුරට ප්‍රත්‍යාගණන අතිරික්තය සිදු කෙරේ. වත්කමක් සම්බන්ධයෙන් වන ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි පවත්නා ශේෂයන් සෘජුවම වත්කම් අපහරණය හෝ අවභාවිතය මත සමුච්චිත ලාභ හෝ අලාභයට සෘජුවම මාරු කෙරේ.

(ආ) දේපල, පිරියත හා උපකරණයන්හි ඵලදායී ජීවිත කාලය

එක් එක් වාර්තා කෙරෙන දිනයන් වන විට වත්කම්වල ඵලදායී ජීවිත කාලය හා වත්කම්වල සුන්බුන් අගයන් හඳුනාගෙන, මෙම අගයන් ඇස්තමේන්තු කිරීමේ දී වෘත්තීයමය නිපුණතාවය මත පදනම්ව කළමනාකරණය ගනු ලැබූ විනිශ්චයන්, අනුපාත හා ක්‍රමවේදයන් යනාදිය ආයතනය මඟින් විග්‍රහ කෙරේ.

(ඇ) ක්ෂය වීම

වත්කම මත රඳා පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව විඳහා දැක්වෙන බැවින් දේපළ, පිරියත හා උපකරණයන්හි එක් එක් අයිතමයන්ගේ ඵලදායී ජීවිත කාලය මත තබමින් ලාභ අලාභ ක්ෂය වීම් හඳුනාගෙන ඇත.

සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

ආර්ථිකමය ඵලදායී ජීවිත කාලයන් පහත පරිදි ය.

අස්පෘශ්‍ය වත්කම්	33.5%
ගොඩනැගිලි ඉදිකිරීම්	2%
නවීකරණය	10%
සිලිං විදුලිපංකා	25%
ගිනි නිවන	20%
ගෘහභාණ්ඩ හා උපකරණ	20%
කාර්යාලීය උපකරණ	20%
පරිගණක උපකරණ	25%
මෝටර් වාහන	25%
පුස්තකාල පොත්	20%

භාවිතා කිරීම සඳහා වත්කම් ලබාගත් විට ක්ෂය කිරීම ආරම්භ කරන අතර, විකිණීම සඳහා තබා ඇති බවට වර්ගීකරණය කෙරෙන දිනයේ දී හෝ වත්කම ඉවත් කිරීම සඳහා නැවත හඳුනා ගැනෙන දිනයේ දී ක්ෂයවීම අවසන් වේ.

(ඈ) ප්‍රතිසම්පාදන පිරිවැය

දේපළ පිරිසක හා උපකරණයන්ගේ මුල්වරට හඳුනාගන්නා ලද අනාගත ආර්ථිකමය ප්‍රතිලාභ ප්‍රමිතිය පවත්වාගෙන යාමට හෝ එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය වන වියදම, වියදමක් ලෙස හඳුනා ගැනේ.

(ඉ) ඉවත් කිරීම සඳහා නැවත හඳුනාගැනීම

දේපළ, පිරියත හා උපකරණයන්හි අයිතිමයක් ඉවත් කිරීම සඳහා හඳුනා ගැනෙන්නේ අපහරණය කිරීමේ දී හෝ එය භාවිතයෙන් හෝ අපහරණයෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන විටදී ය. යම් වත්කමක් ඉවත් කිරීම සඳහා හඳුනා ගැනීම තුළින් පැන නගින ලාභයක් හෝ අලාභයක් වත්කමේ ශුද්ධ අපහරණ අගය හා රැගෙන යනු ලබන අගය අතර වෙනස ලෙස ගණනය කිරීමෙන් වත්කම ඉවත් කිරීම සඳහා හඳුනා ගන්නා වසරේ සමස්ත ආදායම් ප්‍රකාශනය තුළට එක් කරනු ලැබේ.

2.2.2 පවත්වාගෙන යන ප්‍රාග්ධන කාර්යයන්

වත්කම පළමු වරට උපයෝජනය කරන අවස්ථාවේ දී පවත්වාගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුම් වෙතට මාරු කෙරේ.

2.2.3 අස්පෘෂ්‍ය වත්කම්

(අ) හඳුනාගැනීමේ පදනම

අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගත හැකි වන්නේ, භෞතික පැවැත්මක් නොමැති නමුත් නෛතික හිමිකමක් පවතින මූල්‍ය වත්කමිය. අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගත හැක්කේ වත්කමට ආරෝපණය වන අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලායාමේ විභව්‍යතාවක් තිබෙන්නේ නම් පමණි. එසේම වත්කමේ පිරිවැය විශ්වාසී අයුරින් මැනීය හැක්කේ අස්පෘෂ්‍ය වත්කම් පිළිබඳ KLAS 38 අනුව ය.

ආයතනයෙහි අස්පෘෂ්‍ය වත්කම්වලට ඇතුළත් වනුයේ පරිගණක මෘදුකාංගයන් හි සමස්ත කොටසක් නොවන ආයතනය විසින් භාවිතය සඳහා අවසරලත් පිරිවැයක් සහිත පරිගණක මෘදුකාංගයන් ය.

(ආ) ගිණුම් පදනම

වෙන් වෙන් වශයෙන් අත්පත් කරගන්නා අස්පෘෂ්‍ය වත්කම්හි වටිනාකම් මිනිනු ලබන්නේ හඳුනා ගන්නා ලබන ආරම්භක පිරිවැයට ය. ආරම්භක හඳුනා ගැනීමෙන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි

පසු අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ පිරිවැයට සහ සමුච්චිත හානිකරන පාඩුවක් තිබෙන්නේ නම් ඒ අනුව ඉදිරියට ගෙන යනු ලැබේ.

(ඇ) ක්‍රමක්ෂය

නිශ්චිත භාවිත කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් ඵලදායී ආර්ථික ජීව කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය ක්‍රමවේදය, ඵලදායී ජීවිත කාලය සහ වටිනාකම් අවම වශයෙන් සෑම වාර්තා කරන දිනයකදීම සමාලෝචනය කෙරේ.

2.2.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වර්ගීකරණ දිනයකදීම කිසියම් වත්කමකට හානිකරනයන් පිළිබඳ කිසියම් ලක්ෂණයක් තිබේ දැයි ආයතනය තක්සේරු කරයි. එවන් කිසියම් ලක්ෂණයක් තිබේ නම් හෝ කිසියම් වත්කමකට වාර්ෂික හානිකරන පරීක්ෂාවක් අවශ්‍ය නම් ආයතනයෙහි වත්කම යළි අය කර ගත හැකි ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවක් සකසයි. වත්කමක යළි අයකර ගත හැකි වටිනාකම යනු වත්කමේ උපරිම අගය හෝ වෙළෙඳ ඒකකයෙහි ශුද්ධ වටිනාකම එක් එක් වත්කමෙහි වටිනාකම මත තීරණය කරන අතර එසේ නොවන විටෙක දී සමූහයේ වත්කම් හෝ අනෙකුත් වත්කම් මත ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ගලා ඒමේ ස්වරූපයක් නොතිබිය යුතු ය. වත්කමක ඉදිරියට ගෙන ආ වටිනාකම යළි අයකර ගත හැකි වටිනාකම ඉක්මවන්නේ නම් වත්කම හානිකරණ වූවා සේ සැලකෙන අතර එය යළි අයකර ගත හැකි වටිනාකමට සටහන් කෙරේ. සළුල වටිනාකම තක්සේරු කිරීමේ දී වත්කමෙහි අවදානම් විශේෂතා සහ මුදලේ කාලීන වටිනාකම නිරූපණය කෙරෙන වර්තමාන වෙළෙඳපොල තක්සේරුව පිළිබිඹු වන පෙරබදු වට්ටම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් එහි වර්තමාන වටිනාකමට වට්ටම් කෙරේ.

අඛණ්ඩව මෙහෙයුම් හානිකරන පාඩු ප්‍රත්‍යාගණනය ව්‍යාපාර වස්තුවට ගනු ලබනා අවස්ථාවේ පූර්වයෙන් ප්‍රත්‍යාගණිත දේපල හැර හානිකරන වත්කම් ක්‍රියාකාරිත්වයට අනුගත වන වියදම් වර්ගීකරණයන් තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙහිදී හානිකරණය ද ව්‍යාපාරික වත්කම් තුළ හඳුනාගනු ලබන්නේ කවර හෝ පෙර ප්‍රත්‍යගණන අගයක් දක්වා ය.

කීර්තිනාමය හැර අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් පෙර හඳුනාගනු ලැබූ හානිකරන පාඩු තවදුරටත් නොපවතින්නේ ද හෝ අඩු වී ඇත්තේ ද යන්න පිළිබඳ කිසියම් සංඥාවක් වේ දැයි සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරුවක් කරනු ලැබේ. එවැනි තත්ත්වයක් පවතී නම් ආයතනය යළි අය කරගතහැකි ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවක් සකසයි.

පෙරදී හඳුනාගනු ලැබූ හානිකරන පාඩුවක් වෙනස් කරනු ලබන්නේ අවසන් වරට හානිකරන පාඩුවක් හඳුනාගත් දින පටන් වත්කමිහි යළි අයකර ගතහැකි වටිනාකම තීරණය කිරීම හා භාවිතා කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදුව ඇත්තේ නම් පමණි - තත්ත්වය එසේ වන්නේ නම් වත්කමේ ඉදිරියට ගෙන ආ වටිනාකම එහි යළි අය කරගත හැකි වටිනාකම දක්වා වැඩි කෙරේ. වත්කම සම්බන්ධයෙන් හානිකරන පාඩුවක් හඳුනාගෙන නොමැත්තේ නම් වැඩකරන ලද ඉදිරියට ගෙන යන ලද වටිනාකම තීරණය කරනු ලබන්නේ වත්කම්හි ක්ෂය කළ ශුද්ධ අගයත් හානිකරන පාඩු පූර්ව වර්ෂයත් සම්බන්ධයෙන් හඳුනාගැනීමෙන් පසුව ය. එවන් වෙනස් කිරීමක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

2.2.5.1 මූල්‍ය උපකරණ

2018 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වේ.

සමූහය සිය මූල්‍ය වත්කම් පහත දැක්වෙන මිනුම් කාණ්ඩ වලට වර්ගීකරණයයි

- සාධාරණ අගයෙන් පසුව මැන බැලිය යුතු ඒවා (OCI හරහා හෝ ලාභ හෝ අලාභ හරහා), සහ
- මැනිය යුතු ක්ෂය කර ඇති පිරිවැය.

වර්ගීකරණය මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වූ ආයතනයේ ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවාහයේ කොන්දේසි මත රඳා පවතී.

සාධාරණ අගය මනිනු ලබන වත්කම් සඳහා, ලාභ හා අලාභ හෝ OCI හි ලාභ හා අලාභ සටහන් වේ. ව්‍යාපාරය සඳහා නොපැවැත්වෙන කොටස් උපකරණ වල ආයෝජනය කිරීම සඳහා, වෙනත් පුළුල් ආදායමක් (FVOCI) තුළින් සාධාරණ ආයෝජනයෙන් සාධාරණ ලෙස ආයෝජනය සඳහා ගිණුම පිළිගැනීම සඳහා මූලික පිළිගැනීමේදී සහය ආපසු හැරවිය නොහැකි කැමැත්තක් පවතිනවාද යන්න මත මෙය රඳා පවතී.

එම සමූහය ණය ආයෝජන නැවත වර්ගීකරණය කරන්නේ එම වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය වෙනස් වූ විට සහ පසුව පමණි.

(අ) පිළිගැනීම සහ අවතක්සේරු කිරීම

මූල්‍ය වත්කම් සත්‍ය ආකාරයෙන් මිලදී ගැනීම් සහ විකිණීම් වෙළඳ දිනයේදී හඳුනා ගන්නා අතර, එය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම ආයතනය සිදු කරන දිනය වේ. ආයතනය හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස වෙනස් කිරීම සහ වත්කම් කල් ඉකුත් වීම හෝ වෙනස් කර ඇති මූල්‍ය වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වී ඇති විට හෝ මාරු කර ඇති විට මූල්‍ය වත්කම් ලෙස එය හඳුනා නොගනී.

(ආ) මිණුම්

මූලික හඳුනාගැනීමේදී සමූහය මූල්‍ය වත්කමක් එහි සාධාරණ අගයෙන් ලෙස සහ සාධාරණ අගයක් නැති මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ගත් කල,

ලාභයෙන් හෝ අලාභයෙන් (FVPL) මූල්‍ය අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මිනුම් කර ඇත.

මූල්‍ය වත්කම් වල ගණුදෙනු පිරිවැය ලාභයෙන් හෝ අලාභයෙන් ගලපනු ලැබේ.

IFRF 9 ට අනුව පසු කාලීනව ණය උපකරණ මැනීම, වත්කම් කළමනාකාරණය සඳහා ව්‍යාපාරික ආකෘතිය සහ වත්කම් වල මුදල් ප්‍රවාහයේ ස්වභාවය මත රඳා පවතී. ආයතනය විසින් මෙය ප්‍රධාන මිණුම් බාණ්ඩ 3ක් යටතේ වර්ගීකරණය සිදු කරයි.

- ගෙවන ලද පිරිවැයට ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා තබා ඇති වත්කම්, එම මුදල් ප්‍රවාහයන් නියෝජනය කරන්නේ මූලික මුදල සහ පොළී ගෙවීම් පමණක් වන අතර, ගෙවනු ලබන්නේ මිලදී ගත් වටිනාකම වේ. මෙම මූල්‍යමය පොළී ආදායම ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතයෙන් වත්කම් මූල්‍ය ආදායමට ඇතුළත් වේ. මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් අවලංගු කිරීම සෘජුවම ලාභය හෝ අලාභය ලෙස හඳුනාගෙන වෙනත් ලාභ/පාඩු සමඟ ඉදිරිපත් කෙරේ. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ දුර්වලතා හෝ පාඩු වෙන වෙනම රේඛීය අයිතමයක් ලෙස දක්වා ඇත.

- FVOCI වත්කම් වල මුදල් ප්‍රවාහයන් නියෝජනය කරන්නේ කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා තබා ඇති වත්කම්, මූලික හා පොළී ගෙවීම් සඳහා පමණක් FVOCI මඟින් මනිනු ලැබේ. ලාභයේ හෝ අලාභයේ දී පිළිගැනෙන දුර්වලතා ලාභ හෝ පාඩු, පොළී ආදායම සහ විදේශ විනිමය ලාභ හා අලාභය හඳුනා ගැනීම හැර, රැගෙන යන ප්‍රමාණයේ සංචලනය OCI හරහා ගනු ලැබේ. මූල්‍ය වත්කම් අවතක්සේරු කළ විට, OCI හි කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය සාධාරණත්වයේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කර වෙනත් ලාභ/අලාභයන්හිදී හඳුනා ගැනේ. ඵලදායී පොළී අනුපාත ක්‍රමය උපයෝගී කරගනිමින් මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොළී ආදායම මූල්‍ය ආදායමට ඇතුළත් වේ. විදේශ විනිමය ලාභ හා අලාභයන් වෙනත් ලාභ/(පාඩු) වලින් ද, අඩුපාඩු පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශයන්හි වෙනම රේඛීය අයිතමයන් ලෙස ද ඉදිරිපත් කෙරේ.

- FVPL: සංස්ථාපිත පිරිවැය හෝ FVOCI සඳහා වන නිර්ණායකයන්ට අනුකූල නොවන වත්කම් මනිනු ලබන්නේ FVPL ක්‍රමයෙනි. ණය ආයෝජනයක ලාභයක් හෝ අලාභයක් පසුව FVPL හිදී මනිනු ලබන අතර එය ලාභ හෝ අලාභය වශයෙන් පිළිගෙන එය ඇති වූ කාල සීමාව තුළ වෙනත් ලාභ/(අලාභ) තුළ ශුද්ධ ලෙස ඉදිරිපත් කෙරේ.

පසුව සමූහය සියළුම සාධාරණ ආයෝජන සාධාරණ අගයකින් මනිනු ඇත. OCI හි කොටස් ආයෝජන වල සාධාරණ වටිනාකම් ලැබීම් හා අලාභයන් ඉදිරිපත් කිරීමට සමූහයේ කළමනාකාරිත්වය තෝරාගෙන ඇති අවස්ථාවක, ආයෝජනය අවලංගු කිරීමෙන් පසු ලාභ හා අලාභ සඳහා සාධාරණ වටිනාකම් ලාභ හා පාඩු නැවත වර්ගීකරණය කිරීමක් සිදු නොවේ. සමූහයේ ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට එවැනි ආයෝජන වලින් ලැබෙන ලාභාංශ ලාභයෙන් හෝ අලාභයෙන් වෙනත් ආදායමක් ලෙස පිළිගැනේ.

FVPL හි මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ වෙනස්වීම් අදාළ වන පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශයේදී වෙනත් ලාභ/පාඩු ලෙස පිළිගනු ලැබේ. FVOCI හි මනිනු ලබන කොටස් ආයෝජන වල දුර්වලතා පාඩු (දුර්වලතා, පාඩු සහ ආපසු හැරවීම්) සාධාරණ අගයේ අනෙකුත් වෙනස්වීම් වලින් වෙන වෙනම සිදු නොකෙරේ.

2.2.5.1.2 පසු මිණුම්

මූල්‍ය වත්කම් පසුව මැනීම පහත සඳහන් පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී

(අ) ණය සහ ලැබීම්

ණය සහ ලැබීම් යනු ක්‍රියාකාරී වෙළඳපොල තුළ සඳහන් කර නැති ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ය. මූලික මිනුම් කිරීමෙන් පසුව, එවැනි මූල්‍ය වත්කම් පසුව ඵලදායී පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය සහ පිරිවැය මනිනු ලැබේ. EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත් කරගැනීමේ ගාස්තු හෝ වියදම් සඳහා යම් වට්ටමක් හෝ වාරිකයක් සිදුකරන්නේ නම් එය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය ගලපන ලද පිරිවැය ගණනය කරනු ලැබේ. මූල්‍ය වියදම් වල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දුර්වලතාවයන් නිසා පැනනගින පාඩු/අලාභ හඳුනාගත හැකිය.

වෙළඳපොල පොළී අනුපාතයට වඩා අඩුවෙන් ලබා දෙන ණය සමාන නිෂ්පාදන වල වෙළඳපල පොළී අනුපාත මත පදනම්ව ගණනය කර ඒවායේ සාධාරණ අගයෙන් මනිනු ලැබේ. අනුබද්ධ සමාගම ඔවුන්ගේ ණය සාධාරණ වටිනාකමකින් තක්සේරු කර නොමැත.

ලැබිය යුතු ණය වෙළඳාමෙන් සහ අනෙකුත් ලැබීම් වලින් සමන්විත වේ.

2.2.5.1.3 හඳුනා ගැනීම ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක කොටසක් හෝ ආයතනයේ සමාන මූල්‍ය වත්කම් කොටසක් හෝ, අදාළ වනවිට) අවලංගු කරනු ලබන්නේ,

- වත්කම් වලින් මුදල් ගලා ඒමේ අයිතිය කල් ඉකුත් වී ඇත.
- වත්කම් වලින් මුදල් ගලා ඒම සඳහා කණ්ඩායම තම අයිතිය පැවරී ඇත

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි

හෝ ඒ සඳහා වගකීමක් භාරගෙන ඇත. ලැබුණු මුදල් ප්‍රවාහයන් 'Pass through' විධිවිධානය යටතේ තුන්වන පාර්ශවයකට ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ගෙවන්න ඇති හෝ

- සමූහය වත්කම් වල සියළුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති, නැතහොත්
- සමූහය වත්කම් වල සියළුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර හෝ තබා නැති, නමුත් වත්කම් පාලනය මාරු කර ඇති අවස්ථාවන්හිදී ය.

වත්කම්වලින් මුදල් ගලා ඒම සඳහා සමූහය තම අයිතිය පැවරූ විට හෝ විධිවිධානය හරහා අවසර පත්‍රයකට ඇතුළු වී වත්කම්වල ඇති අවදානම් සහ ප්‍රතිලාභයන් සැලකිය යුතු ලෙස මාරු නොකළහොත් හෝ රඳවා නොගෙන හෝ එහි පාලනය මාරු නොකළ විට වත්කම් පිළිගනු ලැබේ. සමූහයේ එයට අබණ්ඩව සම්බන්ධ වීමේ ප්‍රමාණය, එම අවස්ථාවෙහිදී, සමූහයම ඊට සම්බන්ධ වගකීමක් ද පිළිගනී. මාරු කරන ලද වත්කම් සහ ඒ ආශ්‍රිත වගකීම් මනිනු ලබන්නේ සමූහය විසින් රඳවාගෙන ඇති අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබිඹු වන පදනමක් මත ය. මාරු කරන ලද ඇපකරයක ස්වරූපය ගන්නා වත්කම්වල අබණ්ඩ සහභාගීත්වය මනිනු ලබන්නේ මූලිකව රැගෙන යන ප්‍රමාණයට පහළින් සහ සමූහයට ආපසු ගෙවීමට අවශ්‍ය වන උපරිම සලකා බැලීමේදී ය.

2.2.5.1.4 මූල්‍ය වත්කම් වල දුර්වලතා

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අඩපණ වූ බවට සාක්ෂි තිබේ දැයි සමූහය සෑම වාර්තාකරන දිනයකම තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හෝ වත්කම් මූලික වශයෙන් පිළිගැනීමෙන් පසු සිදු වූ සිදුවීම් එකක් හෝ වැඩි ගණනක (සිදු වූ පාඩු හෝ සිදුවීමක්) හේතුවෙන් වාස්තවික සාක්ෂි තිබේ නම් එම පාඩු සිදුවීම මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට හෝ විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කම් සමූහයට බලපෑමක් ඇති කරයි. ණය ගැනියන් හෝ ණය ගැති කණ්ඩායමක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පැහැර හැරීම හෝ පොලී හෝ මූලික ගෙවීම් අවම වීම, ඔවුන් බංකොලොත් භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළු වීමේ සම්භාවිතාව සහ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්නුම් කෙරෙන බව ඇඟවීම් ඇතුළත් විය හැකිය. මෙය නිඟ මුදල් වල වෙනස්වීම් හෝ පැහැර හැරීම් සමඟ සහ සම්බන්ධිත ආර්ථික තත්වයන් වැනි ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයේ මැනිය හැකි බව අඩු වීම මත සිදුවේ.

2.2.5.1.5 මූල්‍ය වත්කම් ක්ෂය කළ පිරිවැය මත

මූල්‍ය වත්කම් සඳහා, සමූහය මුලින්ම තක්සේරු කරන්නේ පුද්ගලිකව කැපී පෙනෙන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව හෝ සැලකිය යුතු නොවන පරිදි මූල්‍ය වත්කම්වල දුබලතා පිළිබඳ වාස්තවික සාක්ෂි තිබේද යන්න මත වේ. තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා සැලකිය යුතු හෝ නැති දුබලතා පිළිබඳ සාක්ෂි නොමැති බව සමූහය විසින් තීරණය කරන්නේ නම්, එයට සමාන ණය අවදානම් ලක්ෂණ ඇති මූල්‍ය වත්කම් සමූහයක වත්කම ඇතුළත් වන අතර ඒවා දුර්වලතා සඳහා සාමූහිකව තක්සේරු කරයි. දුර්වලතා සඳහා තනි තනිව තක්සේරු කරන ලද සහ දුර්වලතා අලාභයක් සිදු වූ බව අබණ්ඩව පිළිගත් වත්කම්, දුර්වලතා පිළිබඳ සාමූහික තක්සේරුවකට ඇතුළත් නොවේ.

දුර්වලතා අලාභයක් සිදුවී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේ නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම් ගෙන යන ප්‍රමාණයේ සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම අතර වෙනස (මෙතෙක් සිදු නොවූ අනාගත අපේක්ෂිත ණය පාඩු හැර) ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම් වල මුල් ඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කෙරේ. ණයක් සඳහා විකල්ප පොලී අනුපාතයක් තිබේ නම්, යම් දුර්වලතා අලාභයක් මැනීම සඳහා වන වට්ටම් අනුපාතය වර්තමාන ඵලදායී පොලී අනුපාතය වේ.

දීමනාවක් භාවිතා කිරීම තුළින් වත්කම්වල ගෙන යන ප්‍රමාණය අඩු වන අතර, අලාභයේ ප්‍රමාණය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළින් හඳුනා ගැනෙන අතර පොලී ආදායම අබණ්ඩව එකතු වෙමින් පවතී. ඉදිරියට ගෙන යන ප්‍රමාණය අඩු කළ අතර අනාගත මුදල් ගලා ඒම වට්ටම් කිරීම සඳහා භාවිතා කරන පොලී අනුපාතය උපචිත කෙරේ.

දුර්වලතා පාඩුව මැනීමේ අරමුණ පොලී ආදායම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස සටහන් වේ. අනාගත ප්‍රතිසාධනය සඳහා යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට සහ සියලු ඇපකරයන් සාක්ෂාත් වූ විට හෝ ඒ වෙත මාරු කළ විට ඒ ආශ්‍රිත දීමනාව සමඟ ණය කපා හැරේ. සමූහය පසු වර්ෂයකදී, දුර්වලතාවය හඳුනා ගැනීමෙන් පසුව සිදුවන සිදුවීමක් හේතුවෙන් ඇස්තමේන්තුගත හානියේ පාඩුවන ප්‍රමාණය අඩු හෝ වැඩි වුවහොත්, දුර්වලතාව දීමනා ගිණුම සකස් කිරීමෙන් පාඩුව වැඩි හෝ අඩු කරනු ලැබේ. අනාගත කපා හැරීමේන් පසුව අය කර ගත හොත්, ප්‍රතිසාදන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කෙරේ.

වසරකට වැඩි කාලයක් සඳහා ගෙවීමට ඇති වෙළෙඳ ලැබිය යුතු මුදල් දුර්වලතා සඳහා සපයනු ලැබේ.

2.2.5.2.1 මූලික හඳුනා ගැනීම හා ගණනය කිරීම

සියලුම මූල්‍ය බැරකම් වෙළෙඳපොල වටිනාකම මත හඳුනා ගැනේ. මෙයට සෘජුවම ආරෝපණය කළ හැකි ගණුදෙනු පිරිවැය ඇතුළත් වේ. ආයතනයේ මූල්‍ය බැරකම්වලට වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දේවල්ද ඇතුළත් වේ.

2.2.5.2.2 පසුව කරන ගණනය කිරීම.

මූල්‍ය බැරකම් ගණනය කිරීම ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

(අ) අනෙකුත් මූල්‍ය බැරකම්

ආයතනයේ අනෙකුත් මූල්‍ය බැරකමවලට වෙළෙඳ හා අනෙක් ගෙවීම් ඇතුළත් වේ.

2.2.5.2.3 නැවත හඳුනා ගැනීම

මූල්‍ය වත්කමක් ඉවත් කිරීම සඳහා යළි හඳුනා ගනු ලබන්නේ බැරකම යටතේ වන බැඳීම නිදහස් හෝ අවලංගු හෝ කල් ඉකුත් වූ විට ය. පවත්නා මූල්‍ය බැරකමක්, වෙනස් කොන්දේසි මත එකම සැපයුම්කරු වෙතින් ලබාගත් මූල්‍ය බැරකමක් මඟින්. හිලව් කරනු ලබන කල්හි හෝ පවත්නා බැරකමක් කොන්දේසි අවශ්‍ය පරිදි නවීකරණය කරන ලද කල්හි එවන් හුවමාරුවක් හෝ නවීකරණයක් නියම බැරකමෙහි යළි හඳුනා ගැනීමක් හා නවන බැරකමක හඳුනාගැනීමක් ලෙස සැලකෙන අතර ඉදිරියට ගෙන එනු ලබන අදාළ වටිනාකමෙහි වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

2.2.5.3 මූල්‍ය උපකරණයන්හි හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන්නේ මූල්‍ය ශේෂ පත්‍ර දිනට වාර්තා වන ශුද්ධ අගය මත වන අතර අවශ්‍ය වන්නේ නම් හෝ නීත්‍යානුකූල ලෙස අවශ්‍ය වන්නේ නම් ශුද්ධ පදනම මත හඳුනා ගත් වත්කම් හා වගකීම් ඒවායේ උපලබ්දි අගය මත හිලව් කෙරේ.

2.2.6 භාණ්ඩ ලේඛනය

භාණ්ඩ ලේඛනය ලිපි ද්‍රව්‍ය හා නිල මුද්‍රා යන්ත්‍රවලින් සමන්විත වන අතර ඒවායේ වටිනාකම ගණනය කරනුයේ පිරිවැය මත ය.

2.2.7 වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

මුල් අවස්ථාවේ දී වෙළෙඳ ලැබීම් වෙළෙඳපොල වටිනාකම මත හඳුනා ගැනෙන අතර පසුව එය ගණනය කරනු ලබන්නේ හානිකරණයන් හා වෙන් කිරීමෙන් පසු ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය මතය. හානිකරණයක් සඳහා වෙන් කිරීමෙන් පසු ශුද්ධ අගය තක්සේරු කිරීම මත අනෙකුත් ලැබීම් සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

2.2.7.1 බොල් හා අඩමාන ණය වෙන් කිරීම

එක් වසරකට අදාළ ණයගැතියන් හැර අනෙකුත් අය අඩමාන ණය ලෙස සැලකෙන අතර මේ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

2.2.8 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන අනෙකුත් දෑ ලෙස අත ඉතිරි මුදල් හා ඉල්ලුම් තැන්පතු ලෙස අර්ථ දැක්වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධයෙන් ගත්කල මුදල් හා මුදල් සමාන දෑ, අත ඉතිරි මුදල්, බැංකු තැන්පතු හා ශුද්ධ හිඟ බැංකු අයිරාවන්ගෙන් සමන්විත වේ.

2.3 බැරකම් හා ප්‍රතිපාදන

2.3.1 බැරකම්

මූල්‍ය ශේෂ පත්‍රයේ ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කරන ලද බැරකම් වන්නේ මූල්‍ය ශේෂ පත්‍ර දින සිට වසරක් තුළ කල් පිරෙන බැරකම් ය. ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරණය කෙරෙන අයිතම වන්නේ මූල්‍ය තත්ත්ව දිනයේ සිට වසරකට පසු යම් අවස්ථාවක කල් ඉකුත් වීමට නියමිත අයිතමයන් ය.

2.3.2 ප්‍රතිපාදන, ආපාතික වත්කම් හා ආපාතික බැරකම්

බැරකම් පියවීම සඳහා ආර්ථික වාසි ඇතුළත් සම්පත් විගලනයක් සඳහා ඉඩ ඇති හා බැරකමේ ප්‍රමාණයෙන් විශ්වාසනීය ඇස්තමේන්තුවක් පිළියෙළ කළ හැකි විට දී අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට වර්තමාන බැරකම් පවත්නා අවස්ථාවල දී (නෛතික හා ප්‍රගතිකාරක) ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. බැරකමට විශේෂිත වන්නා වූ අවදානම් හා මුදලේ කාලීන අගය පිළිබඳ වර්තමාන වෙළඳපොල තක්සේරු පිළිබිඹු කරන්නා වූ පෙර බදු අනුපාතිකයක අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම මඟින් ප්‍රතිපාදන තීරණය කෙරේ.

2.3.3 වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියෙහි දී ලබා ගන්නා ලද සේවාවන් සඳහා ගෙවීමට ඇති බැඳීම් වෙළෙඳ ගෙවීම් වේ. මේවා වසරක් ඇතුළත හෝ ඊට අඩු කාලයක් තුළ ගෙවීමට නියමිත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර එසේ නොවන්නේ නම් ඒවා ජංගම නොවන බැරකම් ලෙස සැලකේ.

මුල් අවස්ථාවේ දී වෙළෙඳ ගෙවීම් වෙළඳපොල වටිනාකම මත හඳුනා ගැනෙන අතර පසුව එය ඵලදායී පොලී ක්‍රම ය භාවිතා කරමින් ක්ෂමක්ෂ පිරිවැය මත ගණනය කෙරේ. වට්ටමේ බලපෑම භෞතික නොවන හෙයින් සඳහන් කරන ලද පොලී අනුපාතිකයක් නොමැති කෙටිකාලීන ගෙවීම් මුල් ඉන්වොයිසියේ වටිනාකම මත ගණනය කෙරේ.

2.3.4 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

(අ) නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම්

සේවකයකු විශ්‍රාම ගැනීමේ දී ලැබෙන විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රමාණය පාරිතෝෂික ප්‍රතිලාභ සැලසුම් මඟින් නිර්වචනය කෙරේ. බොහෝ විට මෙය වයස, සේවය කල වසර ගණන හා වන්දි වැනි සාධක එකක් හෝ කීපයක් මත පදනම් වේ. 1983 අංක 13 දරන පනත යටතේ මෙම නිර්වචනය කරන ලද ලබාදෙන පාරිතෝෂික ප්‍රතිලාභ මෙම සැලසුමෙහි දැක්වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි

සේවක ප්‍රතිලාභ පිළිබඳ පිටු 19 හි සඳහන් සූත්‍ර ක්‍රමයට අනුකූල වන සේ විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

වෙන් කරන ලද අරමුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කෙරේ.

(ආ) නිර්වචනය කරන ලද දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි අනුව සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයන් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායකත්වයන් සඳහා හිමිකම් ඇත. ආයතනය සේවකයන්ගේ දළ වේතනවලින් පිළිවෙළින් 12% හා 3% ක දායකත්වයක් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ලබාදෙයි.

2.3.5 ජංගම හා විලම්භිත බදු

(අ) ප්‍රවර්තන බදු

දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ගෙවීමට හෝ ඔහුගෙන් අයකර ගනු ලැබීමට අපේක්ෂිත ප්‍රමාණය මත වර්තමාන හා පූර්ව කාල පරිච්ඡේදයන් සඳහා වර්තමාන ආදායම් බදු වත්කම් හා බැරකම් ගණනය කෙරේ.

ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම් මූලයන් මත පදනම්ව හා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව ගණනය කෙරේ.

(ආ) විලම්භිත බදු

වත්කම් හා බැරකම්හි බදු පදනම් අතර මූල්‍ය තත්ත්වයනට අදාළ දිනයෙහි තාවකාලික වෙනස්වීම් මත බැරකම් ක්‍රමවේදය හා මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා ඉදිරියට ගෙන එනු ලබන ප්‍රමාණයන් භාවිතා කරමින් විලම්භිත බදු ප්‍රතිපාදනය කෙරේ.

සියළු තාවකාලික වෙනස්වීම් සම්බන්ධයෙන් විලම්භිත බදු වත්කම් හා බැරකම් හඳුනා ගැනිණි. අඩු කළ හැකි සියලු තාවකාලික වත්කම් මත විලම්භිත බදු හඳුනා ගන්නා අතර භාවිතා නොකළ බදු බර හා භාවිතා නොකළ බදු අලාභ තාවකාලික වෙනස්කම් මත අඩු කළ හැකි ඉදිරියට ගෙන යන ලද බදු බර හා බදු අලාභ භාවිතා කරමින් විලම්භිත බදුකරණය සඳහා යොදා ගැනේ- ඉදිරියට ගෙන එනු ලබන විලම්භිත බදු වත්කම් සෑම ශේෂ පත්‍ර දිනක ම සමාලෝචනය කෙරේ. විලම්භිත බදු වත්කම්වලින් වර්තමාන බදු අයවන ලාභය අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ. හඳුනා ගනු ලබන බදු ආදායම් නැවත තක්සේරු කරන අතර ශේෂ පත්‍ර දිනට පැවති හඳුනාගනු ලබන ප්‍රමාණයන් අනාගත බදු වන ආදායම් මත විලම්භිත වත්කම් හිලව් කළ හැක.

ශේෂ පත්‍ර දිනට බලාත්මක වී ඇත්තා වූ හෝ ප්‍රමාණවත් ලෙස බලාත්මක වී ඇත්තා වූ බදු අනුපාත හා බදු නීති මත පදනම්ව වත්කම උපලබ්දි වන හෝ වගකීම පියවන වසරට අදාළ කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතික මත විලම්භිත බදු වත්කම් හා වගකීම් ගණනය කෙරේ.

ව්‍යාපාරයේ සෘජුවම ආදායම් බදුවලට අදාළ වන අයිතම තනි ඒකකයක් මත සිදු කෙරේ. ජංගම බදු වත්කම් වලට ජංගම බදු වගකීම් හිලව් කිරීමට නෛතික බලාත්මක හිමිකමක් තිබෙන්නේ නම් සහ එම බදු අය කළ හැකි ඒකක හා බදු අධිකාරිය විලම්භිත බදුවලට අදාළ වන්නේ නම් විලම්භිත බදු වත්කම් හා විලම්භිත බදු වගකීම් හිලව් කරනු ලැබේ.

2.3.6 අරමුදල්

රජයේ ප්‍රදානයන්හි නිර්ණායකයන් ඉටු නොකරන්නා වූ ප්‍රදානයන් ඒකක යටතේ වන අරමුදල් සේ හඳුනාගෙන තිබේ.

2.3.7 ප්‍රදානයන් හා සහනාධාර

සහනාධාර හා ප්‍රදානයන් සාපේක්ෂ පිරිවැය සමඟ ගැලපීමට අවශ්‍ය වන කාලය මත ආදායම් ප්‍රකාශයට බැර කෙරෙන අතර ඒවා ක්‍රමානුකූල පදනමක් මත හානි පූර්ණය කිරීමට අපේක්ෂා කෙරේ.

වෙළෙඳපොළ වටිනාකම මත වන මූල්‍ය නොවන ප්‍රදානයන් ඇතුළුව වත්කම්වලට අදාළ ප්‍රදානයන් ශේෂ පත්‍රයෙහි දී විලම්භනය කෙරෙන අතර අදාළ වත්කමේ ඵලදායී ජීව කාලය අනුව ආදායම් ප්‍රකාශයට බැර කෙරේ. ආදායමට අදාළ ප්‍රදානයන් ඒවා ලබා ගත හැකි කාලය තුළ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

2.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2-4-1-1 ආදායම් හඳුනා ගැනීම

(අ) පුහුණු උපදේශන සේවා හා ඵලදායිතාව මඟින් ලැබෙන ආදායම

ආර්ථික ප්‍රතිලාභයන් ආයතනයට ගලා එන මට්ටම අනුව ආදායම හඳුනා ගැනේ. ලැබුණු හෝ ලැබීමට නියමිත ප්‍රතිලාභයෙහි වෙළඳපොල වටිනාකම ආදායම ගණනය කෙරේ.

(ආ) පොලී ආදායම

පොලී ආදායම ඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් හඳුනා ගැනේ.

(ඇ) ලාභාංශ ආදායම

ගෙවීම් හිමිකම් ලැබීමේ ක්‍රමයක් ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගැනේ.

(ඈ) වෙනත්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

(ඉ) ලාභ හා අලාභ

ආයෝජන ඇතුළුව, දේපල, පිරියත, උපකරණ හා අනෙක් ජංගම නොවන වත්කම් අපහරණය මත ආදායම්

ස්වභාවයේ කිසිදු ලාභයක් හෝ අලාභයක් අපහරණ ක්‍රියාවලියෙන් අඩු කර ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර නැත. වත්කම් හා ආශ්‍රිත දේපලවල ඉදිරියට ගෙනා වටිනාකම්, එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි ඉතිරිව පවත්නා පිරියත හා උපකරණ ප්‍රමාණය සමුච්චිත ලාභ හා අලාභ වෙත සෘජුවම මාරු කෙරේ.

2.4.2 වියදම් හඳුනාගැනීම

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනා ගනු ලබන්නේ හටගත් පිරිවැය හා ආදායමේ විශේෂිත අයිතමයක ඉපැයුම් යන දෙකෙහි සෘජු සබඳතාව මතය ව්‍යාපාරය පවත්වාගෙන යාම හා කාර්යක්ෂම ආකාරයකින් දේපල, පිරියන හා උපකරණ නඩත්තු කිරීම මත හට ගන්නා සියලු වියදම් වසරේ ලාභයට ගැනෙනා ආදායමට ගළපා ඇත.

2.5 පොදු

2.5.1 වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසාන වීමෙන් පසු සිදුවීම්.

2.5.1.1 මූල්‍ය ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

මූල්‍ය ශේෂ පත්‍ර දිනට පසු සිදු වූ සියලුම සිදුවීම් සලකා බලන ලද අතර මූල්‍ය වාර්තාවල අදාළ සටහන්හි අවශ්‍ය වෙනස්කම් හා අනාවරණයන් සිදු කරන ලදී.

2.5.1.2 අවිනිශ්චිතතාවන් හා හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම්.

අවිනිශ්චිතතාවන් යනු අතීත සිදුවීම් තුළින් පැන නැගෙන්නා වූ අසම්භාව්‍ය වත්කම් හෝ වගකීම් වේ. එසේම ඒවා තහවුරු කරනු ලබන්නේ ආයතනයේ පාලනයෙන් බැහැර වන්නා වූ අවිනිශ්චිත අනාගත සිදුවීම් හටගැනීම හෝ හට නොගැනීම මත පමණි.

2.5.2 අදාළ පාර්ශ්ව ගණුදෙනු

මෙහිදී මිලක් අය කරන්නේ ද යන්න නොතකා ආයතනයට අනෙකුත් පාර්ශවවල මූල්‍ය හා මෙහෙයුම් තීරණ/ප්‍රතිපත්ති පාලනය කිරීමට හෝ ඒ මත වැදගත් බලපෑමක් කිරීමට හැකියාවක් ඇති ගණුදෙනු සම්බන්ධයෙන් අනාවරණයන් කෙරේ.

2.5.3 අවධි ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන්

ආයතනය අනාගතය සම්බන්ධ උපකල්පනයන් සිදු කරයි. ඒ අනුව කෙරෙන ගිණුම්කරණ ඇස්තමේන්තු නිර්වචනාත්මකව බොහෝ විට අදාළ සත්‍ය ප්‍රතිඵල හා සමාන වේ. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් හා වගකීම් හි ඉදිරියට ගෙනෙනා ශේෂයට භෞතික ගැලපුම් කිරීමේ කැපී පෙනෙන අවදානමක් ඇත්තා වූ ඇස්තමේන්තු හා උපකල්පනයන් පහත සාකච්ඡා කෙරේ.

(අ) දේපල, උපකරණ හා පිරියතනවලට අදාළ වන සඵල ආයුකාලය සහ සුන්බුන් අගය

දේපල, උපකරණ හා පිරියතනවලට අදාළ වන සඵල ආයුකාලය සහ සුන්බුන් අගය පිළිබඳව වන ඇස්තමේන්තු යෝග්‍ය වන්නේ ද සහ ඊට අදාළ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල දැයි ආයතනය විසින් වාර්ෂිකව පරීක්ෂා කෙරේ.

(ආ) වෙළඳ ලැබිය යුතු දේවල අලාභය

හානිකරන තක්සේරුව සඳහා මාසික පදනමින් ආයතනය ණය ගැතියන් සමාලෝචනයට ලක් කරයි. හානිකර පාඩුවක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කළ යුතු දැයි තීරණය කිරීම පිණිස ආයතනය ණයගැතියන් ලැයිස්තුවක ඇස්තමේන්තුගත මූල්‍ය ප්‍රවාහයෙහි මැනිය හැකි අඩුවීමක් පිළිබඳව නිරීක්ෂණය කළ හැකි දත්ත පවතින්නේ දැයි දැන ගැනීමට විනිශ්චයන් සිදු කරයි. මේ සඳහා කළමනාකරණය වත්කම්හි අතීත හානි පිළිබඳ අත්දැකීම් මත පදනම් වූ ඇස්තමේන්තු භාවිතා කරයි. වටිනාකම ඇස්තමේන්තු කිරීමට හා මුදල් ප්‍රවාහ කාල ගණනයට භාවිතා කරන උපකල්පන, හානි ඇස්තමේන්තු සහ සත්‍ය හානි අත්දැකීම් අතර වන වෙනස්කම් අඩු කරනු පිණිස නිතිපතා සමාලෝචනය කෙරේ.

2.6 ඒකාබද්ධ කිරීම

අනුබද්ධ ආයතන යනු එහි ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති ආයතනයට පාලනය කිරීමට බලය ඇති ආයතන (විශේෂ අරමුණු ඇතුළුව) වන අතර, සාමාන්‍යයෙන් ඡන්ද අයිතියෙන් බහුතරයක් ලබා දෙන කොටස් හිමිකාරිත්වයක් ද ඇත. ආයතනය වෙනත් ආයතනයක් පාලනය කරන්නේද යන්න තක්සේරු කිරීමේදී දැනට භාවිතා කළ හැකි හෝ පරිවර්තනය කළ හැකි ඡන්ද අයිතියේ පැවැත්ම සහ බලපෑම සලකා බලනු ලැබේ. ආයතනයට පාලනය පවරන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අනුබද්ධ ආයතන ඒකාබද්ධ කෙරේ. පාලනය නැවැත්වූ දින සිට ඒවා විසංධි කරනු ලැබේ. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී, ආයතන ආයතන අතර ගණුදෙනු මත ශේෂයන් සහ අත්‍යවශ්‍ය නොවන ලාභ ඉවත් කෙරේ. ආයතනය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා අනුබද්ධිත ආයතනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කර ඇත. පාලනය නොවන අවශ්‍යතා යනු ආයතනයේ කොටස් හිමියන්ට සෘජුව හෝ වක්‍රව හිමි නොවන අවශ්‍යතාවලට අනුබද්ධිත ආයතනයක මෙහෙයුම් සහ ශුද්ධ වත්කම්වල ශුද්ධ ප්‍රතිඵලවල කොටසකි. ඒවා විස්තීරණ ආදායමේ ඒකාබද්ධ ප්‍රකාශයේ, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශයේ සහ ශේෂ පත්‍රයේ වෙන වෙනම පෙන්වා ඇත. සමස්ථ විස්තීර්ණ ආදායමට අනුබද්ධිත ආයතනයක ඔවුන්ගේ අවශ්‍යතා මත පදනම්ව පාලනය නොවන අවශ්‍යතා සඳහා ගලපනු ලැබේ. මෙය පාලනය නොවන අවශ්‍යතා නිඟ ශේෂයක් ඇති කිරීමට හේතු වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි

2.7 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මෙම මූල්‍ය ප්‍රකාශනවල නව සහ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථකථන, ආයතනය විසින් ප්‍රථම වරට 2019 ජනවාරි 1 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන SLFRS 16 ක්‍රියාත්මක කර ඇත.

ආයතනය විසින් නිකුත් කර ඇති නමුත් ඵලදායී නොවන වෙනත් කිසිදු ප්‍රමිතියක්, අර්ථකථනයක් හෝ සංශෝධනයක් කලින් සම්මත කරගෙන නොමැත.
ආයතනය විසින් SLFRS 16 නවීකරණය කරන ලද ප්‍රතිගාමී ප්‍රවේශය භාවිතා කරන ලද අතර, ඒ යටතේ කල්බදු වගකීමට සමාන මුදලක් 2019 ජනවාරි 1 වන දිනට භාවිතා කිරීමේ අයිතිය ලෙස ගිණුම්ගත කර ඇත. ඒ අනුව, 2019 සඳහා ඉදිරිපත් කරන ලද සංසන්දනාත්මක තොරතුරු නැවත සඳහන් කර නොමැත. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් පිළිබඳ විස්තර පහතින් හෙළිදරව් කෙරේ. මීට අමතරව, SLFRS 16 හි අනාවරණ අවශ්‍යතා සාමාන්‍යයෙන් සංසන්දනාත්මක තොරතුරු සඳහා අදාළ කර නොමැත.

SLFRS 16 වෙත ඇතුළත් කිරීමේදී, කල්බදු ගණුදෙනු මොනවාද යන්න තක්සේරු කිරීම සඳහා ප්‍රායෝගික අවශ්‍යතාවයක් මත භාවිතා කිරීම ආයතනය තෝරා ගන්නා ලදී. එහිදී SLFRS 16 අදාළ කර ඇත්තේ කලින් කල්බදු ලෙස හඳුනාගෙන ඇති කොන්ත්‍රාත්තු සඳහා පමණි. LKAS 17 යටතේ කල්බදු ලෙස හඳුනා නොගත් කොන්ත්‍රාත් SLFRS 16 යටතේ කල්බදුවක් තිබේද යන්න නැවත තක්සේරු කර නොමැත.

2019 ජනවාරි 01 දින සිට ප්‍රතිපත්ති අදාළ වේ

කොන්ත්‍රාත්තුවක් ආරම්භයේදී සමූහය විසින් කොන්ත්‍රාත්තුවක් හෝ කොන්ත්‍රාත්තුවක් කල්බදු ගිවිසුමක් ලෙස තක්සේරු කරයි. හඳුනාගත් වත්කමක් සලකා බැලීම සඳහා නුවමාරු කර ගැනීම සඳහා යම් කාල පරිච්ඡේදයක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුව මඟින් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්තුව හෝ එහි අඩංගු වේ. හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුවක් මඟින් ප්‍රකාශ කරන්නේද යන්න තක්සේරු කිරීම සඳහා, SLFRS 16 හි කල්බදු අර්ථ දැක්වීම භාවිතා කරයි.

බදුකරු ලෙස, ආයතනය 2019 ජනවාරි 1 වන දිනට ගොඩනැගිලි සහ මෝටර් රථ බදු දී ඇත. ආයතනය SLFRS 16 යටතේ, කල්බදු සඳහා භාවිතා කිරීමේ අයිතිය වත්කම් සහ කල්බදු වගකීම් පිළිගනී, එනම් මෙම කල්බදු ශේෂ පත්‍රය මත දැක්වේ.

එම සංරචකය ලීසිං කිරීම කොන්ත්‍රාත්තුවට ඇතුල් වනවිට හෝ වෙනස් කිරීමේදී, ආයතනය විසින් එක් එක් කල්බදු සංරචක සඳහා කොන්ත්‍රාත්තුවේ සලකා බැලීම ඔවුන්ගේ සාපේක්ෂ ස්ථාවර මිල මත පදනම්ව සිදු කෙරේ.

මෙම බදු සඳහා, ප්‍රවේශවන ආකාරය මත, 2019 ජනවාරි 1 වන දිනට ආයතනයේ වර්ධක ණය ගැනීම් අනුපාතයට අනුව ඉතිරි කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව, වට්ටම් කර ඇති බදු වගකීම් මනිනු ලැබීය- ඉන් පසු ආරම්භක දිනයේ සිට කල්බදු කාලය අවසන් වන තෙක් වත්කම් භාවිතයේ අයිතිය සරල රේඛීය ක්‍රමය භාවිතයෙන් ක්ෂය කරනු ලැබේ. මීට අමතරව, වත්කම් භාවිතයේ අයිතිය යම් යම් දුර්වලතා පාඩු ඇත්නම්, සහ කල්බදු වගකීම් වල යම් යම් ප්‍රතිමිණුම් සඳහා ගැලපීම් හරහා කාලානුරූපව අඩු කිරීම සිදු කරයි. කල්බදු වගකීම මුලින් මනිනු ලබන්නේ ආරම්භක දිනයේ දී නොගෙවන ලද කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව, කල්බදු තුළ ව්‍යංගිත පොලී අනුපාතිකය භාවිතා කර වට්ටම් කර හෝ, එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, ආයතනයේ වර්ධක ණය ගැනීමේ අනුපාතයෙනි. සාමාන්‍යයෙන්, ආයතනය එහි වර්ධක ණය ගැනීමේ අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි.

කල්බදු වගකීම් මැනීම සඳහා ඇතුළත් කර ඇති බදු ගෙවීම් පහත සඳහන් දෑ වලින් සමන්විත වේ.

- ද්‍රව්‍යමය ස්ථාවර ගෙවීම් ඇතුළු, ස්ථාවර ගෙවීම්.
- දර්ශකයක් හෝ අනුපාතයක් මත රඳා පවතින විචල්‍ය කල්බදු ගෙවීම්, ආරම්භක දිනයේ දී දර්ශකය හෝ අනුපාතය භාවිතයෙන් මුලින් මනිනු ලැබේ.

3. දේපළ, පිරියත, උපකරණ

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

NIBM	ඉඩම්	ගොඩනැගිලි	ගොඩනැගිලි නවීකරණය	ගොඩනැගිලි උපාංග	ලී බඩු සහ උපකරණ	මෝටර්රථ	පුස්තකාල පොත්	පරිගණක උපකරණ	කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ	එකතුව
පිරිවැය										
2021 ජනවාරි 01 දිනට	**86,068,000**	**770,649,153**	**224,489,672**	**5,690,457**	**176,622,425**	**43,090,000**	**12,310,654**	**169,189,607**	**9,137,580**	**1,497,247,548**
එකතුකිරීම්	-	-	-	6,068,368	23,627,241	-	328,305	40,398,931	125,849,359	196,272,204
මාරු කිරීම්	-	-	-	-	(101,685,043)	-	-	(110,701,907)	-	(212,386,950)
ඉවත් කිරීම්	-	-	-	-	(411,026)	-	-	(902,075)	-	(1,313,101)
2021 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**770,649,153**	**224,489,672**	**11,758,825**	**98,153,597**	**43,090,000**	**12,638,959**	**97,984,556**	**134,986,939**	**1,479,819,701**
ක්ෂය වීම										
2021 ජනවාරි 01 දිනට	-	**203,714,815**	**145,368,097**	**1,659,888**	**134,227,580**	**40,699,390**	**10,045,446**	**130,330,929**	-	**666,046,145**
වර්ෂය සඳහා ගාස්තු	-	15,669,040	20,822,846	1,856,234	16,745,429	2,390,610	776,796	19,558,424	-	77,819,379
නැවත අගය කිරීම	-	-	148,908	(148,908)	(134,227,579)	-	-	(130,330,928)	-	(264,558,507)
ඉවත් කිරීම්	-	-	-	-	(4,279)	-	-	(11,739)	-	(16,018)
2021 දෙසැම්බර් 31 දිනට	**-**	**219,383,855**	**166,339,851**	**3,367,214**	**16,741,151**	**43,090,000**	**10,822,242**	**19,546,686**	**-**	**479,290,999**
ශුද්ධ පොත් වටිනාකම										
2021 ජනවාරි 01 දිනට	**86,068,000**	**566,934,338**	**79,121,575**	**4,030,569**	**42,394,845**	**2,390,610**	**2,265,208**	**38,858,678**	**9,137,580**	**831,201,403**
2021 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**551,265,298**	**58,149,821**	**8,391,611**	**81,412,446**	**-**	**1,816,717**	**78,437,870**	**134,986,939**	**1,000,528,702**
පිරිවැය										
2022 ජනවාරි 01 දිනට	**86,068,000**	**770,649,153**	**224,489,672**	**11,758,825**	**98,153,597**	**43,090,000**	**12,638,959**	**97,984,556**	**134,986,939**	**1,479,819,701**
එකතුකිරීම්	-	-	-	-	15,411,895	-	131,519	49,753,083	163,548,305	228,844,802
මාරු කිරීම්	-	-	202,241,736.00	-	96,293,508	-	-	-	(298,535,244)	-
ඉවත් කිරීම්	-	-	-	-	(44,050)	-	-	(46,750)	-	(90,800)
2022 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**770,649,153**	**426,731,408**	**11,758,825**	**209,814,950**	**43,090,000**	**12,770,478**	**147,690,889**	**-**	**1,708,573,703**
ක්ෂය වීම										
2022 ජනවාරි 01 දිනට	**-**	**219,383,855**	**166,339,851**	**3,367,214**	**16,741,151**	**43,090,000**	**10,822,242**	**19,546,686**	**-**	**479,290,999**
වර්ෂය සඳහා ගාස්තු	-	15,247,934	50,675,570	1749591	31,388,976	-	794,118	33,108,369		132,964,558
මාරු කිරීම්	-	-	-	-	-	-	-	-	-	-
ඉවත් කිරීම්	-	-	-	-	(4,405)	-	-	(5,844)		(10,249)
2022 දෙසැම්බර් 31 දිනට	**-**	**234,631s,789**	**217,015,421**	**5,116,805**	**48,125,722**	**43,090,000**	**11,616,360**	**52,649,211**	**-**	**612,245,308**
ශුද්ධ පොත් වටිනාකම										
2022 ජනවාරි 01 දිනට	**86,068,000**	**551,265,298**	**58,149,821**	**8,391,611**	**81,412,446**	**-**	**1,816,717**	**78,437,870**	**134,986,939**	**1,000,528,702**
2022 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**536,017,364**	**209,715,987**	**6,642,020**	**161,689,228**	**-**	**1,154,118**	**95,041,678**	**-**	**1,096,328,395**

3. දේපල, පිරියත සහ උපකරණ ඉදිරියට...

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

NSBM	ඉඩම් (බදු දී ඇති)	ගොඩනැගිලි	ලී බඩු සහ උපකරණ සහ වෙනත් කාර්යාල උපකරණ	කාර්මික ස්ථාන සහ යන්ත්‍රෝපකරණ	විද්‍යාගාර උපකරණ	මෝටර්රථ	පුස්තකාල පොත්	පරිගණක උපකරණ	කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ	එකතුව
2021 ජනවාරි 01 දිනට	-	9,684,249,569	1,028,478,210	197,669,887	28,297,128	113,346,177	28,314,360	143,125,157	113,599,798	11,337,080,286
මාරු කරන ලද	-	-	-	-	-	70,000,000	-	-	-	70,000,000
එකතුකිරීම්	-	22,934,765	33,620,421	-	49,064,165	-	838,229	11,456,474	279,613,612	397,527,666
ඉවත්කිරීම්	-	-	(244,350)	-	-	-	-	(2,525,734)	-	(2,770,084)
2021 දෙසැම්බර් 31 දිනට	**-**	**9,707,184,334**	**1,061,854,281**	**197,669,887**	**77,361,293**	**183,346,177**	**29,152,589**	**152,055,897**	**393,213,410**	**11,801,837,868**
ක්ෂය වීම										
2021 ජනවාරි 01 දිනට	-	787,677,093	747,265,003	80,746,795	11,006,230	87,621,956	22,872,691	94,501,079	-	1,831,690,847
මාරු කරන ලද	-	-	-	-	-	70,000,000	-	-	-	70,000,000
වර්ෂය සඳහා ගාස්තු	-	194,008,576	185,721,749	19,766,989	13,027,544	11,562,124	2,752,721	21,612,910	-	448,452,613
ඉවත් කිරීම්	-	-	(244,350)	-	-	-	-	(2,525,734)	-	(2,770,084)
2021 දෙසැම්බර් 31 දිනට	**-**	**981,685,669**	**932,742,402**	**100,513,784**	**24,033,774**	**169,184,080**	**25,625,412**	**113,588,255**	-	**2,347,373,376**
ශුද්ධ පොත් වටිනාකම										
2021 ජනවාරි 01 දිනට	**-**	**8,896,572,476**	**281,213,207**	**116,923,092**	**17,290,898**	**25,724,221**	**5,441,669**	**48,624,078**	**113,599,798**	**9,505,389,439**
2021 දෙසැම්බර් 31 දිනට	**-**	**8,725,498,665**	**129,111,879**	**97,156,103**	**53,327,519**	**14,162,097**	**3,527,177**	**38,467,642**	**393,213,410**	**9,454,464,492**
පිරිවැය										
2022 ජනවාරි 01 දිනට	-	9,707,184,334	1,061,854,281	197,669,887	77,361,293	183,346,177	29,152,589	152,055,897	393,213,410	11,801,837,868
නැවත අගය කිරීම - Cost	-	685,715,667	(432,842,482)	(36,498,488)	9,607,708	(47,599,476)	-	(80,348,896)	-	98,034,033
මාරු කිරීම්ද - Cost	-	-	-	-	-	31,025,000	-	-	-	31,025,000
එකතුකිරීම්	-	5,274,082	45,263,969	-	12,275,559	5,500,000	1,158,106	28,626,181	457,704,757	555,802,654
ඉවත් කිරීම්	-	-	(401,500)	-	-	-	-	-	-	(401,500)
2022 දෙසැම්බර් 31 දිනට	**-**	**10,398,174,083**	**673,874,268**	**161,171,399**	**99,244,560**	**172,271,701**	**30,310,695**	**100,333,182**	**850,918,167**	**12,486,298,055**
ක්ෂය වීම										
2022 ජනවාරි 01 දිනට	-	981,685,669	932,742,402	100,513,784	24,033,774	169,184,080	25,625,412	113,588,255	-	2,347,373,376
නැවත අගය කිරීම	-	(981,685,669)	(932,742,402)	(100,513,784)	(24,033,774)	(195,132,094)	-	(113,588,255)	-	(2,347,695,978)
මාරු කරන ලද	-	-	-	-	-	25,948,014	-	-	-	25,948,014
වර්ෂය සඳහා ගාස්තු	-	243,081,923	143,271,638	23,024,486	19,422,642	45,772,383	1,570,379	29,187,626	-	505,331,077
ඉවත් කිරීම්	-	-	(41,580)	-	-	-	-	-	-	(41,580)
2022 දෙසැම්බර් 31 දිනට	**-**	**243,081,923**	**143,230,058**	**23,024,486**	**19,422,642**	**45,772,383**	**27,195,791**	**29,187,626**	**-**	**530,914,909**
ශුද්ධ පොත් වටිනාකම										
2022 ජනවාරි 01 දිනට	**-**	**8,725,498,665**	**129,111,879**	**97,156,103**	**53,327,519**	**14,162,097**	**3,527,177**	**38,467,642**	**393,213,410**	**9,454,464,492**
2022 දෙසැම්බර් 31 දිනට	**-**	**10,155,092,160**	**530,644,210**	**138,146,913**	**79,821,918**	**126,499,318**	**3,114,904**	**71,145,556**	**850,918,167**	**11,955,383,146**

3. දේපල, පිරියත සහ උපකරණ ඉදිරියට...

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

NIBM	ඉඩම්	ගොඩනැගිල්ල	ගොඩනැගිලි නවීකරණය	ගොඩනැගිලි උපාංග	ලී බඩු සහ උපකරණ සහ වෙනත් කාර්යාල උපකරණ	මෝටර්රථ	පුස්තකාල පොත්	පරිගණක උපකරණ	කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ	එකතුව
පිරිවැය										
2021 ජනවාරි 01 දිනට	86,068,000	770,649,153	224,489,672	5,690,457	176,622,425	43,090,000	12,310,654	169,189,607	9,137,580	1,497,247,548
එකතුකිරීම් / මාරු කරන ලද	-	-	-	6,068,368	23,627,241	-	328,305	40,398,931	125,849,359	196,272,204
නැවත අගය කිරීම	-	-	-	-	(101,685,043)	-	-	(110,701,907)	-	(212,386,950)
ඉවත් කිරීම්	-	-	-	-	(411,026)	-	-	(902,075)	-	(1,313,101)
2021 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**770,649,153**	**224,489,672**	**11,758,825**	**98,153,597**	**43,090,000**	**12,638,959**	**97,984,556**	**134,986,939**	**1,479,819,701**
ක්ෂය වීම										
2021 ජනවාරි 01 දිනට	**-**	**203,714,815**	**145,368,097**	**1,659,888**	**134,227,580**	**40,699,390**	**10,045,446**	**130,330,929**	**-**	**666,046,145**
වර්ෂය සඳහා ගාස්තු	-	15,669,040	20,822,846	1,856,234	16,745,429	2,390,610	776,796	19,558,424	-	77,819,379
නැවත අගය කිරීම	-	-	148,908	(148,908)	(134,227,579)	-	-	(130,330,928)	-	(264,558,507)
ඉවත් කිරීම්	-	-	-		(4,279)	-	-	(11,739)	-	(16,018)
2021 දෙසැම්බර් 31 දිනට	**-**	**219,383,855**	**166,339,851**	**3,367,214**	**16,741,151**	**43,090,000**	**10,822,242**	**19,546,686**	**-**	**479,290,999**
ශුද්ධ පොත් වටිනාකම										
2021 ජනවාරි 01 දිනට	**86,068,000**	**566,934,338**	**79,121,575**	**4,030,569**	**42,394,845**	**2,390,610**	**2,265,208**	**38,858,678**	**9,137,580**	**831,201,403**
2021 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**551,265,298**	**58,149,821**	**8,391,611**	**81,412,446**	**-**	**1,816,717**	**78,437,870**	**134,986,939**	**1,000,528,702**
පිරිවැය										
2022 ජනවාරි 01 දිනට	86,068,000	770,649,153	224,489,672	11,758,825	98,153,597	43,090,000	12,638,959	97,984,556	134,986,939	1,479,819,701
එකතුකිරීම්	-	-	-	-	15,411,895	-	131,519	49,753,083	163,548,305	228,844,802
මාරු කිරීම්	-	-	202,241,736.00	-	96,293,508	-	-	-	(298,535,244)	-
ඉවත් කිරීම්	-	-	-	-	(44,050)	-	-	(46,750)	-	(90,800)
2022 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**770,649,153**	**426,731,408**	**11,758,825**	**209,814,950**	**43,090,000**	**12,770,478**	**147,690,889**	**-**	**1,708,573,703**
ක්ෂය වීම										
2022 ජනවාරි 01 දිනට	-	219,383,855	166,339,851	3,367,214	16,741,151	43,090,000	10,822,242	19,546,686	-	479,290,999
වර්ෂය සඳහා ගාස්තු	-	15,247,934	50,675,570	1749591	31,388,976	-	794,118	33,108,369	-	132,964,558
මාරු කිරීම්	-	-	-	-	-	-	-	-	-	-
ඉවත් කිරීම්	-	-	-	-	(4,405)	-	-	(5,844)	-	(10,249)
2022 දෙසැම්බර් 31 දිනට	**-**	**234,631,789**	**217,015,421**	**5,116,805**	**48,125,722**	**43,090,000**	**11,616,360**	**52,649,211**	**-**	**612,245,308**
ශුද්ධ පොත් වටිනාකම										
2022 ජනවාරි 01 දිනට	**86,068,000**	**551,265,298**	**58,149,821**	**8,391,611**	**81,412,446**	**-**	**1,816,717**	**78,437,870**	**134,986,939**	**1,000,528,702**
2022 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**536,017,364**	**209,715,987**	**6,642,020**	**161,689,228**	**-**	**1,154,118**	**95,041,678**	**-**	**1,096,328,395**

3. දේපල, පිරියත සහ උපකරණ ඉදිරියට...

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

Group (Restated)	ඉඩම්	ගොඩනැගිල්ල	ගොඩනැගිලි නවීකරණය	ගොඩනැගිලි උපාංග	ලී බඩු සහ උපකරණ සහ වෙනත් කාර්යාල උපකරණ	කාර්මික ස්ථාන සහ යන්ත්‍රෝපකරණ	විද්‍යාගාර උපකරණ	මෝටර්රථ	පුස්තකාල පොත්	පරිගණක උපකරණ	කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ	එකතුව
පිරිවැය												
2021 ජනවාරි 01 දිනට	86,068,000	10,454,898,722	224,489,672	5,690,457	1,205,100,635	197,669,887	28,297,128	180,662,477	40,625,014	312,314,764	122,737,378	12,858,554,134
එකතුකිරීම්/මාරු කරන ලද	-	22,934,765	33,620,421	6,068,368	23,627,241	-	49,064,165	70,000,000	1,166,534	51,855,405	405,462,971	663,799,870
නැවත අගය කිරීම	-	-	-	-	(101,685,043)	-	-	-	-	(110,701,907)	-	(212,386,950)
ඉවත් කිරීම්	-	-	-	-	(655,376)	-	-	-	-	(3,427,809)	-	(4,083,185)
2021 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**10,477,833,487**	**258,110,093**	**11,758,825**	**1,126,38,457**	**197,669,887**	**77,361,293**	**250,662,477**	**41,791,548**	**250,040,453**	**528,200,349**	**13,305,883,869**
ක්ෂය වීම												
2021 ජනවාරි 01 දිනට	-	991,391,908	145,368,097	1,659,888	881,492,581	80,746,795	11,006,230	140,417,903	32,918,137	224,832,008	-	2,509,833,547
වර්ෂය සඳහා ගාස්තු	-	209,677,616	20,822,846	1,856,234	214,596,923	19,766,989	13,027,544	13,952,734	3,529,517	41,171,334	-	538,401,737
Transfer	-	-	148,908	(148,908)	-	-	-	70,000,000	-	-	-	70,000,000
නැවත අගය කිරීම	-	-	-	-	(134,227,579)	-	-	-	-	(130,330,928)	-	(264,558,507)
ඉවත් කිරීම්	-	-		-	(248,629)	-	-	-	-	(2,537,473)	-	(2,786,102)
2021 දෙසැම්බර් 31 දිනට	**-**	**1,201,069,524**	**166,339,851**	**3,367,214**	**961,613,296**	**100,513,784**	**24,033,774**	**224,370,637**	**36,447,654**	**133,134,941**	**-**	**2,850,890,675**
ශුද්ධ පොත් වටිනාකම												
2021 ජනවාරි 01 දිනට	**86,068,000**	**9,463,506,814**	**79,121,575**	**4,030,569**	**323,608,054**	**116,923,092**	**17,290,898**	**40,244,574**	**7,706,877**	**87,482,756**	**-**	**10,348,720,587**
2021 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**9,276,763,963**	**91,770,242**	**8,391,611**	**164,774,161**	**97,156,103**	**53,327,519**	**26,291,840**	**5,343,894**	**116,905,512**	**528,200,349**	**10,454,993,194**
පිරිවැය												
2022 ජනවාරි 01 දිනට	86,068,000	10,477,833,487	258,110,093	11,758,825	1,126,387,457	197,669,887	77,361,293	250,662,477	41,791,548	250,040,453	528,200,349	13,305,883,869
එකතුකිරීම්/මාරු කරන ලද	-	5,274,082	202,241,736	-	156,969,372	-	12,275,559	36,525,000	1,289,625	78,379,264	322,717,818	815,672,456
නැවත අගය කිරීම	-	685,715,667	-	-	(432,842,482)	(36,498,488)	9,607,708	(47,599,476)	-	(80,348,896)	-	98,034,033
ඉවත් කිරීම්	-	-	-	-	(445,550)	-	-	-	-	(46,750)	-	(492,300)
2022 දෙසැම්බර් 31 දිනට	**86,068,000**	**11,168,823,236**	**460,351,829**	**11,758,825**	**850,068,797**	**161,171,399**	**99,244,560**	**239,588,001**	**43,081,173**	**248,024,071**	**850,918,167**	**14,219,098,058**
ක්ෂය වීම												
2022 ජනවාරි 01 දිනට	-	1,201,069,524	166,339,851	3,367,214	961,613,296	100,513,784	24,033,774	224,370,637	36,447,654	133,134,941	-	2,850,890,675
වර්ෂය සඳහා ගාස්තු	-	258,329,857	50,675,570	1,749,591	174,660,614	23,024,486	19,422,642	45,772,383	2,364,497	62,295,995	-	638,295,635
Transfers	-	-	-	-	-	-	-	25,948,014	-	-	-	25,948,014
නැවත අගය කිරීම	-	(981,685,669)	-	-	(932,742,402)	(100,513,784)	(24,033,774)	(195,132,094)	-	(113,588,255)	-	(2,347,695,978)
ඉවත් කිරීම්	-	-	-	-	(45,985)	-	-	-	-	(5,844)	-	(51,829)
2022 දෙසැම්බර් 31 දිනට	**-**	**477,713,712**	**217,015,421**	**5,116,805**	**203,485,523**	**23,024,486**	**19,422,642**	**100,958,940**	**38,812,151**	**81,836,837**	**-**	**1,167,386,517**
ශුද්ධ පොත් වටිනාකම												
